## 20. 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය.

1. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 1996 දෙසැම්බර් මස 23 වන දින අනුමත කර ඇත.

2. 2. 1996.12.27 දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදන අංක 955/11 මඟින් දකුණු පළාත් සභාවේ මහාමාර්ග, කර්මාන්ත, සංස්කෘතික සංචාරක, ප්‍රවාහන, ක්‍රීඩා, රැකීරක්ෂා හා පොදු කටයුතු ගරු අමාත්‍යවරයා විසින් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය 1997 ජනවාරි 01 දින වශයෙන් නියම කර ඇත.

### දකුණු පළාත් සභාව
### මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - ප්‍රඥප්තිය

දකුණු පළාත ඇතුළත මූලාරම්භ වන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීම සහ ඉහත සඳහන් කාර්යය සඳහා අධිකාරියක් සංස්ථාපනය කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා සහ දකුණු පළාත් සභාවේ 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය ඉවත් කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාත් සභාව විසින් පහත සඳහන් පරිදි පනවනු ලැබේ. පූර්විකාව

දකුණු පළාත් සභාවේ ප්‍රතිපත්තිය වන්නේ -

(අ) දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ මහජනතාවගේ ගමනාගමන අවශ්‍යතාවයන් සපුරාලීමට ප්‍රමාණවත් හා ගුණාත්මක තත්ත්වයෙන් අදාල සේවාවන් දියුණු තත්ත්වයකට නංවාලීම හා එම සේවාවන් දකුණු පළාත මුළුල්ලෙහි සාධාරණ ලෙස ව්‍යාප්ත කිරීම;

(ආ) එම සේවාවන් සලසන අතර, යහපත් තරඟකාරීත්වයක් පවත්නා බවට වගබලා ගැනීම;

(ඇ) මහජනතාවගේ ආරක්ෂාව හා පහසුව සුරක්ෂිත කිරීම සඳහා 1982 අංක 17 දරන සමාගම් ආඥා පනත යටතේ මගී ගමනාගමනය සඳහා ලියාපදිංචි වී ඇති සමාගම්, පෞද්ගලික බස් ධාවකයින් විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් විධිමත් කිරීම.

**01.** මෙම ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 1996 අංක 02 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර , ගැසට් පත්‍රයේ පළ කරන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතුය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

## 1 වන කොටස

## දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය

**02**. (1) (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන පළාත් අධිකාරියක් පිහිටුවනු ලැබේ.

පළාත් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියක් පිහිටුවීම

(2) පළාත් අධිකාරියේ 2.1 වන වගන්තියෙන් ඊට පැවරෙන නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර , ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. අධිකාරිය විසින් එහි නාමයෙන් නඩු පැවරීමටද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීමද කල හැකිය.

(3) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව පළාත් අධිකාරිය විසින් කලින් කලට අවශ්‍ය වන්නාවූ ශාඛා කාර්යාල සංඛ්‍යාවක් පිහිටුවා පවත්වාගෙන හා හැකිය.

**03**. (1) අධිකාරිය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.-

අධිකාරියේ සාමාජිකයෝ

(අ) නිල බලයෙන් සාමාජිකයන් තිදෙනෙක් වේ. ඒ අය නම්

(i) දකුණු පළාත් සභාවේ මුදල් විෂය බාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පළාත් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම්/ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් නිලයට අඩු නොවන නිලධාරියකු;

(ii) පළාත් මහා මාර්ග විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඉංජිනේරුවරයෙකු;

(iii) පළාතේ නීතිය හා සාමය පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකුගේ නිලයට නොඅඩු පොලිස් නිලධාරියෙක්; සහ

(ආ) මගී ප්‍රවාහනය, වාණිජ්‍යය, මූල්‍යකරණය හා පරිපාලනය යන ක්ෂේත්‍රවල පළපුරුද්දක් හෝ සුදුසුකමක් ඇති, නැතහොත් ප්‍රකට හැකියාවක් ඇති පුද්ගලයන් අතුරින් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන තවත් සාමාජිකයින් හතර දෙනෙක් මෙම උප ඡේදය යටතේ පත්කරනු ලබන සාමාජිකයකු මින්මතු පත්කළ සාමාජිකයෙකු යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) අමාත්‍යවරයා විසින් සාමාජිකයන්ගෙන් එක් අයකු අධිකාරියේ සභාපතිවරයා වශයෙන් නම් කළ යුතුය.

(3) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු , පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැන්නකු ලෙස පත්කරනු ලැබුවහොත් ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට හෝ එවැනි සාමාජිකයෙකු ලෙස තවදුරටත් කටයුතු කිරීමට නුසුදුස්සෙකු වන්නේය.

(4) යම් තැනැත්තෙකු අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත්කිරීමට ප්‍රථම ඒ තැනැත්තා විසින් අධිකාරියේ සාමාජිකයෙකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටුකරනු ලැබීම කෙරෙහි හානිකර අන්දමින් බලපෑ හැකි මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතා ඔහු සතුව නොමැති බවට පළාත් අමාත්‍යවරයා සෑහීමකට පත්විය යුතුය.මෙම උප වගන්තිය යටතේ කාර්යයන් සඳහා අවශ්‍යයයි අමාත්‍යවරයා සලකන සියළුම තොරතුරු සපයන ලෙස ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබූ කවර අවස්ථාවක වුවද ඒ තොරතුරු අධිකාරියේ සාමාජිකයෙකු ලෙස අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ හෝ පත්කිරීමට අමාත්‍යවරයා අදහස් කරන කවර හෝ

(5) අධිකාරියේ කුමන හෝ පත්කළ සාමාජිකයෙකු , පත්කරන අවස්ථාවේ දී අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පත්කිරීමේ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් (8) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව ධූරය දැරිය යුතුය. තවද ඔහු (8) වන උප වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබ ඇති නම් මිස නැවත පත්කිරීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

එසේ වුවද අධිකාරියේ පත්කල සාමාජිකයෙකුගේ පුරප්පාඩුවක් සඳහා අමාත්‍යවරයා විසින් පත්කරන සාමාජිකයෙක් ඔහු කලින් ධූරය හිස්කල හොත් මිස, ඔහු අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධූර කාලයෙහි නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

(6) සභාපතිවරයාගේ ධූර කාලය (8) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව අධිකාරියේ ඔහු සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතුය.

(7) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයන් මගින් කවර හෝ පත්කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කළ හැකිය.

(8) අමාත්‍යවරයා විසින් (8) වන උප වගන්තිය යටතේ නියමයන් කරනු ලැබුයේ අධිකාරියේ යම් සාමාජිකයෙකු සම්බන්ධයෙන්ද එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ දී ඒ සාමාජිකයා ඔහුගේ ධූරය අත්හල යුතුය.

(9) අමාත්‍යවරයා වෙත තත්කාර්ය සඳහා යවන ලිපියක් මගින් අධිකාරියේ කවර හෝ පත්කල සාමාජිකයෙකුට කවර අවස්ථාවක වුවද ඔහු දරන ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(10) අධිකාරිය කවර හෝ සාමාජිකයෙකු රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා (1) වන උප වගන්තියේ විධිවිධාන සැළකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය.

(11) රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ අධිකාරියේ සභාපතිවරයා ඔහුගේ ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත්වන අවස්ථාවක සභාපතිවරයා ලෙස වැඩ බැලීම සඳහා වෙනත් ඕනෑම සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යැකිය.

(12) පළාත් අධිකාරියේ සියලු සාමාජිකයින්ට හෝ යම් සාමාජිකයෙකුට හෝ අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික , දීමනා සහ වෙනත් වියදම් පළාත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(13) පළාත් අධිකාරියේ සියලුම සාමාජිකයින් ධූරයෙන් ඉවත් කළ අවස්ථාවක අධිකාරියේ පූර්ණ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් අමාත්‍යවරයා විසින් නිසි බලධාරියෙකු පත්කරනු ලැබිය හැකිය.

අධිකාරියේ රැස්වීම් පැවැත්වීම

**04**. (1) අධිකාරියේ සභාපතිවරයා පැමිණ සිටින පළාත් අධිකාරියේ සෑම රැස්වීමකම ඔහු මූලාසනය දැරිය යුතුය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් එවිට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් එම රැස්වීම සඳහා සභාපතිවරයකු පත්කර ගත යුතුය.

(2) රැස්වීම අවශ්‍යයයි අධිකාරිය සලකන ඕනෑම අවස්ථාවකදී අධිකාරිය රැස්විය යුතුය.

(3) අධිකාරියේ රැස්වීමක ඡන්ද විමසීමකදි ඡන්ද එක සමාන වූ විට මූලාසනය දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් දිය හැකිය.

(4) අධිකාරියේ ඕනෑම රැස්වීමක සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් ගණපූර්ණ විය යුතුය.

(5) මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව පළාත් අධිකාරියේ රැස්වීම් සම්බන්ධව සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යායුතු ආකාරය සම්බන්ධව කාර්ය විධානයට අදාලව පළාත් අධිකාරිය විසින් රීති සෑදිය හැකිය.

**05**. අධිකාරියේ සාමාජිකයන් අතරේ පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසා හෝ එහි සාමාජිකයන් පත්කිරීමේ හෝ නම් කිරීමේ යම් දෝෂයක් වීමද යම් කරුණක් නිසාම පමණක් අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ කර්තව්‍යයක් නිර්බල නොවන්නේය.

පුරප්පාඩුවක් තිබුණද අධිකාරිය ක්‍රියාත්මක කිරීම

**06**. (1) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

පළාත් අධිකාරියේ මුද්‍රාව

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කර ගත හැකිය.

(3) අධිකාරියේ මුද්‍රාව අධිකාරියේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදි හැර කිසිම ලේඛනයකට හෝ සාධන පත්‍රයකට හෝ නොතැබිය යුතුය.ඒ සාමාජිකයින් දෙදෙනාගෙන් එක් සාමාජිකයෙක් අධිකාරියේ සභාපතිවරයා විය යුතුය.තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ සාමාජිකයින් දෙදෙනාම ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට හෝ අත්සන් කළ යුතුය.

## II වන කොටස
## අධිකාරියේ බලතල

**07**. 1. අධිකාරියට පහත සඳහන් බලතලවලින් ඕනෑම එකක් හෝ සියල්ල ක්‍රියාවේ යෙදවිය හැකිය.-

අධිකාරියේ බලතල

(අ) පළාත ඇතුළත මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්, පිළිගත හැකි ගුණාත්මක තත්වයක බස් සේවයක් පවතින්නේද යන වග පිලිබඳ අවලෝකනය කිරීම සහ කාලසටහන් පිළියෙල කිරීම හා ධාවකයන් එම කාලසටහන් පිළිපදින බවට වග බලා ගැනිමට පියවර ගැනිම;

(ආ) මගී ප්‍රවාහනය සඳහා බස් රථ පාවිච්චි කිරිමට බලය දෙන මගී සේවා අවසරපත් නිකුත් කිරීම හෝ ඒ අවසරපත් අලුත් කිරීම;

(ඇ) මගී සේවා අවසරපත් නිකුත් කිරීමේදි ඒවා යටත් වන කොන්දේසි පිළිපදින බවට වගබලා ගැනිම;

(ඇ) අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියාත්මක කළ යුතු හා ඉටු කල යුතු බලතල, කාර්ය හා කර්තව්‍ය සඳහා අවශ්‍ය විය හැකි වාරවාර්තා හා තොරතුරු සපයන ලෙස මගී සේවා අවසර පත්‍රධාරීන්ට නියම කිරිම;

(ඉ) නියෝග සකස් කිරිම හා ඒවා බලාත්මක කිරීම;

(ඊ) බස් ධාවකයින්ට උපදෙස් හා මාර්ගෝපදේශකත්වය සැපයීම;

(උ) වෙනත් යම් නීතියක නියමයන්ට යටත්ව, මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි සියළු කොන්ත්‍රාත්වලට හෝ ගිවිසුම් වලට කෙලින්ම නැතහොත් ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු සමඟ හවුල් ව්‍යාපාරයක් වශයෙන් ඇතුල්වීම සහ ඒවා ඉටුකිරිම හෝ සපුරාලිම;

(ඌ) අධිකාරියේ සේවකයින් පත්කිරිම, සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(එ) යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනිම හා දැරීම හෝ අයිතිකර ගැනීම හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම;

(ඒ) අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු අය කිරීම;

(ඔ) මුදලින් හෝ අන්‍යාකාරයෙන් වූ ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ සහනාධාර පිළිගැනීම සහ මෙම ප්‍රඥප්තියේ වෙනත් නියමයන්ට යටත්ව අධිකාරියේ කවර හෝ අරමුණක් අරභයා ඒවා යොදා ගැනීම,

(ඕ) මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල , කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරිම හා ඉටු කිරිම සඳහා අවශ්‍යයයි අධිකාරිය අදහස් කරන එවැනි වෙනත් සියලු ක්‍රියාවන්හි යෙදීම.

**08**. (1) අධිකාරිය විසින් එහි බලතල, ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අධිකාරියට කලින් කලට පොදු හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, අධිකාරිය ඒ විධාන ක්‍රියාත්මක කළ යුතුය.

විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය

(2) අධිකාරියේ කටයුතු සම්බන්ධයෙන් තමා විසින් නියම කරනු ලබන ආකෘතියකින් තමා වෙත වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කලට අධිකාරිය වෙත ලිඛිත විධාන කරනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ සෑම විධානයක්ම ඉටු කළ යුතුය.

**09**. අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ ඊට අයත් කිසියම් බලතලයක් , අධිකාරියේ සභාපතිවරයා වෙත හෝ එහි යම් නිලධාරියකු වෙත, ලියවිල්ලක් මගින් පවරා දිය හැකිය.

අධිකාරිය විසින් බලතල පැවරීම

## III වන කොටස

## නිත්‍ය සේවා සහ විශේෂ සේවා මගී ප්‍රවාහන අවසර පත්‍ර

**10**. (1) මෙහි (2) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව කිසිම තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද්දා වූ මගී සේවා අවසර පත්‍රයක් යටතේ හැර ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ප්‍රවාහනය පිණිස ,පළාත ඇතුලතින් ආරම්භවන නිත්‍ය සේවාවක් සඳහා හෝ විශේෂ සේවා සඳහා වූ බස් රථයක් ධාවනය නොකළ යුතුය.

නිත්‍ය සේවා සහ විශේෂ සේවා මගී ප්‍රවාහන අවසර පත්‍ර

(2) 1992 අංක 1 දරන දකුණු පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරන ලද එමෙන්ම මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භවන දිනට පෙර දිනය වන විට වලංගුව පවත්නා වූ මගී ප්‍රවාහනය සඳහා වූ නිත්‍ය මගී ප්‍රවාහන බලපත්‍රයක් හෝ එකී ප්‍රඥප්තිය යටතේ වූ නිත්‍ය මගී ප්‍රවාහන අවසර පත්‍රයක් ලෙස සැලකිය හැකි වෙනත් ලියවිල්ලක් මෙම ප්‍රඥප්තිය යටතේ කලින් අවලංගු කළහොත් මිස එකී බලපත්‍රයේ වලංගු කාලය සඳහා මෙම ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරන ලද මගී ප්‍රවාහන සේවා බලපත්‍රයක් ලෙස සැලකිය යුතු වන්නේය.

(3) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ හෝ ඉන් පසුව කිසිම තැනැත්තකු විසින් ගාස්තුවක් සඳහා මගීන් ප්‍රවාහනය කිරීමේ නිත්‍ය සේවය සඳහා බස් රථයක් නොවන වෙනත් වාහනයක් යොදා නොගත යුතුය.

(4) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ එය යටතේ පනවන ලද රෙගුලාසි උල්ලංඝනය කරමින් යොදා ගනු ලැබ ඇති ඕනෑම වාහනයක් අධිකාරිය විසින් ඒ කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ යම් පොලිස් නිලධරයෙකු විසින් තහනමට ගත හැකි අතර, ඒ වාහනය එසේ තහනමට ගනු ලැබුයේ යම් මහේස්ත්‍රාත් අධිකරණයක බල ප්‍රදේශය ඇතුළත්වීද ඒ මහේස්ත්‍රාත් අධිකරණය වෙත , අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඒ වාහනය ඔවුන් විසින් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(5) යම් වාහනයක් (4) වන උප වගන්තියේ විධිවිධාන යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක , මහේස්ත්‍රාත්වරයා විසින් නඩු විභාගය අවසන් කරන තෙක් ඒ වාහනය රඳවා තබන ආඥාවක් හෝ නඩුවට අදාල අවස්ථාගත කරුණු, අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඒ වාහනය මුදාහරින ආඥාවක් හෝ කළ හැකිය.

(6) (4) වන උප වගන්තිය යටතේ තහනමට ගත් වාහනයක රියදුරු , කොන්දොස්තර, අයිතිකරු හෝ එය භාරව සිටි වෙනත් පුද්ගලයකු වන යම් අයකු එම තහනමට ගැනීමේ කාර්ය සම්බන්ධයෙන් වාහනය තහනමට ගත් පුද්ගලයා විසින් කරනු ලබන නියමයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කළ හොත් ඔහු මෙම ප්‍රඥප්තිය යටතේ වූ වරදකට වරදකරු විය යුතු වන්නේය.

(7) නිත්‍ය මගී ප්‍රවාහන සේවාව සඳහා යොදාගෙන ඇති යම් බස් රථයක් එකී සේවාවෙන් බැහැරව වෙනත් විශේෂ සේවාවක් සඳහා යොදනු ලබන්නේ නම් ඒ සඳහා විශේෂිත අවසර පත්‍රයක් පළාත් අධිකාරියෙන් ලබාගත යුතුය. එවැනි විශේෂිත අවසර පත්‍රයක් නොමැතිව කිසිම බස් රථයක් හෝ බලයලත් වාහනයක් දකුණු පළාත ඇතුලත නිත්‍ය මගී ප්‍රවාහනයෙන් බැහැර සේවය යොදා නොගත යුතුය.

මගී සේවා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා

**11**. මෙම ප්‍රඥප්තිය යටතේ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් (මින් මතු මෙහි අවසර පත්‍රය යනුවෙන් සඳහන් කරන්න.) බස් රථයක ලියාපදිංචිකරුවකු වෙත .-

(අ) ඔහු වලංගු බස්රථ ආදායම් බලපත්‍රයක් ලබාගෙන ඇත්නම්; සහ
(ආ) එම බස් රථය සඳහා තමාගේ නමින් තෙවැනි පක්ෂ අවදානම සම්බන්ධයෙන් වලංගු අසීමිත රක්ෂණයක් ලබාගෙන ඇති බවට සනාථ කෙරෙන ලියවිලි ඉදිරිපත් කරණු ඇත්නම් මිස නිකුත් නොකළ යුතුය.

**12**. (1) අවසර පත්‍රයක් මගින් එයට සම්බන්ධව පවත්නා කොන්දේසිවලට අනුකූලව එම අවසර පත්‍රයේ නියම කර ඇති මාර්ගයේ හෝ මාර්ගවල මගීන් ප්‍රවාහනය සඳහා නිත්‍ය සේවාවක් ක්‍රියාත්මක කිරීමට බස් රථයේ ලියාපදිංචි අයිතිකරු හිමිකම් ලබන්නේය.

(2) බස් රථයක් ලියාපදිංචි අයිතිකරු නොවන යම් පුද්ගලයෙකුට කිසියම් බස් රථයක් සඳහා අවසර පත්‍රයක් ප්‍රදානය නොකළ යුතුය.

(3) එකම බස් රථයක නිත්‍ය සේවය සඳහා මෙම ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍ර එකකට වැඩි ගණනක් කිසිදු පුද්ගලයකු විසින් ලබා නොගත යුතුය.

(4) කලින් ලබාගත් අවසර පත්‍රයක් මෙම ප්‍රඥප්තිය යටතේ අවලංගු කර ඇති අවස්ථාවක (3) වන උප වගන්තියේ විධිවිධාන අදාල නොවන්නේය.

(5) (3) වන උප වගන්තියේ විධිවිධාන කඩකරන කිසියම් පුද්ගලයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවකු වන්නේය.

අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම

**13**. (1) මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් බස් රථයක් සම්බන්ධයෙන්ද, ඒ බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් අධිකාරිය වෙත, නියම කරනු ලබන ආකෘති පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(2) අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම අයෙකුම (1) වන උප වගන්තිය යටතේ වූ ඉල්ලුම් පත්‍රය සමග පහත සඳහන් විස්තර ඉදිරිපත් කල යුතුය. :-

(i) ඉල්ලුම් පත්‍රය අදාල වන්නා වූ බස් රථයේ ලියාපදිංචි අංකය, ආසන සංඛ්‍යාව සහ අභ්‍යන්තරයේ උස;

(ii) වෙන් වෙන් ගාස්තු සඳහා මගී ප්‍රවාහනයේ යෙදවීමට අපේක්ෂා කරන ඉල්ලුම් පත්‍රයට අදාල, බස් රථය ගමන් ආරම්භ කරන ස්ථානය, වැදගත් අතරමැදි ස්ථානය, ගමනාන්තය, මාර්ග අංකය, ගමන් මාර්ගයේ දුර ප්‍රමාණය (දල වශයෙන්) ; සහ

(iii) 14 වන වගන්තිය යටතේ වූ තම අභිමතය පාවිච්චි කිරීමේ කාර්යය සඳහා , අධිකාරියට අවශ්‍ය විය හැකි එවැනි වෙනත් විස්තර

බලපත්‍රය සඳහා වූ අයදුම්පත් සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම

**14**. (1) (2) වන උප වගන්තියේ විධිවිධානයන්ට යටත්ව අදාලවන පරිදි අධිකාරිය විසින් අවසර පත්‍රයක් ප්‍රදානය කිරිම, අලුත් කිරීම, මාර්ගයක සිට වෙනත් මාර්ගයකට මාරු කිරීම හෝ එසේ නැතහොත් ප්‍රදානය කිරිම, අලුත් කිරිම හෝ එක් මාර්ගයක සිට වෙනත් මාර්ගයකට මාරු කිරිම හෝ ප්‍රතික්ෂේප කිරිම හෝ කළ හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ අවසර පත්‍රයක් ප්‍රදානය කිරිම, අලුත් කිරීම හෝ එක් මාර්ගයක සිට තවත් මාර්ගයකට මාරු කිරීම නැතහොත් අවසර පත්‍රයක් ප්‍රදානය කිරිම, අලුත් කිරීම, එක් මාර්ගයක සිට තවත් මාර්ගයකට මාරු කිරීම, ප්‍රතික්ෂේප කිරීම සඳහා ද මෙම ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් හෝ අවසර පත්‍ර ප්‍රදානය කරනු ලබන යම් මාර්ගයක් හෝ මාර්ග වෙන්කර දීම සම්බන්ධයෙන් නැතහොත් මාරු කිරීම සම්බන්ධයෙන්ද තමන් වෙත ඇති අභිමතය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරිමේදි වෙන් වෙන් ගාස්තු සඳහා මගීන් ප්‍රවාහනය කිරිමේදි එම පහසුකම් අවශ්‍යවන පුද්ගලයන් මෙන්ම පහසුකම් සැලැස්විම කරනු ලබන පුද්ගලයන් ඇතුළත්ව පොදුවේ පොදු මහජනයාගේ යහපත සම්බන්ධයෙන් මූලික වශයෙන්ම සැළකිල්ල දක්වන අතර , එම අභිමතය ක්‍රියාත්මක කිරිමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ ලෙස සැලකිල්ල යොමු කළ යුතුය. :-

(i) පොදු යහපත සඳහා යෝජිත මගී ප්‍රවාහනය අවශ්‍ය වන්නේ නැතහොත් සුදුසුවන්නේ කොතෙක් දුරකටද යන වග;

(ii ) යෝජිත මාර්ගය හෝ මාර්ගවල යෝග්‍යතාවය;

(iii) යෝජිත මාර්ගයේ හෝ මාර්ගවල නැතහොත් එවැනි මාර්ගයක සේවා අවශ්‍යතාවය දැනටමත් ප්‍රමාණවත් තරමින් ඉටු වී ඇති අවස්ථා ඇත්නම් ඒ කොතෙක් දුරටද යන වග;

(iv) (ප්‍රමාණවත්, යෝග්‍ය සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමද ඇතුළුව) සමස්ථ වශයෙන් ගමනා ගමන පහසුකම්වලට අදාලව ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය මගින් කෙරෙන ප්‍රවාහනය ඇතුළුව සියලු ආකාරයේ මගී ප්‍රවාහන සේවා සම්බන්ධීකරණ;

(v) යම් ප්‍රදේශයක හෝ යම් මාර්ගයක ඇති (දුම්රිය මගින් සැපයෙන පහසුකම් ද ඇතුළුව) ප්‍රවාහන පහසුකම්, පළාත් අධිකාරියේ මතය අනුව ඒ ප්‍රදේශයේ හෝ ඒ මාර්ගය ඔස්සේ මහජනයා සඳහා පවත්නා ප්‍රවාහන අවශ්‍යතා සාධාරන ප්‍රමාණයට සපුරාලීමට තරම් සතුටුදායක නම් සහ කාර්යක්ෂම නම් ප්‍රධාන වශයෙන් එම ප්‍රදේශයෙහිම හෝ ප්‍රධාන වශයෙන් එම මාර්ගය ඔස්සේ එකී ප්‍රවාහන පහසුකම් සමහ තරගකාරිත්ව මගී ප්‍රවාහනය සඳහා අවසර පත්‍රයක් ප්‍රදානය කිරිම යෝග්‍ය නොවන බව;

(vi) එම මාර්ගය හෝ මාර්ග සඳහාම දැනටමත් අවසර පත්‍ර එකක් හෝ වැඩි ගණනක් දරන අවසර පත්‍ර ධාරියකු ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයක් මත තවත් අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම නිසා සුදුසු නොවන ප්‍රතිඵල ඇති විය හැකි බවට අධිකාරිය තුළ සාධාරණ විශ්වාසයක් ඇති වූ අවස්ථාවක්.

අවසර පත්‍රයේ කාල සීමාව ආදිය

**15.** (1) යම් පුද්ගලයකු අධිකාරිය විසින් නියම කල හැකි යම් ගාස්තුවක් හෝ ගාස්තු අධිකාරියට ගෙවනු ලැබුවේ නම් සහ ඔහු විසින් අධිකාරිය නියම කළ යම් නියමිත කොන්දේසි හා අවශ්‍යතා ඉටුකරනු ලැබුවේ නම් මිස එවැනි යම් පුද්ගලයෙකුට අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(2) සෑම මගී සේවා අවසර පත්‍රයක්ම -

(i) නියමිත ආකෘතිය අනුව විය යුතුය; තවද

(ii) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, නිකුත් කරන ලද දිනයේ සිට මාස 12ක කාල සීමාවක් වලංගුව පවතින්නේය.

(3) අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම්කරු ජනතා සන්තක මගි ප්‍රවාහන සේවා සමාගම හෝ සමුපකාර සමිතියක් වූ අවස්ථාවකදී බස් රථයක් එක් මාර්ගයකට වැඩි සංඛ්‍යාවක ධාවනය කිරීම සඳහා අවසර පත්‍රයක් දීමේ හෝ නොදීමේ අභිමතය අධිකාරිය සතු වේ.

මගී යහපත සහ වෙනත් කරුණු සඳහා බලපත්‍රයේ ඇතුළත් කළ යුතු කොන්දේසි

**16.** මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට යටත්ව, නිකුත් කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව හා සැප පහසුව පිණිස නියම කරන්නා වූ සියළුම කොන්දේසි ඇතුළුව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කොන්දේසි ඇතුළත් කරනු ලැබිය යුතුය -

(i) අය කරනු ලබන ගාස්තුව රජයේ සාමාන්‍ය ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි අධිකාරිය විසින් නියම කල හැකි අන්දමට විය යුතු අතර, අය කිරීමට අපේක්ෂිත ගාස්තුව මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ අයදුම් පත්‍රයෙහි සඳහන් කල යුතුය.

(ii) අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස් රථ, අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල ධාවනයේ යෙදවිය යුතු බව.

(iii) (නියම කර ඇති අවස්ථාවලදී) කාල සටහනේ සහ අධිකාරියේ අනුමැතිය ලත් ගමන් ගාස්තු චක්‍රයෙහි පිටපත්, අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස් රථයේ රැගෙන යා යුතු බව සහ එහි තුල ප්‍රදර්ශනය කර තැබිය යුතු බව.

(iv) අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස් රථය, සියලු අවස්ථාවන්හිදි ,යාන්ත්‍රිකව යෝග්‍ය මාර්ගයේ ධාවනයට සුදුසු හා සේවාවේ යෙදවීමට සුදුසු තත්ත්වයකින් පවත්වා ගත යුතු බව .

(v) බස් රථවල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් අඛණ්ඩව සේවයේ නිරතව සිටිය හැකි කාලය සහ ඔවුන්ගේ වැඩ කරන පැය ගණන හා විවේක කාල සම්බන්ධයෙන් හා ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක ඇති නියමයන් අවසර පත්‍රයේ බලය යටතේ ධාවනයේ යොදවන බස් රථයේ රියදුරු හා කොන්දොස්තර සම්බන්ධයෙන් පිළිපැදිය යුතුය. එම රියදුරු හා කොන්දොස්තරවරුන්ට නිසි වෘත්තිය සහ ශාරීරික යෝග්‍යතාවය තිබිය යුතුය.

(vi) අවසර පත්‍රයේ බලය යටතේ යොදවනු ලබන බස් රථයේ සේවයේ යෙදෙන කොන්දොස්තර වරයා විසින් නැතහොත් කොන්දොස්තර වරයාගේ කාර්ය ඉටුකරන වෙනත් පුද්ගලයකු විසින්, අය කළ ගාස්තුව, මගියාගේ ගමනාරම්භය හෝ ගමනාන්ත ස්ථානය( නමින් හෝ ගාස්තු අවස්ථා අංකයෙන්) එකි බස් රථයේ ලියාපදිංචි අංකය සම්පූර්ණව ඇති පැහැදිලි අනුක්‍රමික අංක සඳහන් ටිකට්පතක් එක් එක් මගියා වෙත නිකුත් කල යුතුය.

බස් රථය සඳහා වැඩිපුර ගාස්තු අය කිරීමට එරෙහිව තහනම

(vii) අවසර පත්‍රයේ බලය පිට යොදවනු ලබන බසයේ කුමන අවස්ථාවකදී හෝ අවසර පත්‍රයේ අවසර ලැබී ඇති මගී සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහනය නොකල යුතුය.

(viii) කිසිඳු බස් රථයක අයිතිකරු, රියදුරු හෝ කොන්දොස්තර විසින්.-

(1) (අ) බස් රථය යොදවනු ලබන්නේ යම් නිත්‍ය ප්‍රවාහන අවසර පත්‍රයක බලය යටතේද, එය යම් කොන්දේසියක් මත යම් ගමන් මාර්ගයකට හෝ මහා මාර්ගයකට අයකිරීමට ඇති ගාස්තුවකට වැඩිපුර ගාස්තුවක් එම ගමන් මාර්ගයේ නැතහොත් මහාමාර්ගයේ ගමන් කිරිම සඳහා කිසිඳු මගියෙකුගෙන් ඉල්ලීම හෝ ලබා ගැනීම නොකළ යුතුය.

(2) (අ) (viii) වගන්තියේ සඳහන් කරන ලද බලයලත් ගාස්තුවට වැඩිපුර කිසිදු ගාස්තුවක් යම් ගමනක් යෑම වෙනුවෙන් ගෙවීමට තමා ඇතුළත් වූ කිසියම් ගිවිසුමක් අනුව කිසිඳු පුද්ගලයකු බැඳී නොසිටිය යුතු අතර කරුණට අදාල කළ හැකි එවැනි බලයලත් ගාස්තුවකට වැඩිපුර වන යම් ගාස්තුවක් ගෙවා ඇති යම් පුද්ගලයකු එම මුදල ගෙවන ලද පුද්ගලයාගෙන් එය ආපසු අයකර ගැනීමට හිමිකම් ලබන්නේය;

වැඩිපුර ගාස්තු අය කර ගැනීම

(ආ) (viii) වන වගන්තියේ විධිවිධානයන් කඩ කිරීම සම්බන්ධයෙන් යම් පුද්ගලයකු අධිකරණයක් විසින් වරදකරු කරන ලද අවස්ථාවකදී එම කඩකිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පනවනු ලැබිය හැකි වෙනත් කිසියම් දඬුවමකට අමතරව එම පුද්ගලයා වෙත බලයලත් උපරිම ගාස්තුවට වැඩි හෝ බලයලත් ගාස්තුව හෝ එකඟ වූ ගාස්තුව යන ඒවායින් අදාල වන පරිදි ඊට වැඩියෙන් ගෙවන ලද මුදල ආපසු ගෙවීමට ඔහුට නියම කළ හැකිය.එය අධිකරණය එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරිමේදී පැනවිය හැකි දඩ මුදල ඉක්මවා ගිය හැකි වුවද අධිකරණය විසින් පැනවූ දඩයක ආකාරයෙන් එම මුදල අයකර ගත යුතුය;

(ඇ) බස් රථයේ ආපදාවක් නිසා හෝ යම් දෝෂයක් හෝ අයිතිකරුගේ හෝ අයිතිකරුගේ යම් සේවකයකුගේ නොසැලකිල්ලක් නිසා හෝ බස් රථය එහි ගමනාන්තයට ලඟාවීමට අපොහොසත් වුවහොත් යම් ගමනක් සඳහා වූ ගාස්තුව නිසි පරිදි ගෙවා ඇති බස් රථයක ගමන් ගන්නා කිසියම් මගියකු ගමනේ ඉතිරි කොටස සඳහා වූ ගාස්තුව ඉල්ලිමක් කර ආපසු අයකර ගැනීමට හිමිකම් ලැබිය යුතුය.

(ඇ) ගාස්තුව 2 (ඇ) වගන්තිය යටතේ ආපසු අයකර ගැනීමට හැකිවන අවස්ථාවකදී ඉල්ලා සිටිවිට ගාස්තුව ලබාගත් තැනැත්තා විසින් එම මුදල ආපසු අයකර ගැනිමට හිමිකම් ලබන මගියා වෙත ආපසු ගෙවිය යුතුය;

(ඉ) 2 (ඇ) උප වගන්තිය කඩකිරීමක් සම්බන්ධයෙන් යම් පුද්ගලයකු අධිකරණය විසින් වරදකරු කරන ලද අවස්ථාවකදී එම කඩකිරිම් සම්බන්ධයෙන් අධිකරණය විසින් නීත්‍යානුකූලව පනවනු ලැබිය හැකි වෙනත් කිසියම් දඩුවමකට අමතරව ගාස්තුව ආපසු ගෙවීමට නියම කළ හැකිවන අතර එවැනි ගාස්තුවක් අධිකරණය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදි පැනවිය හැකි දඩ මුදල ඉක්මවා ගිය හැකි වුවද , අධිකරණය විසින් පැනවු දඩයක ආකාරයෙන් එම මුදල අයකර ගත යුතුය;

(ඊ) මෙම වගන්තියේ විධිවිධාන යටතේ අයකර ගත හැකි යම් ගාස්තුවක් හෝ කොටසක් අය කර ගැනීම සඳහා වූ යම් සිවිල් වරදක් කෙරෙහි මෙම වගන්තියේ කිසිවක් බලනොපෑ යුතුවේ.

(ix) අවසර පත්‍රයේ බලය යටතේ ධාවනය කෙරෙන බස් රථයේ සේවයේ යෙදී සිටින රියදුරු හා කොන්දොස්තර හැම විටම අවධානයෙන් සිටිය යුතු අතර , ඔවුන් බස් රථයේ ගමන් ගන්නා මගීන්ගේ යහපත හෝ පහසුවට බලපෑහැකි තත්ත්වයන් හා අවස්ථාවන් මග හැරවීමට හෝ වැලැක්වීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

(x) සහනදායි වාර ප්‍රවේශ පත්‍ර ක්‍රමයක් ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් වන කිසියම් නියමයක් වේ නම් එයට අනුකූලව කටයුතු කළ යුතුය

(xi) අවශ්‍යවන අවස්ථාවන්හිදී ගිවිසුමේ කොන්දේසි නියමිත ආකාරයට මගීන් වෙත සතුටුදායක, කාර්යක්ෂම සේවාවක් සහතික කිරිම සඳහා අවසර පත්‍ර ලාභියා අධිකාරිය සමග ගිවිසුමකට අත්සන් කළ යුතු වේ.

(xii) අවසර පත්‍රයේ බලය යටතේ බස් රථය ධාවනයේ යොදවන රියදුරු හා කොන්දොස්තරවරයා හැම විටම මගීන් කෙරෙහි කරුණාවන්ත හා ආචාරශීලී විය යුතුය.

**17**. අධිකාරිය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කරන අවස්ථාවේදී , ධාවනයේ යෙදීම පිණිස ඒ අවසර පත්‍රයෙන් බලය දෙනු ලබන බස් රථය එහි හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි අධිකාරිය සලකන වෙනත් විස්තර ඒ අවසර පත්‍රයේ නිශ්චිත වශයෙන් දක්වනු ලැබිය යුතුය.

අවසර පත්‍රයේ බලය ලත් බස් රථය නිශ්චිතව දැක්වීම

**18**. දකුණු පළාත් සභාව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ වෙනත් යම් පළාත් සභාවක් විසින් අවසර පත්‍රයක් ප්‍රදානය කර ඇති කිසියම් පුද්ගලයෙකුට අධිකාරිය විසින් නියෝග නිකුත් කළ හැකි අතර, එවැනි යම් නියෝගයන් කෙරෙන්නේ මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට හෝ ඒ යටතේ වූ රෙගුලාසියක් එම පුද්ගලයා විසින් පිළිපැදීම අවශ්‍යයයි අධිකාරිය කල්පනා කරන විටක වන අතර, එවැනි නියෝගයන් නිකුත් කරනු ලබන පුද්ගලයන් විසින් එවැනි නියෝග එහි සඳහන් කර ඇති කාලසීමාව තුළ දී පිළිපැදිය යුතු වන්නේය.

අන් අයට නියෝග නිකුත් කිරීමට අධිකාරියට ඇති බලය

**19**. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් ,වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශුන්‍ය හා බල රහිත වන්නේය.

අවසර පත්‍රය පැවරිය නොහැකි බව

**20**.පළාත තුළ මගී ප්‍රවාහන සේවාවක තමා යෙදීමට බලාපොරොත්තුවෙන් යම් කෙනෙකු දැනටමත් අවසර පත්‍රයක් නිකුත් කර ඇති බස් රථයක් මිළ දී ගෙන ඇති අවස්ථාවක ඔහු විසින් එම බස් රථයේ හිමිකාරත්වයේ වෙනස්වීම වහාම අධිකාරිය වෙත දැන්විය යුතු අතර, එම බස් රථය සම්බන්ධයෙන් තමා වෙත අධිකාරියෙන් දෙන ලද විධානයන් වෙතොත් ඒවා පිළිපැදිය යුතුවේ.

බස් රථයට අළුත් හිමිකරු විසින් හිමිකාරත්වයේ වෙනස්වීම අධිකාරිය වෙත දැන්විය යුතු බව

(i) මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් ලබාගත් ධාවකයකු තමා සතුවන බස් රථය විකුණනු ලබන්නේ හෝ අන්සතු කරන්නේ නම් ඔහු විසින් දින 60ක් ඇතුලත එකී මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය වෙනත් බස් රථයක් සඳහා පළාත් අධිකාරිය මගින් සංශෝධන කරවා ගත යුතුය. එය ඒ ආකාරයෙන් සංශෝධනය නොකළහොත් එම අවසර පත්‍රය අවලංගු වූවාසේ සලකනු ලැබිය යුතුවේ.

**21**. මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ, ඉල්ලුම් පත්‍රයේ අවසර පත්‍රධාරියා විසින් සඳහන් කරන ලද විස්තරවල යම් වෙනසක් සිදු වූ විට ඒ බව ඒ දින සිට දවස් 14ක් ඇතුලත, ඒ අවසර පත්‍රධාරියා විසින් ඒ වෙනස පිළිබඳව අධිකාරිය වෙත ලිඛිතව දන්වා ඒ පිලිබඳ තීරණය ලිඛිතව ලබාගත යුතුය.

අවසරපත්‍ර ධාරියා විසින් විස්තරවල වෙනසක් වූ විගස ඒ බව අධිකාරියට දැන්විය යුතු බව

(i) මෙසේ වලංගු මගී සේවා අවසර පත්‍රයක් ලබා ඇති බස් රථයක් මිලදී හෝ පවරා ගන්නා අවස්ථාවේදී නව මගී සේවා අවසර පත්‍රයක් ලබාගන්නා ධාවකයෙකුට එම බස් රථය සඳහාම කලින් නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් තිබීමේ හේතුවෙන් ධාවන මාර්ගය හෝ කාලසටහන පිළිබඳ විශේෂ අයිතිවාසිකමක් හිමි නොවේ.

අවසර පත්‍රය අළුත් කිරීම

**22**. මේ ප්‍රඥප්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර ධාරියෙකු විසින් අධිකාරිය වෙත එය අලුත්කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විට එම අවසර පත්‍ර ධාරියා -

(i) මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව හෝ ඒ යටතේ සාදන ලද නියෝග අනුව ක්‍රියාකර ඇති බවට;

(ii) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබ නොමැති බවට;

(iii) අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියම කර ඇති ගාස්තු ගෙවා ඇත්නම් හා අනිකුත් අදාල කොන්දේසි ඉටුකර ඇති බවට සෑහීමකට පත්වන්නේ නම් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත්වන දින සිට එක් අවුරුද්දක කාලයක් සඳහා හෝ ඊට අඩු කාලයකට ඒ අවසර පත්‍රය , අධිකාරිය විසින් අලුත් කරනු ලැබිය හැකිය.

අවසර පත්‍රය අවලංගු කිරීම.

**23**. අවසර පත්‍ර ධාරියා විසින් -

(i) මේ ප්‍රඥප්තියේ විධිවිධානයන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයන් හෝ උල්ලංඝනය කර ඇති බවට:

(ii) 18 වන වගන්තිය යටතේ ඔහු වෙත නිකුත් කරන ලද යම් විධානයක් අනුව ඔහු ක්‍රියාකර නොමැති බවට: හෝ,

(iii) මේ ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරු හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක තමා දැනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර ඇතුලත් යම් වාර්තාවක් සපයා ඇති බවට;

(iv) ඒ අවසර පත්‍රය යටතේ සැලසීමට ඔහු බැඳී ඇති සේවාවක් සැලසීමට දින 30ක අඛණ්ඩ කාලයක් ඔහු පැහැර හැර හෝ නොසලකා හැර හෝ ඉටුකිරීමට අපොහොසත්ව ඇති බවට.

අධිකාරය සෑහීමකට පත්වන අවස්ථාවක, පලාත් අධිකාරිය විසින් ඒ අවසර පත්‍රය දරන්නාට කරුණු දක්වා සිටීමට අවස්ථාවක් ලබාදීමෙන් පසු, එවැනි අවසර පත්‍රයක් සම්බන්ධයෙන් අවසර පත්‍රය සඳහා ගෙවිය යුතු ගාස්තුව මෙන් තුන් ගුණයකට වඩා වැඩි නොවන අධිභාරයක් පනවමින් නියෝගයක් කිරීම හෝ අවසර පත්‍රය මාස 3කට වැඩි කාලයකට අත්හිටුවීමට හෝ අවසර පත්‍රය අවලංගු කිරීමට හෝ අධිකාරියට හැකිය.

අධිකාරියේ තීරණය ඊට හේතු සමඟ ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රධාරියාට දැනුම්දිය යුතු බව

**24**. (1) අධිකාරිය විසින් මගී සේවා අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට 14 වන වගන්තිය යටතේ තීරණය කළවිට හෝ 23 වන වගන්තිය යටතේ නියෝග කළ විට අධිකාරිය විසින් එහි තීරණය හෝ නියෝගය හා එයට හේතු අවස්ථාවෝචිත පරිදි ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රධාරියාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(2) 23 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් අත්හිටුවමින් හෝ අවලංගු කරමින්ද එසේ නැත්නම් අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා හෝ අලුත් කිරීම සඳහා ද අධිකාරිය විසින් දෙන ලද නියෝගයක් 25 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව එවැනි නියෝගයක් හෝ තීරණය කළ දිනයේ සිට දින 30ක් ගත වූ පසුව එළඹෙන ඊළඟ දිනයේ සිට මෙම උප වගන්තියේ කාර්යයන් සඳහා ක්‍රියාත්මක වන අතර ( එම දිනයද ඇතුළුව) මෙම උප වගන්තියේ කාර්යයන් සඳහා නියෝගය හෝ තීරණය ලියාපදිංචි තැපෑලෙන් පිටත් කළ දිනය නියෝගය හෝ තීන්දුව කරන දිනය ලෙස සැලකිය යුතුවේ.

අභියාචනය

**25**. (1) (23) වන වගන්තිය යටතේ වූ අධිකාරියේ තීරණයන් හෝ නියෝග නිසා -

(i) අවසර පත්‍රයක් ප්‍රදානය කිරීමට හෝ අලුත් කිරීමට ප්‍රතික්ෂේප කිරීමෙන්; හෝ

(ii) අධිභාරයක් පැනවීම හෝ අවසර පත්‍රයක් අත්හිටුවීමෙන් හෝ අවලංගු කිරීම නිසා;

අතෘප්තියට පත් අවසර පත්‍ර ඉල්ලුම්කරුවෙකු හෝ අවසර පත්‍ර ධාරියෙකු අවස්ථාවෝචිත පරිදි එම තීරණය හෝ නියෝග දින සිට දින දහහතරක් ඇතුළත එම තීරණයට හෝ නියෝගයට විරුද්ධව ලිඛිත අභියාචනයක් පළාතේ ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

(2) අධිකාරිය විසින් 23 වන වගන්තිය යටතේ අධිභාරයක් පනවමින් හෝ අවසර පත්‍රයක් අවලංගු කරමින් නියෝගයක් කර ඇති අවස්ථාවකදී නියෝගයකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමේ කාලසීමාව අවසන් වන තුරු හෝ එම කාලය ඇතුළත දී අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් අභියාචනය පිළිබඳ තීරණය අවසර පත්‍රය දරන්නාගේ වාසියට නොවන විටකදී මිස එතෙක් එම නියෝගය ක්‍රියාත්මක නොවිය යුතුය.

(3) මෙම වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට පළාතේ ආණ්ඩුකාරවරයා විසින් -

(අ) අභියාචනයට ඉඩ දී , අවසර පත්‍ර ප්‍රදානය කරන ලෙස හෝ අලුත් කරන ලෙස අවස්ථාවෝචිත පරිදි අධිකාරිය වෙත විධානය කළ හැකිය; නැතහොත්

(ආ) අභියාචනයට ඉඩදී අවස්ථාවෝචිතව අධිභාරය පැනවීම හෝ අවසර පත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කර නියෝගය ඉවත්කල හැකිය: නැතහොත්

(ඇ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකිය.

(4) මෙම වගන්තිය යටතේ අභියාචනයක් මත පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන තීරණය අවසාන හා තීරණාත්මක විය යුතුය.

(5) එවැනි අභියාචනයක් පිළිබඳ පළාත් ආණ්ඩුකාරවරයාගේ තීරණය අප්‍රමාදව අධිකාරියට දැනුම් දිය යුතුවේ.

(6) 3 වන උප වගන්තිය යටතේ පළාත් ආණ්ඩුකාරවරයා විසින් දෙනු ලබන තීරණයක් මත පිහිටා අධිකාරිය කටයුතු කළ යුතුය.

අවසර පත්‍රය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව

**26**. අවසර පත්‍රය නිකුත් කළ අදාල බස් රථයේ ඉදිරිපස වීදුරුවේ (වින්ඩ්ස්ක්‍රීනයේ) ප්‍රකටව පෙනෙන පරිදි අවසර පත්‍රය ප්‍රදර්ශනය කළ යුතුය.

වාර්තා ආදිය

**27**. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තම කාර්යයන් ඉටු කිරිමේ කාර්ය සඳහා අධිකාරියට අවශ්‍ය වන යම් වාර වාර්තාවක් තොරතුරක් හෝ කරුණු පැහැදිලි කිරීමක් දැන්වීමේ සඳහන් කරනු ලබන නියමිත කාලය ඇතුලත සපයන ලෙස මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් දරන්නෙකුට අධිකාරිය විසින් ලියවිල්ලකින් දැන්වීමක් කළ හැකි අතර, ඒ දැන්වීමේ නියමයන් පිළිපැදිම ඒ අවසර පත්‍රය දරන්නාගේ යුතුකම වන්නේය.

යම් කරුණු පිළිබඳ අධිකාරිය විසින් නියෝග නිකුත් කළහැකි බව

**28**. (1) මගීන්ගේ යහපත සඳහා පළාත් සභා බල ප්‍රදේශය තුළ බස්ගාල් හා බස් නැවතුම්පොලවල පිහිටීම කුමන ලෙසකින් හෝ වෙනස් කිරීම , දියුණු කිරිම, පිහිටුවීම, ඉවත් කිරීම, නඩත්තු කිරීම සඳහා නියෝග නිකුත් කිරීමට සහ අදාල පළාත් පාලන ආයතන මගින් ඒ සඳහා කටයුතු පිලියෙල

කිරීමට හෝ සුදුසුයයි සලකන වෙනත් ආකාරයකින් කටයුතු කිරීමට අධිකාරියට බලතල ඇත්තේය.

(2) බස්ගාල්වල සිට හෝ බස් නැවතුම්පොලවල සිට බස් රථ ධාවනය කරවීම සඳහා කාලසටහනක් ක්‍රියාත්මක කිරීමට අධිකාරියට බලය ඇති අතර කාලසටහනක් අනුව කළමනාකාරීත්වය ඇති කිරිම සඳහා කටයුතු කරන කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරිමට හෝ අධීක්ෂණය කරවීමට අවශ්‍ය කටයුතු පිළියෙල කිරීමට ද කාර්යමණ්ඩලයට නියෝග හා උපදෙස් නිකුත් කිරීමටද ඊට බලය ඇත. එවැනි යම් කරුණු පිලිබඳව අධිකාරිය විසින් උපදෙස් නිකුත් කළ හැකිය.

(3) බස් රථ ධාවනය කිරිම සඳහා අදාල කාල සටහන් අනුව කළමනාකාරීත්ව කටයුතුවල යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ පත්කිරීම්, සේවයෙන් අස්කිරීම් ඇතුළු විනය පාලනය කිරිමේ කටයුතු අධිකාරියට කළ හැකිය.

ඇමතිවරයාගේ නිර්දේශ

**29**. රජයේ සාමාන්‍ය ප්‍රතිපත්තියට එකඟවන පරිදි පහසුකම් සැලැස්වීම සඳහාද බස් රථ සැපයීම සඳහා හුදෙක් මගී ප්‍රවාහන සේවයේ යහපත සඳහා වූ බදු සහන සඳහාද යෝජනා හා නිර්දේශ එහි අනුමැතිය සඳහා යෝග්‍ය අවස්ථාවලදී පළාත් සභාව වෙත ඉදිරිපත් කිරිමට ඇමතිවරයාට හැකිය.

ඕනෑම ඔමිනි බස්රථයකට ඇතුල්වීමට ඇති බලය සහ වෙනත් කරුණු

**30**. අධිකාරිය වෙනුවෙන් ලිඛිතව බලයලත් යම් පුද්ගලයෙකුට ඕනෑම අවස්ථාවකදී -

(අ) එම බස් රථය ධාවනය කිරිම සඳහා අවසර පත්‍රයක් මගින් බලය ලබාගෙන ඇත්දැයි නැතහොත් එම අවසර පත්‍රයට අදාල කොන්දේසි නැතහොත් 18 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග පිළිපදිනවාදැයි නැතහොත් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ඒවා පිළිපදිමින් කටයුතු කරනවාදැයි යන්න සොයා බැලීම සඳහා ඕනෑම බස්රථයකට ඇතුල් විය හැකිය;

(ආ) එම බස් රථය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයේ හෝ ලොග් සටහන් පත්‍රය හෝ එම බස් රථයට අදාල වෙනත් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස එම බස් රථයේ රියදුරු වෙත නියම කළ හැකිය.

(ඇ) එම ලොග් සටහන් පත්‍රය හෝ යම් ලියවිල්ලක් තම භාරයට ගැනීමට හෝ එහි පිටපතක් ලබා ගැනීමට හැකිය.

## IV වන කොටස

## අධිකාරියේ කාර්ය මණ්ඩලය

**31**. (1) අධිකාරිය විසින් , අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමැතිය ඇතිව අධිකාරිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය හැකිය.

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

(2) අධිකාරියේ සාමාන්‍ය විධානයන්ට හා පාලනයට යටත්ව අධිකාරියේ එදිනෙදා පරිපාලන කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරේ.

(3) අධිකාරිය තම කාර්යක්ෂම පරිපාලනය සඳහා සහ 2 වන උප වගන්තියේ කාර්යයන් සඳහා අවශ්‍යයයි තීරණය කළ හැකි මෙම ප්‍රඥප්තිය යටතේ වූ යම් බලතල වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම බලතල අධිකාරියේ නියෝග හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

(4) අධිකාරියේ කාර්යක්ෂම පරිපාලනය සඳහා අවශ්‍යයයි ඔහු විසින් සලකනු ලබන 3 වන උප වගන්තියෙන් පැවරි ඇති බලතල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරියේ ලිඛිත අනුමැතිය සහිතව වරින්වර ලිඛිතව අධිකාරියේ යම් වෙනත් සේවා නියුක්තිකයකුට පැවරිය හැකිය. එසේ බලතල පවරනු ලැබූ යම් සේවා නියුක්තිකයකු එම බලතල අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හා විශේෂ නියමයන්ට යටත්ව පාවිච්චි කල යුතුය.

(5) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව අධ්‍යක්ෂ ජනරාල්වරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය නොහැකිය.

**32**. (1) අධිකාරිය විසින් -

අධිකාරියේ අනිකුත් සේවා නියුක්තිකයන්

(අ) අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි අනිකුත් සේවා නියුක්තිකයන් සංඛ්‍යාව පත් කර ගත යුතුය.

(ආ) ඒ සේවා නියුක්තිකයන් වේතන හා වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම.

(ඇ) එම සේවා නියුක්තිකයන්ගේ සේවා නියමය හා කොන්දේසි තීරණය කිරීම.

(ඈ) එම සේවා නියුක්තිකයන්ගේ යහපත සඳහා අර්ථ සාධක අරමුදල් යෝජනා ක්‍රම පිහිටුවීම හා විධිමත් කිරීම සහ එසේ වූ යම් අරමුදලකට දායක මුදල් ගෙවීම් කළ හැකිය

(ඉ) එම සේවා නියුක්තිකයන් පිළිබඳව විනය පාලනය පවත්වාගෙන යාම.

පළාත් අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධාරීන් පත් කිරීම

**33.** (1) අධිකාරියේ ඉල්ලීම පිට පළාත් රජයේ සේවයේ යම් නිළධාරියකු එම නිළධාරියාගේද එම නිළධාරියා සේවයේ නියුක්ත කරනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් යටතේද, ඒ අමාත්‍යාංශයේ ලේකම් වරයාගේද, ප්‍රධාන ලේකම්වරයාගේද කැමැත්ත ඇතිව අධිකාරිය විසින් එසේම වූ කැමැත්ත ඇතිව නිශ්වය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(2) රජයේ සේවකයකු තාවකාලිකව අධිකාරියේ සේවක මණ්ඩලයට පත්කරනු ලැබූ අවස්ථාවකදී -

(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්වීම් ලබන අවස්ථාවේ ඔහුගේ පළාත් රාජ්‍ය සේවයේ ප්‍රධාන නිලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස ප්‍රකාශිත වූවක් නම් -

(i) ඔහු අධිකාරිය යටතේ වූ සේවයේ යෙදී සිටියදී ඔහු පොදු ප්‍රතිපත්තිය යටතේ වැටුප් රහිතව ප්‍රදානය කෙරුනු නිවාඩු මත පළාත් රාජ්‍ය සේවයේ සේවයට වාර්තා නොකළ අයෙකු ලෙස සලකනු ලබන අතර, ඔහුට එම ව්‍යවස්ථාවේ 10 (1) වගන්තිය අදාල වන්නේය; තවද

(ii) අධිකාරිය විසින් ඔහු වෙනුවෙන් අධිකාරියේ අරමුදල් වලින් ඔහු පළාත් අධිකාරියේ සේවය කරනු ලබන සෑම සම්පූර්ණ මාසයක් සඳහාම ඔහුට පළාත් රාජ්‍ය සේවාවේ ප්‍රධාන තනතුර සඳහා ගෙවිය යුතු පළාත් ඇමති මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂය භාර ඇමතිවරයා තීරණය කරන පරිදි වැටුපෙන් සියයට විසිපහට වැඩි නොවන මුදලක් පළාත් සභා අරමුදලට ගෙවනු ලැබේ; තවද

(ආ) අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සේවය සඳහා ඔහු තාවකාලිකව පත් කරන ලද අවස්ථාවේ ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයෙකු වී නම් එම ආඥාපනතේ කාර්යන් සඳහා අධිකාරියට කෙරෙන ඔහුගේ සේවාවන් රජයට කරන සේවාවක් ලෙස සලකනු ලබන අතර, ඒ අනුව ඔහු අධිකාරියේ සේවයේ යෙදී සිටියදී ආඥාපනත යටතේ ඔහු ගෙවීමට යටත්වන දායක මුදල් ප්‍රමාණය ඔහු දිගටම රාජ්‍ය

සේවා අර්ථසාධක අරමුදල් අදාළ ගිණුමට බැරකිරීම සඳහා , රජය විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ඔහු වෙනුවෙන් ගෙවා දායකවීමට යටත්වන මුදලට සමාන මුදලක්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ඔහු වෙනුවෙන් යැවිය යුතු වේ.

(3) යම් රජයේ සේවකයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරන ලද අවස්ථාවක -

(අ) ඔහු පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත්ව ගියා සේ සැළකිය යුතුය.

(ආ) අධිකාරියේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර ලෙස පත් කරන ලද කාලසීමාවේදී පළාත් රාජ්‍ය සේවාවේ ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණේ නම් -

(i) ඔහු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර සේවකයෙකු වශයෙන් පත් කරනු ලැබූ දිනයේදී පළාත් රාජ්‍ය සේවාවෙන් විශ්‍රාම ගෙන සිටියා මෙන් එම ව්‍යවස්ථා යටතේ එලෙස ප්‍රදානයක් කරනු ලැබීමට ඔහු සුදුසුකම් ලැබිය යුතුය;

(ii) වයස නිසා හෝ අසනීපය නිසා හෝ ඔහු විසින් ඒ කාර්ය මණ්ඩලයෙහි දරන ලද තනතුර අහෝසි කිරීම නිසා හෝ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවා නියුක්තිය විශ්‍රාම ගැන්වීමෙන් අවසන් කරනු ලැබුවහොත් මිස ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරන ලද එවැනි යම් ප්‍රදානයක මුදල් ප්‍රමාණය ඔහුට ගෙවනු නොලැබිය යුතුය;

(iii) අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින අතරතුර ඔහුගේ මරණය සිදුවූවිට ඔහු සම්බන්ධයෙන් කළ හැකිව තිබූ යම් ප්‍රදානයක්; සහ

(ඇ) අධිකාරියේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත්කරනු ලැබූ අවස්ථාවේදී ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකයකුව සිටියේ නම් ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, පළාත් සභාවේ කැමැත්ත අනුව ගිවිසුම අවසන් වීමෙන් ආණ්ඩුවේ සේවය අත්හරිනු ලැබූ ලෙස ඒ ආඥාපනතේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතුය.

(4) යම් නියමිත කාලයක් සඳහා ආණ්ඩුවට හෝ පළාත් සභාවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග හෝ එම පළාත් සභාව සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට හෝ පළාත් සභාවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(5) අධිකාරියේ සියළුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

අධිකාරියේ සේවා නියුක්තිකයන් රජයේ සේවකයන්සේ සැලකිය යුතු බව.

(6) අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපනය කරනු ලැබිය යුතුය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් විය යුතු බව

## V වන කොටස

## මුදල්

පළාත් බද මගී සේවා ගිණුම

**34**. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා "පළාත් බද මගී සේවා ගිණුම" ( මින් මතු ගිණුම යනුවෙන් සඳහන් කෙරෙන)යනුවෙන් හඳුන්වනු ලබන පළාත් සඳහා වූ පළාත් අරමුදලේ වෙනම ගිණුමක් පවත්වා ගෙන යා යුතුය. ක්‍රියාත්මක කළ යුතුය.

(2) ගිණුමේ පහත සඳහන් ලැබීම් මුලින් පළාත් අරමුදලට ගෙවිය යුතු අතර, පසුව ඒවා ගිණුමට බැර කළ යුතුය.-

(අ) මෙම ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරිමේදී අවසර පත් නිකුත් කිරීමෙන් හා අලුත් කිරීමෙන් ලැබෙන මුදල් හැර අධිකාරියට ලැබෙන සෑම මුදල් ප්‍රමාණයක්ම;

(ආ) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් සභාව විසින් කෙරෙන ප්‍රදානයන් හා අත්තිකාරම්;

(ඇ) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා එක් එක් පෞද්ගලික ත්‍යාගකරුවන්ගේ හා රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබෙන මුදල්; සහ

(ඇ) අධිකාරියට අයත් වංචල හෝ නිශ්චල දේපල විකිණීමෙන්, බදු දීමෙන්, උගස් කිරීමෙන් හෝ ගොඩනැගිලිවල බදු කුලී වශයෙන් උපයාගනු ලබන වෙනත් ආකාරයකින්ද ලබන සියළු මුදල්.

(3) ගිණුම හොඳින් පවත්වාගෙන යෑම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතුය.

(4) ගිණුම පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හා පළාත් අරමුදල සම්බන්ධයෙන් වන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ iii වන පරිච්ඡේදයේ විධිවිධාන වලට යටත් විය යුතුය.

ගිණුමෙන් ගෙවීම

**35**. පහත සඳහන් කාර්යයන් සඳහා යම් මුදල් ප්‍රමාණයක් අවශ්‍යයයි අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් කරන්නේ නම්, එනම් -

(අ) මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරිමේදී සිදුවන යම් වියදම් සඳහා;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ වූ අධිකාරියේ සාමාජිකයන්ට හා සේවා නියුක්තිකයන්ට පරිශ්‍රමික ගෙවීම සඳහා ;

(ඇ) මෙම ප්‍රඥප්තිය විධිවිධාන යටතේ කිරීමට අවශ්‍ය විය හැකි වන්නා වූ නැතහොත් මෙම ප්‍රඥප්තියේ යම් කාර්යයන් සඳහා ඇමතිවරයා බලය දුන් යම් වෙනත් වියදම් දැරීම සඳහා එම මුදල් ප්‍රමාණයන් ඇමතිවරයාගේ නිර්දේශ මත එම කාර්ය සඳහා ගිණුමේ මුදල්වලින් ගෙවිය හැක.

අධිකාරියට ණය ගැනිමේ බලය

**36**. මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරියට සිය වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය වනු ලබන මුදල් ප්‍රවාහන අමත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද පොදු අවසරයක නියමයන්ට අනුකූලව අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකාරිය විසින් තාවකාලිකව ණයට ගත හැකිය.

එසේ වුවද අධිකාරිය විසින් මේ වගන්තිය යටතේ ලබාගන්නා ලද තාවකාලික ණය මුදල් වෙනුවෙන් ගෙවීමට ඉතිරිව ඇති මුදල කිසිම අවස්ථාවකදී මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මුදල් ප්‍රමාණයන් නොඉක්මවිය යුතුය.

ගිණුමේ මුදල් වර්ෂය

**37**. ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුත්තේය.

**38**. (1) එක් එක් මුදල් වර්ෂය සඳහා ගිණුමේ වත්කම් හා බැරකම් එම මුදල් වර්ෂය අවසන්ව මාස හයක් ඉකුත්වීමට පෙර විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. විගණනයේදි ඔහුට සහය වීමේ කාර්ය සඳහා සුදුසුකම්ලත් යම් විගණනයෙකු හෝ විගණකයින්ගේ සේවාව ලබාගත හැකි අතර, ඔවුන් ඔහුගේ උපදෙස් හා පාලනය යටතේ ක්‍රියා කළ යුතුය.

(2) ගිණුම් විගණනය කිරීමේ කාර්යයන් සඳහා ඔහු විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයන් විගණකාධිපති වෙත අධිකාරියේ අරමුදල්වලින් ගෙවිය යුතුවේ. අධිකාරියෙන් විගණකාධිපතිවරයාට ලැබෙන යම් පාරිශ්‍රමිකයක් සේවයේ යොදවාගත් සුදුසුකම්ලත් විගණකයෙකු වෙත කල ගෙවීම් අඩුකිරීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

(3) විගණකාධිපතිවරයාට සහ ගිණුම් විගණනය කිරීමේදී ඔහුට සහය වන යම් පුද්ගලයකුට විගණකාධිපතිවරයා විගණන කාර්යයේ දී අවශ්‍යයයි සලකන සියළු පොත්පත්, ඔප්පු, ගිවිසුම්, ගිණුම්, වවුචර් සහ ගිණුමට සම්බන්ධතාවයක් ඇති අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීමේ අවසරය තිබිය යුතු අතර, එම කාර්ය සඳහා අවශ්‍යයයි තමන්ගේ දැනුම අනුව සැපයිය හැකි තොරතුරු අධිකාරිය හෝ එහි නිලධාරීන් විසින් ඔවුනට සැපයිය යුතුය.

(4). මෙම වගන්තියේ කාර්යයන් සඳහා "සුදුසුකම් ලත් විගණක"යනු -

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ නැතහොත් නීතියෙන් පිළිගෙන ඇති කිසියම් ආයතනයක සාමාජිකයෙකු වන එම ආයතනය පාලක සභාව විසින් ගණකාධිකාරිවරයෙක් ලෙස කටයුතු කිරීම සඳහා නිකුත් කර ඇති සහතිකයක් ලබාගෙන ඇති පුද්ගලයින්;

(ආ) එක් එක් වාසික හවුල් කරුවාට, ගණකාධිකාරිවරයෙකු ලෙස කටයුතු කිරිම සඳහා එම ආයතනයේ කවුන්සලය මගින් නිකුත් කරන ලද සහතිකයක් සමඟ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් ආයතනයක සාමාජිකත්වය දරන හවුල් කරුවන්ගෙන් සමන්විත ගණකාධිකාරි සමාගමක්

අදහස් වේ.

**39**. (1) විගණකාධිපතිවරයා අධිකාරියේ ගිණුම් පරීක්ෂා කොට -

විගණකාධිපතිගේ වාර්තා

(අ) ඔහුට අවශ්‍යවූ සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් ලැබුණු හෝ නොලැබුණු බව සඳහන් කරමින් ;

(ආ) අධිකාරියේ කටයුතු සත්‍ය හා සාධාරණ ලෙස පෙන්නුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තා මැනවින් පිළියෙල කර තිබේද යන්න සඳහන් කරමින්;

(ඇ) ඔහුගේ මතය අනුව පළාත් සභාව විසින් අධිකාරියේ ගිණුම් හා කටයුතු පිළිබඳව කිසියම් පරීක්ෂණයක් කිරීම සඳහා උනන්දුවක් දැක්විය යුතුයයි අදහස් කරන ගිණුම්වලට අදාල කිසියම් කරුණක් වේනම්, ඒ ගැන අවධානය යොමු කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ හැකිය.

(2) විගණකාධිපතිවරයා සිය වාර්තාව විගණනය කරන ලද ගිණුම් සමග අධ්‍යක්ෂ ජනරාල්වරයාට යවනු ඇත.

**40**. එක් එක් වර්ෂයේදී ගිණුමේ වත්කම් හා බැරකම් පිළිබඳ විගණනය කළ ගිණුම් සහ විගණකාධිපති වාර්තාව තමා වෙත ලැබීමෙන් පසුව, සභාපතිවරයා විසින් එම වාර්තාවද, වත්කම් හා බැරකම් පිළිබඳ විගණනය කල ගිණුම් ද අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශයද සමග ප්‍රවාහන විෂය භාරව සිටින අමාත්‍යවරයා වෙත භාරකළ යුතු වන අතර, ඔහු විසින් ඒවායේ පිටපත් ඒවා අදාල ගිණුමේ මුදල් වර්ෂය අවසන්වී මාස දොළහක් ඇතුළත පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු වන්නේය.

විගණකාධිපති වාර්තා විගණනය කළ ගිණුම් අධිකාරියේ වාර්ෂික කටයුතුවල වාර්තාව ප්‍රවාහන අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය

## VI වන කොටස
## පොදු විධිවිධාන

**41**. (1) මෙම ප්‍රඥප්තියෙන් නියෝග පැනවීම සඳහා නියමිත යම් කරුණු සම්බන්ධයෙන් හෝ ඒ සම්බන්ධයෙන් නියෝග සෑදීම සඳහා මෙම ප්‍රඥප්තියේ බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

නියෝග

(2) විශේෂයෙන් හා පළවන උප වගන්තියෙන් පවරා ඇති බලතලවල පොදු බවට අගතියක් නොවන පරිදි ද අමාත්‍යවරයාට පහත සඳහන් සියළු කරුණු හෝ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකිය. -

(i) අවසර පත්‍රයක් ලබා ගැනීමේදී , අලුත් කිරීමේදී , මාරු කිරීමේදී හෝ සංශෝධනය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පාවිච්චි කළ යුතු ආකෘති පත්‍ර සහ ගෙවිය යුතු ගාස්තු;

(ii) අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කෙරන බස් රථවල ගෙන යායුතු පුවරු හා සලකුණු;

(iii) අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කෙරෙන බස් රථවල රියදුරන් හා කොන්දොස්තරවරුන් විසින් ගෙන යා යුතු ලියවිලි සහ ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර;

(iv) අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කෙරෙන බස් රථයක යම් පුද්ගලයකු විසින් රකගත යුතු පිළිගත් තත්ත්වයක් සහ එම පිළිගත් තත්ත්වයන් කඩ කෙරෙන ක්‍රියා නොකර හැරීම වැලැක්වීම;

(v) අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කෙරෙන බස් රථය ධාවනය කරනු ලබන ගමන්වාර සම්බන්ධයෙන් තැබිය යුතු වාර්තා;

(vi) අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කෙරෙන බස් රථවල අවසර පත්‍ර ධාරියා විසින් රියදුරුගේ සහ කොන්දොස්තරවරුන් වශයෙන් සේවයේ නියුක්ත කරනු ලබන්නා වූ පුද්ගලයන් සම්බන්ධයෙන් එම පුද්ගලයන් සේවය ආරම්භ කරන හා අවසන් කරන වේලාවන් සහ ඔවුන් ලබාගන්නා විවේක කාලයක් සම්බන්ධයෙන් අවසර පත්‍ර ධාරියා විසින් තබා ගත යුතු වාර්තා;

(vii) මෙම ප්‍රඥප්තිය යටතේ තබා ගනු ලබන වාර්තාව සුරක්ෂිතව තබා ගැනීම, අධිකාරිය විසින් පත්කරනු ලබන යම් නිලධාරියකු විසින් එම වාර්තා පරීක්ෂා කිරීම හා එම නිලධාරියා විසින් ඉල්ලා සිටින විටක එසේ පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා එම වාර්තා ඉදිරිපත් කිරීම;

(viii) මගී ප්‍රවාහන සේවාව පිළිබඳ උනන්දුවක් දක්වන අවසර පත්‍රලාභීන්ගේ හෝ මගීන්ගේ යම් සංගමයක, සමිතියක, හෝ ඒකාබද්ධ සංවිධානයක කාර්යයන් පවත්වාගෙන යෑමට ක්‍රියා පටිපාටියක් සහ කාර්යයන් ඉටු කිරිම සඳහා ඔවුනට ක්‍රියා පටිපාටියක්;

(ix) එම සංගම්, සමිති හෝ මගින් අවසර පත් ලාභීන් සමඟ අදහස් හුවමාරු කර ගැනීම;

(x) විශේෂයෙන් එහි සම්බන්ධීකරණ හා බස් ධාවනය සඳහා කාලසටහන් සකස් කිරීම, කාලසටහන් ක්‍රියාත්මක කිරීම හා විධිමත් හා සාධාරණ ලෙස පහසුකම් ප්‍රයෝජනයට ගැනීම සඳහා බස්ගාල් හා බස් නැවතුම් පොලවල් සංවිධානය කිරීම හා කළමනාකරණය;

(xi) අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කෙරෙන බස්රථවල සේවය කරන රියදුරන් හා කොන්දොස්තරවරුන්ගේ සුදුසුකම් නිර්ණය කිරීම හා ශාරීරික යෝග්‍යතාව පිළිබඳ කලින් කලට පරීක්ෂා කිරීම;

(xii) යම් ප්‍රදේශයක හෝ පළාතේ මාර්ගයක හෝ මගී ප්‍රවාහන සේවයේ බරපතල බිඳ වැටීමක් වහා සිදුවිය හැකි බව පෙනී යන අවස්ථාවක හෝ හදිසි හෝ තීරණාත්මක අවස්ථාවකදී අවශ්‍ය පියවර ගැනීම;

(xiii) උපදේශක මණ්ඩල හෝ කමිටු පිහිටුවීම නැතහොත් ඒවාට සාමාජිකයන් පත්කිරීම හා පළාත තුළ මගී ප්‍රවාහන සේවාවන්හි කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා ඒවායේ කටයුතු විධිමත් කිරීම සඳහා තමා වෙත උපදෙස් ලබාදීමේ කාර්යයන් සඳහාද අලුතින් සේවා අරම්භ කිරීම, බස්ගාස්තු මගීන්ගෙන් හා අවසරපත්ලාභීන්ගෙන් අය කෙරෙන ගමන් ගාස්තු, සේවා ගාස්තු හා අයකිරීම් නියම කිරීම එක් එක් මාර්ගයේ ධාවනය කෙරෙන බස් රථ සංඛ්‍යාව නියම කිරීම, අවසරපත් ලාභීන්ට සේවාවන් පවත්වා ගෙන යාමේදී සාධාරණ හා ආර්ථික වශයෙන් ඒවා පවත්වාගෙන යාහැකි තත්ත්වයකට සකස් කිරීම හා වෙනත් අදාල කරුණු සම්බන්ධ කාර්යයන් සඳහා ඔවුනට බලතල හා කාර්යභාරයන් සැලැස්වීම;

(xiv) අවශ්‍ය අවස්ථාවලදී අන්තර් පළාත් අවසර පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටි සකස් කිරීම;

(xv) විශේෂයෙන් පහත සඳහන් යම් කරුණක් සියළු කරුණු සම්බන්ධයෙන් මගීන්ගේ ආරක්ෂාව, පහසුව හා සැප පහසුව සහතික කිරීම සඳහා නියෝග ක්‍රමවත්ව සංශෝධිත කිරීම් සහ බලාත්මක කිරීම.

**42**. යම් පුද්ගලයකු මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධානයන් ඒ යටතේ නිකුත් කළ හෝ දෙන ලද රෙගුලාසීන්, නියෝගයන්, නියමයන්, අවශ්‍යතාවයක් උල්ලංඝනය කරන්නේ නම් හෝ ඊට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් හෝ එහි අඩංගු වැදගත් තොරතුරු තමාගේ දැනුම අනුව සාවද්‍ය හෝ වැරදි යම් වාර්තාවක්, තොරතුරු හෝ කරුණු පැහැදිලි කිරීමක් එය ලිඛිත හෝ වෙනත් අකාරයකින් වූයේ වුවද ඉදිරිපත් කරන්නේ නම් ඔහු මහේස්ත්‍රාත්වරයක් ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වැරදිකරු කරනු ලැබුවහොත් ඔහු රුපියල් එක්දහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ සුළු වැඩ සහිත අවුරුද්දකට වැඩි නොවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ දඩය හා සිර දඬුවම යන දෙකටම යටත්වේ.

වරදවල් හා දඬුවම්

**43**. (1) ටිකට්පත් නිකුත් කිරීම පැහැර හරින ලද කොන්දොස්තරවරයකු වරදකට වරදකරු වන අතර , මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කළ විට රු.1,500කට නොවැඩි දඩයකට යටත්වේ.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක බලය යටතේ ධාවනය කෙරෙන බස් රථයක ගමන් කරන මගියකු -

(අ) ඔහු කොන්දොස්තරවරයාගෙන් ගමන් සඳහා ටිකට් පත්‍රයක් මිලදී ගැනීම පැහැර හරින්නේ නම් හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඔහු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ඊට වරදකරු කළහොත් රු.500කට වැඩි නොවන දඩයකට යටත් වන්නේය;

(ආ) ඒ ගමන සඳහා තමා වෙත නිකුත් කරන ලද ටිකට් පත්‍රය ගමන් අවසන් වන තෙක් දිගටම තබා නොගන්නා අයකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව රු.100කට නොවැඩි දඩයකට යටත් වන්නේය;

(ඇ) බස් රථයේ කොන්දොස්තරවරයා හෝ ඒ සඳහා බලය ලබා ඇති අධිකාරියේ පුද්ගලයකු හෝ පොලිස් නිලධාරියකු විසින් ටිකට් පත්‍රය පෙන්වන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක දී එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කළහොත් වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් ඔහු වරදකරු කළ විට රු. 500 නොඉක්මවන දඩයකට යටත් වේ.

(3) එහෙත් යම් මගියකු මුදල් ලබා ගැනීමට පළාත් අධිකාරියෙන් බලය පවරන ලද පළාත් අධිකාරියේ නිලධාරියකු වෙත රු. 100 ක අධිභාර මුදලක් එම ගමන සඳහා ඔහු විසින් ගෙවිය යුතු ගමන් ගාස්තුව මෙන් දෙගුණයක් සමග ගෙවීමට එකඟවන්නේ නම් එවැනි මගියකුට විරුද්ධව 43.2 (අ) වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් හෝ පවත්වා ගෙන යෑමක් නොකළ යුතුය.

(4) එහෙත් යම් මගියකු මුදල් ලබා ගැනීමට පළාත් අධිකාරියේ බලය පවරන ලද පළාත් අධිකාරියේ නිලධාරියකු වෙත රු. 25ක අධිභාර මුදලක් එම ගමන සඳහා ඔහු විසින් ගෙවිය යුතු ගමන් ගාස්තුව මෙන් දෙගුණයක් සමග ගෙවීමට එකඟ වන්නේ නම් එවැනි මගියකුට විරුද්ධව 43 (2) (ආ) වගන්තිය යටතේ ඔහුට වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් හෝ පවත්වා ගෙන යාමක් නොකළ යුතුය.

**44**. මෙම ප්‍රඥප්තිය යටතේ වූ වරදක් කරන ලද්දේ පුද්ගල මණ්ඩලයක් විසින් වන අවස්ථාවක -

පුද්ගල මණ්ඩල විසින් කරන වැරදි සම්බන්ධයෙන් ඇතැම් පුද්ගලයින්ගේ වගකීම

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් වරද සිදුකරන අවස්ථාවේ එම සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු සාමාන්‍යාධිකාරී ලේකම් හෝ එවැනි වෙනත් ඊට සමාන නිලධාරියෙකු වශයෙන් සිටි සෑම තැනැත්තෙකුටම; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් වරද සිදුකරනු ලැබූ වේලාවේදී ව්‍යාපාරික ආයතනයේ හවුල් කරුවෙකුව සිටි සෑම තැනැත්තෙකුම

වරද සිදුකරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අප සහයකත්වය නොමැතිව බව සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සහ සියළු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නිසි සියලු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඔහු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කළා වන්නේය.

**45**. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට ආසන්නතම කලින් දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් සභාවේ1992 අංක 1 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය මෙමගින් අවලංගු කෙරේ.

අවලංගු කිරිම

(2) (1) වන උප වගන්තියේ විධිවිධාන වල එසේ සඳහන් වුවද, 1992 අංක1 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝග මගින් අලුතින් හඳුන්වා දෙන තුරු හෝ ඒවා අහෝසි කෙරෙන තුරු මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝග වශයෙන් සැලකිය යුතුවේ

(3) 1992 අංක 1 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද ඕනෑම මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක් එහි වලංගු කාලය තුළදී මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කළ අවසර පත්‍රයක් ලෙස සැළකිය යුතුවේ.

(4) 1992 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ පවරන ලද ඕනෑම නඩුවක් ද, එවැනි යම් නඩුවක දෙන ලද නියෝගයක් හෝ තීන්දුවක් ද මෙම ප්‍රඥප්තිය යටතේ අයැදීම් කරන ලද නඩුවක මෙම ප්‍රඥප්තිය යටතේ දෙන ලද නියෝගයක් හෝ තීන්දුවක් ලෙස සැලකිය යුතුය.

**46**. (1) (අ) අධිකාරිය විසින් මේ ප්‍රඥප්තිය යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කිරිමට අදහස් කරන ලදැයි කියනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව; නැතහොත්

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව

(ආ) අධිකාරියේ යම් සාමාජිකයෙක්, නිලධාරියෙකු හෝ සේවකයකු විසින් මෙම ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධාන පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කිරිමට අදහස් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිඳු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

(2) 1 වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ අධිකාරියේ විධානයකින් පිට හෝ කරනු ලබන හෝ කිරීමට අදහස් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී, ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව කරනු ලැබුවේ හෝ කිරීමට අදහස් කරන ලදැයි කියනු ලබන්නේ සද්භාවයෙන් බව අධිකරණය තීරණය කරන්නේ නම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

**47**. මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන් 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතට යටත්විය යුතු අතර, ඒ අනුව මෙම ප්‍රඥප්තියේ කොයි යම් හෝ ස්ථානයක විධිවිධානයන් එම පනතේ විධිවිධානයන් හා අනුකූල නොවන්නේ නම් පසු කී පනතේ විධිවිධානයන් බලපැවැත්විය යුතු වන්නේය.

මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතට යටත් විය යුතුබව

**48**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි - "පළාත් පාලන ආයතන" යනු යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එයට එවැනි නගර සභා හෝ ප්‍රාදේශීය සභා විසින් යොදනු ලබන ඉටු කරන හා ක්‍රියාවට නංවන බලතල හා කාර්යයන්ද, වගකීම්ද, ඉටු කිරිම සඳහා යම් නීතියක් යටතේ නිර්මාණය කෙරෙන හා පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ද ඇතුළත් වේ;

"ද්විත්ව කාර්ය වාහනය" යන්නෙන් මගීන් හා භාණ්ඩ යන දෙවර්ගයම ගෙන යාම සඳහා සැලසුම් කරන ලද වාහනයක් අදහස් වේ;

"අමාත්‍යවරයා"යනු දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රවාහන පිලිබඳ විෂය භාර අමාත්‍යවරයාය;

"ඔම්නි බස් රථය"යන්නෙන් මොටර් රථ වාහන පනත යටතේ ඔම්නි බස් රථයක් වශයෙන් ලියාපදිංචි කරන ලද මොටර් කෝච් රථයක් අදහස් වන අතර, ඊට ද්විත්ව කාර්ය වාහනයක් ද, ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතුය.

"මගියා යනු" කුලී රථයක හෝ බස් රථයක ප්‍රවාහනය කෙරෙන එහෙත් රියදුරු හා බස් රථයක නම් කොන්දොස්තරවරයා ඇතුළත් නොවන පුද්ගලයෙකි;

"නියමිත" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝග වලින් නියම කරන ලද යන්න අදහස් වේ;

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ දකුනු පළාත අදහස් වේ;

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ;

" පළාත් සභාව" යන්නෙන් දකුණු පළාත් සභාව අදහස් කෙරේ;

"පළාත් අරමුදල" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තිය යටතේ ඇති කරන ලද, දකුණු පළාත් අරමුදල අදහස් වේ.

"වෙන් වෙන් ගාස්තුව" යන්නෙන් බස් රථයක මගියෙකු වශයෙන් ගෙන යනු ලැබීමට යම් තැනැත්තෙකුට හිමිකම් ලබාදෙන ඒ තැනැත්තා විසින් කරනු ලබන ගෙවීම අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**49**. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 21. දකුණු පළාත් සභාවේ 1998 වර්ෂයේ අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය.

දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවක් ඇති කිරීම සඳහා ද,

දකුණු පළාත් සමුපකාර සේවකයින් සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ වූ හා ආනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියයි.

**01.** මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ දකුණු පළාත් සභාවේ 1990 වර්ෂයේ අංක 01 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්විය හැකි අතර, දකුණු පළාත් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු එදින සිට වලංගු වේ.

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

(මින් පසු පත් කරනු ලැබූ දිනය යනුවෙන් මෙය හැඳින්වේ).

**02.** අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාවකින්:

සමුපකාර සමිති මේ ප්‍රඥප්තියේ මතුවට එන විධිවිධානවලින් නිදහස් කිරීම පිළිබඳ අමාත්‍යවරයා සතු බලතල

(අ) එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් සමුපකාර සමිති පන්තියක් හෝ,

(ආ) එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු නම් සමුපකාර සමිතියක්,

මේ ප්‍රඥප්තියේ මතුවට එන විධිවිධානවලින් නිදහස් කළ හැකි අතර, ඒ අනුව "සමුපකාර සමිතිය" යන යෙදුම ඒ විධිවිධානවල යෙදෙන කවර ස්ථානයක වුවද, එවැනි ආඥාවක් තත් කාලයෙහි වලංගුව බල නොපවත්නා සමුපකාර සමිතිය බව එයින් අදහස් වන ලෙස කියවා තේරුම් ගත යුතුය.

### 1 වැනි කොටස
### දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම, එහි බලතල හා කාර්යයන්.

**03.** මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා "දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන හා හැඳින්වෙන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතුය.

සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම.

**04**. (1) මේ වගන්තියේ මතුවට එන විධිවිධාන අනුව කොමිෂන් සභාව සංයුක්ත විය යුතුය. — කොමිෂන් සභාවේ සංයුතිය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් තුන් දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතුය.

(3) යම් තැනැත්තෙකු:-

(අ) සමුපකාර සමිතියක සේවකයෙකු හෝ හිටපු සේවකයෙකු නම් හෝ,

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව සමුපකාර සමිති විසින් සේවයෙහි යොදවා ගනු ලබන යම් වර්ගයකට අයත් තැනැත්තන්ගේ වැටුප්, වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීම අරමුණු වශයෙන් ඇති හෝ අරමුණුවලින් එකක්ව ඇති යම් කාර්ය මාණ්ඩලික සංගමයක හෝ වෘත්තීය සමිතියක සාමාජිකයෙකුව සිටින තැනැත්තෙකු නම් හෝ,

(ඇ) සමුපකාර සමිති පිළිබඳ නීතිය අනුව සමුපකාර සමිතියක නිලධරයෙකුව සිටින තැනැත්තෙකු නම් හෝ,

(ඈ) තත්කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකුව සිටින තැනැත්තෙක් නම් හෝ එම තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීම නුසුදුසු විය යුතුය.

**05**. කොමිෂන් සභාව අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත කරන ලද මණ්ඩලයක් විය යුතු අතර, එහි නීතිගත තත්ත්වයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි විය යුතුය. — කොමිෂන් සභාව නීතිගත කිරීම.

කොමිෂන් සභාවේ එක් එක් සාමාජිකයා නව පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් ධූරය දැරිය යුතුය. — සාමාජිකයන්ගේ ධූර කාලය

එසේ වුවද, එවැනි පත්වීමක් ධූර කාලය ගැන නොතකා-

(අ) එකී සාමාජිකයෙකු විසින් යම් අවස්ථාවක තම ධූරයෙන් ඉල්ලා අස් වීමට හෝ අමාත්‍යවරයා විසින් ඔහු ධූරයෙන් ඉවත් කිරීම හෝ කළ හැකිය. තවද,

(ආ) එකී යම් සාමාජිකයෙකු 4 (3) වැනි වගන්තිය අනුව නුසුදුසු වීමෙන් පසු ඒ හේතුවෙන්ම සිය ධූරය හිස් කළ යුතුය. එසේම තවදුරටත්, එකී යම් සාමාජිකයෙකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ, ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ධූරය හිස් කිරීමෙන් ඇතිවන යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තෙකු ධූරය කලින් හිස් කරන්නේ නම්, මිස ඔහු පත් කරනු ලැබුවේ යම් සාමාජිකයෙකු වෙනුවටද, ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කොටසට සමානමුත්, ඊට වැඩි කාලයක් ඔහු විසින් ඒ ධූරය නොදැරිය යුතුය.

කොමිසමේ සභාපති හා කටයුතු කරගෙන යාම

**07**. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් කෙනෙකු එහි සභාපති වශයෙන්ද, තවත් අයෙකු උප සභාපති වශයෙන්ද පත්කළ යුතුය. සභාපති පැමිණ සිටින කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්ලදී ඔහු විසින් මූලාසනය දැරිය යුතුය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපති පැමිණ නොමැති විට, උප සභාපති විසින් එහි මූලාසනය දැරිය යුතුය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමකට සණපූරණය සාමාජිකයන් දෙදෙනෙකු විය යුතුය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සාමාජිකයින් දෙදෙනෙකු පමණක් පැමිණ සිටියහොත්, හා යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කළ යුතු තීරණය පිළිබඳව එම සාමාජිකයින් අතර, මතය වෙනස් වුවහොත්, ඒ ප්‍රශ්නය කොමිෂන් සභාවේ සාමාජිකයින් තුන් දෙනාම පැමිණ සිටින රැස්වීමක් වෙත යොමු කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනාම පැමිණ සිටින යම් රැස්වීමකදී යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දිය යුතු තීරණය පිළිබඳව කොමිෂන් සභාවේ සාමාජිකයින් අතර, මතය වෙනස් වුවහොත්, ඒ ප්‍රශ්නය පැමිණ සිටින සාමාජිකයින් වැඩිදෙනාගේ මතය අනුව තීරණය කළ යුතුය. එහෙත් සාමාජිකයින් සමානව බෙදුනහොත්, සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතුය.

(5) මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය පරිපාටිය විධිමත් කළ හැකිය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයින් අතර, පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයන්ගෙන් යමෙකු පත් කිරීමේ යම් දොසක් තිබීමේ හේතුවෙන් පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් අවලංගු නොවිය යුතුය.

**08**. කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයින්ට පළාතේ මුල්‍යය විෂය භාර පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් හා දීමනා ගෙවිය යුතුය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**09**. (1) කොමිෂන් සභාවේ ලේකම්වරයෙකු සිටිය යුතු අතර, ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු විය යුතුය. ලේකම් සහ සෙසු නිලධාරීන්

(2) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයින් පළාත් රාජ්‍ය සේවයෙන් පත් කරනු ලැබිය යුතුය.

**10**. (1) කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේදී මේ ප්‍රඥප්තියේ උප ලේඛනයෙහි දැක්වෙන ආකෘතියෙහි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දිය යුතුය. කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධරයන් විසින් දිවුරුම් දීම.

(2) කොමිෂන් සභාවේ ලේකම් විසින් හා දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දිය යුතු යැයි කොමිෂන් සභාවේ සභාපති විසින් නියම කළ හැකි කොමිෂන් සභාවේ සෙසු නිලධරයන් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේදී මේ ප්‍රඥප්තියේ උප ලේඛනයෙහි දැක්වෙන ආකෘතියෙහි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දිය යුතුය.

**11**. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතුයි.

(අ) සමුපකාර සමිතිවල සේවකයින් බඳවා ගැනීම් ක්‍රමවලට අදාල සියලු කරුණු හා ඔවුන්ගේ සේවා කොන්දේසි ද පත්කිරීම් කිරීමේදී හා සමුපකාර සමිතියක එක් තනතුරකින් ඒ සමිතියේම තවත් තනතුරකට උසස් කිරීමේදී, ඒ සමිති විසින් අනුගමනය කලයුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම.

(ආ) සමුපකාර සමිතිවල සේවකයින් වශයෙන් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම හෝ ඒ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා පරීක්ෂක මණ්ඩල පත්කිරීම් හා විභාගවලට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය කිරීම.

(ඇ) පළාත් කොමසාරිස්වරයා විමසා එවැනි යම් තනතුරකට පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම, යම් පන්තියක හෝ වර්ගයක එවැනි යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රමය නියම කිරීම, ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම හෝ සකස් කිරීම හා සමුපකාර සේවකයින්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි නිශ්චය කිරීමේදී කොමිෂන් සභාවට සහාය වීම පිණිස කොමිෂන් සභාව විසින් අවශ්‍යයැයි සැළකිය හැකි උපදේශක කාර්යය සංවිධානය පිහිටුවීම.

(ඈ) යම් පන්තියක හෝ වර්ගයක යම් තනතුරක් හෝ තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් නියම කරන ලද වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙස සමුපකාර සමිතිවලට නියම කිරීම.

(ඉ) තම සේවකයින්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ අයිතිවාසිකම් ක්‍රියාවෙහි යෙදවීමෙහිලා යම් සමුපකාර සමිතියක් විසින් අනුගමනය කළයුතු කාර්ය පරිපාටි හෝ කාර්ය පරිපාටි නිශ්චය කිරීම. සේවකයින්ට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ ආරම්භ කරන ලෙස සහ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාලයක් ඇතුලතදී අවසාන කරන ලෙස යම් සමුපකාර සමිතියකට නියම කිරීම හා සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූ විනයානුකූල නියෝගයකට විරුද්ධව පැන නැඟෙන අභියාචනා විභාග කිරීම.

(ඊ) යම් සමුපකාර සමිතියක සේවකයින්ට අදාල නියමිත සටහන් තබන ලෙස ඒ සමිතියට නියම කිරීම.

(උ) යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපිගොනු, වෙනත් ලේඛන හෝ තොරතුරු නිශ්චිතව නියමිත දිනයකට පෙර සපයන ලෙසත්, ඒ සමිතියට නියම කිරීම.

(ඌ) කොමිෂන් සභාව විසින් යොමුකරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පිණිස නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත මූල මණ්ඩලයක් හෝ මූල මණ්ඩල පත් කිරීම.

(එ) යම් සමුපකාර සමිතියක සේවකයෙකුගේ ක්‍රියාකලාපය පරීක්ෂණයකට විෂය වී තිබී ඒ සේවකයා විසින් සමිතියේ තීරණයකට විරුද්ධව කොමිෂන් සභාව වෙත අභියාචනා කර ඇති අවස්ථාවක ඔහු නැවත සේවයට ගැනීම පිළිබඳව උපදෙස් ඇතුළුව ඒ සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි උපදෙස් ක්‍රියාත්මක කරන ලෙසට ඒ සමුපකාර සමිතියට නියම කිරීම.

(ඒ) සේවකයන්ගේ සේවය අවසන් වීමේදී පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ට ප්‍රදානය කළ හැක්කේ යම් සාමාන්‍ය ප්‍රතිපත්ති අනුවද ඒ ප්‍රතිපත්ති නියම කිරීම.

(ඔ) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් යම් සමුපකාර සමිතියක් හෝ යම් පන්තියක සමුපකාර සමිති නිදහස් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස්ගෙන් විමසා අමාත්‍යවරයාට උපදෙස් දීම හා,

(ඕ) පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අමාත්‍යවරයා විසින් පනවනු ලැබූ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි සමුපකාර සමිතිවලට හා ඒවායේ සේවකයින්ට අදාළ වෙනත් බලතල ක්‍රියාවෙහි යෙදවීම.

(ක) මෙම ප්‍රඥප්තියේ 22 (1) වගන්තිය යටතේ ඒ සමුපකාර සමිතිය සේවකයෙකුගේ ස්ථාන මාරු කිරීමකට විරුද්ධව කොමිෂන් සභාව වෙත කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් විභාග කිරීමෙන් පසු කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි උපදෙස් ක්‍රියාත්මක කරන ලෙස අදාළ සමිතියට නියම කිරීම.

(2) 1 වැනි වගන්තියෙන් කොමිෂන් සභාව වෙත පැවරුණු බලතල ක්‍රියාවෙහි යෙදවීමේදී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ හෝ නිශ්වය කිරීම්, වෙනස් කිරීම්, අමුතු කිරීම් හෝ ප්‍රතිශෝධනය කිරීම හෝ ඉවත දැමීම කොමිෂන් සභාව විසින් කළ හැකිය.

**12**. කොමිෂන් සභාවේ වියදම් දකුණු පළාත් සභාවේ වාර්ෂික මුදල් ප්‍රකාශනයෙන් ඒ සඳහා ප්‍රතිපාදනය කරනු ලබන මුදල්වලින් ගෙවිය යුතුය. මුදල් විධිවිධාන

## II කොටස.
## සමුපකාර සමිති සහ ඒවායේ සේවකයෝ.

**13**. යම් සේවකයෙකුගේ වැටුප හා පඩිනඩි සමිතියේ මුදල්වලින් තත්කාලයෙහි ගෙවන සමුපකාර සමිතියක්, ඒ සේවකයාගේ සේවා යෝජකයා ලෙස සළකනු ලැබිය යුතුය.

සමුපකාර සමිතියක් සේවා යෝජකයෙකු විය යුතු බව

**14**. සමුපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයෙකු වුවද, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි විධානවලට යටත් විය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා බලතල ඉටු කිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමෙහිලා කෙරෙන කොමිෂන් සභාවේ සියලු තීරණ 11(2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතුවාක් හැර අමාත්‍යවරයා විසින් 2 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් නිදහස් නොකරන ලද සියලු සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ විධාන පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

සමුපකාර සමිති සහ ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ විධිවිධානවලට යටත් විය යුතු බව

**15**. යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියලු විධාන 11(2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතු අතර, ඒ විධාන ඒ සමිතිය විසින් කරන ලද්දක් මෙන් ඒ සේවකයා ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

සමුපකාර සමිතිවල සේවකයින් කොමිෂන් සභාවේ විධානවලින් බැඳුනු බව

**16**. කොමිෂන් සභාව විසින් අන්‍ය නියමයක් කළහොත් මිස දකුණු පළාතේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් 1991 මැයි මස 01 වනි දින ස්ථාපිත කරන ලද දකුණු පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සමුපකාර සමිති සහ ඒවායේ සේවකයන් සම්බන්ධයෙන් නිකුත් කරන ලද නියමයන් සහ නියෝගයන් ඇතුලුව,

මේ ප්‍රඥප්තිය නිසා ඇතිවන වෙනස්කම්

(අ) නිශ්චය කරන ලද වැටුප් ක්‍රම හා සේවා කොන්දේසි ඇතුලු සියලු වර්ග කිරීම්.

(ආ) සමුපකාර සමිතිවල කාර්යයන් ඉටු කිරීමෙහි ලා නිකුත් කරන ලද සියලුම ආකාරයෙන් විධිවිධානයන්

(ඇ) භාරගන්නා ලද සියලුම ආකාරයේ අභියාචනයන්, විභාග කිරීමට ආරම්භ කරන ලද හා විභාග නිමාකොට නියෝග නිකුත් කිරීමට අදාළ සියලුම අභියාචනයන්.

(ඇ) ආරම්භ කරන ලද සියලුම ආකාරයේ නීති කෘත්‍යයන්.

(ඉ) පනවන ලද සියලු රෙගුලාසි සහ නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන, සහ

(ඊ) කරන ලද සියලුම පත්කිරීම් හා උසස් කිරීම්.

මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරන ලද දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබූ පරිද්දෙන් වලංගුව බල පැවැත්විය යුතුය.

සිටින නිලධාරීන්ගේ සේවා යෝග්‍යතා පරීක්ෂා කිරීම සහ අලුත් සේවා කොන්දේසි නියම කිරීම.

**17**. (1) සේවකයෙකු දරන තනතුර දැරීමට ඔහුගේ සාර්ථකභාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් පරීක්ෂණයකින් හෝ අන් ආකාරයකින් කොමිෂන් සභාව සෑහීමකට පත් කරන ලෙස කොමිෂන් සභාව විසින් එහි පරම අභිමතය අනුව යම් සේවකයෙකුට නියම කළ හැකිය.

එසේ වුවද, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් වර්ගයක හෝ වර්ගවල සේවකයින්ට පමණක් මෙම උප වගන්තියෙහි ඉහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතුය.

(2) 1 වන උප වගන්තිය අදාළ වන තනතුරක් දරන තැනැත්තා ඒ තනතුර දැරීමට තමාගේ පරමාර්ථභාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් කොමිෂන් සභාව සෑහීමකට පත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක කොමිෂන් සභාවේ මතය අනුව ඔහුගේ හැකියාවට ගැලපෙන තනතුරක ඔහුගේ කැමැත්ත අනුව ඔහු යෙදීමට කොමිෂන් සභාව උත්සාහ කළ යුතු අතර, ඒ ප්‍රතියෝජනය සිදු නොකෙරුනහොත්, එකල ඔහුට අදාළ වූ සේවා නියමයන් හා කොන්දේසි අනුව හෝ එවැනි නියමයන් නොපවත්නා අවස්ථාවක යුක්ති සහගත කල් දීමක් කිරීමෙන් පසු ඔහු සේවයේ යෙදී සිටි සමුපකාර සමිතිය විසින් ඔහුගේ සේවය අවසන් කරන ලෙස කොමිෂන් සභාව විසින් එහි පරම අභිමතය පරිදි නියම කළ හැකිය.

(3) (1) වැනි උප වගන්තිය අදාළ වන තනතුරක් දරන තැනැත්තා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගැනීමට තෝරා ගන්නා අවස්ථාවක (1) වැනි උප වගන්තියේ විධිවිධාන අනුව ඔහු විසින් කොමිෂන් සභාව

සෑහීමකට පත් කරතහොත්, මිස හා එසේ කරන තුරු ඒ සේවා නියමයන්ට හා කොන්දේසිවලට ඔහුට හිමිකම් නොතිබිය යුතුය.

පදිංචිය පිළිබඳ සුදුසුකම්.

**18**. (1) දකුණු පළාත තුළ යම් දිස්ත්‍රික්කයක සමුපකාර සමිතියක යම් තනතුරකට යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක් වත් ඒ දිස්ත්‍රික්කය ඇතුලත පදිංචිව නොසිටි කිසිම තැනැත්තෙකු පත් නොකල යුතුය.

(2) එසේ වුවද, කොමිෂන් සභාවේ මතය අනුව යම් දිස්ත්‍රික්කයක යම් සමුපකාර සමිතියක යම් තනතුරක් සඳහා සුදුසු අපේක්ෂකයන් එම දිස්ත්‍රික්කය තුළ නොමැති අවස්ථාවක පළාත තුළ පිහිටි අනෙකුත් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගෙන් සුදුසු පුද්ගලයෙක් එම තනතුර පිරවීම සඳහා පත් කිරීමට එම සමිතියට අවසර දීමට කොමිෂන් සභාවට හැකිය.

සමුපකාර සමිතියක වර්ගය හා සේවකයින්ගේ ශ්‍රේණිය හෝ පංතිය අනුව සේවකයින්ගේ වැටුප් ක්‍රම නිශ්වය කළ යුතු බව

**19**. සමුපකාර සමිතියක තනතුරකට පත්කරනු ලැබූ යම් තැනැත්තෙකුට ඒ සමිතියේ වර්ගය අනුව සහ (29) (1) වැනි වගන්තිය යටතේ නිශ්වය කරන සේවකයින්ගේ ශ්‍රේණිය හෝ පංතිය අනුව ඒ තනතුරට අදාළ වැටුප් ක්‍රමය දිය යුතුය.

පළාත් රාජ්‍ය සේවයේ පුද්ගලයින් ද්විතියනය කිරීම

**20**. මෙම ප්‍රඥප්තියේ වෙනයම් විධිවිධානයක් නොතකා අමාත්‍යවරයාගේ අනුමැතිය සහ අදාළ තැනැත්තාගේ හා සමුපකාර සමිතියේ කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියද ඇතිව කොමිෂන් සභාව විසින් අනුමත කළ හැකි කාලයක් සඳහා හා නියමයන් හා කොන්දේසිවලට යටත්ව සමුපකාර සමිතියකට තනතුරකට ඒ කාර්යය සඳහා එම සමිතියේ යම් සේවයකට ද්විතියනය කරන ලද පළාත් රාජ්‍ය සේවයේ යම් තැනැත්තෙකු කොමිෂන් සභාව විසින් පත් කළ හැකිය.

මේ වගන්තියේ කාර්යයන් සඳහා අමාත්‍යවරයා යන්නෙන් ඒ තැනැත්තා සේවයේ යොදවනු ලැබ සිටින ආයතනය භාර පළාත් සභාවේ අමාත්‍යවරයා අදහස් වේ

සමුපකාර සමිතිවල සේවකයින්ගේ වැටුප්

**21**. සෑම සමුපකාර සමිතියක් විසින් එහි මුදල්වලින් එම සමිතියේ සේවකයින්ගේ වැටුප්ද, වෙනත් දීමනා කිසිවක් වෙතොත්, ඒ දීමනාද, ගෙවිය යුතුය.

**22**. (1) සමුපකාර සමිතියකට එම සමිතියේ යම් සේවකයෙකු ඒ සමිතියේ එක් සේවා ස්ථානයකින් එහි අන් කිසි සේවා ස්ථානයකට මාරු කිරීමේදී බලය තිබිය යුතු අතර, විනය හේතු නොවන යම් හේතුවක් නිසා, මාරු කිරීම් කරනු ලබන අවස්ථාවක ඒ මාරු කිරීම් ඒ සේවකයාගේ පඩිනඩි කෙරෙහි හානිකරව බල නොපෑ යුතුය.

සමුපකාර සමිතිවල සේවකයින් මාරු කිරීම.

(2) ඒ ඒ සේවා යෝජකයාගේ එකඟත්වය කලින් ලබාගෙන ඇතොත්, සමාන තත්ත්වයේ තනතුරු දරන සේවකයින් දෙදෙනෙකුගේ ඒකාබද්ධ ඉල්ලීම පිට එක් සමුපකාර සමිතියක යම් සේවකයෙකු වෙනත් සමුපකාර සමිතියක සේවකයෙකු වශයෙන් පසුව කී සමුපකාර සමිතියට මාරු කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුතුය.

**23**. (1) මේ ප්‍රඥප්තියේ හෝ එය යටතේ පනවනු ලැබූ නියෝග කිසිවක විධිවිධාන අනුව හැර යම් සමුපකාර සමිතියක් විසින් ඒ සමුපකාර සමිතියේ කිසිම සේවකයෙකු පහ කිරීම හෝ අන් ආකාරයකින් ඔහුට දඬුවම් කිරීම නොකළ යුතුය.

සමුපකාර සමිතිවල සේවකයින් සේවයෙන් පහ කිරීම හා දඬුවම් කිරීම

(2) මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන කිසිවකින් මෙම කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමේ දිනයට පෙර සිදුවූ හෝ උද්ගත වූ යම් විෂමාචාරයක් හෝ විනය කඩ කිරීමක් හෝ වෙනත් පැමිණිලි නිමිත්තක් හෝ සම්බන්ධයෙන් යම් සමුපකාර සමිතියක් සේවකයින්ගෙන් යම් කිසිවෙකුට විරුද්ධව පෙර පැවති විධිවිධාන අනුව ඒ සමුපකාර සමිතිය විසින් දැනටමත් ආරම්භ කර ඇති විනය කෘත්‍ය එම විධිවිධාන අනුවම පවත්වාගෙන යාම හා අවසන් කිරීම අනීතික කෙරේ යැයි සළකනු නොලැබිය යුතුය.

**24**. (1) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වැඩි මුදලක් ඇප වශයෙන් තබන ලෙස සමුපකාර සමිතියක් විසින් යම් සේවකයෙකුට නියම නොකල යුතුය

සමුපකාර සමිති සේවකයින් තබන ඇප

(2) සමුපකාර සමිතියක යම් සේවකයෙකු විසින් තබන ලද මුදලින් වූ යම් ඇපයක් සමිතියේ නමින් බැංකුවක් තැන්පත් කළ යුතු අතර, එයට අයත්වන යම් පොලියක් ඒ සේවකයාට ගෙවිය යුතුය.

**25**. (1) කොමිෂන් සභාව විසින් පහත සඳහන් ආකාරයේ, එනම්:-

සේවකයින්ට අදාළ නියෝග

(අ) සමුපකාර සමිතිවල සේවකයන් බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම ඔවුන් විසින් ඉල්ලා අස්වීම හා ඔවුන්ගේ සේවාවන් අවසන් කිරීම සම්බන්ධයෙන්.

(ආ) සේවකයින්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් හා වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික ගෙවීම්, අත්තිකාරම් දීම, උසස් කිරීම, නිවාඩු, නිලධරයන්ගේ වැඩ තහනම් කිරීම, පත්වීම් අවසාන කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඒ සේවකයින්ට අන් කිසි ක්‍රමයක දඬුවම් පැමිණවීම හා ඊට විරුද්ධව යම් අභියාචනා කිරීම් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින් හා

(ඇ) ඒ සේවකයින්ගේ සේවා නියමයන්ට හෝ කොන්දේසිවලට අදාළ අවශ්‍ය යැයි සළකනු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) (1) වැනි උප වගන්තියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් සාදනු ලබන සෑම නියෝගයක්ම පිළිපැදීමට සමුපකාර සමිති හා ඒවායේ සේවකයින් බැඳී සිටිය යුතුය.

(3) 1981 දෙසැම්බර් 01 දින අංක 169/8 දරණ ගැසට් පත්‍රය සහ 1994 දෙසැම්බර් 13 දින අංක 849/7 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 1972 අංක 12 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි දකුණු පළාතේ සමුපකාර අමාත්‍යවරයා මගින් රෙගුලාසි සම්පාදනය කරන තෙක් වලංගුව පවතිනු ඇත.

**26**. පළාත තුළ ක්‍රියාත්මක වන සෑම සමුපකර සමිතියක් විසින්, සියලු සේවකයන් සම්බන්ධ යෙන් සමුපකාර සමිතිවල යුතුකම්.

(අ) එහි සෑම සේවකයෙකු සම්බන්ධයෙන් නියම කරනු ලබන නාම ලේඛන හෝ සටහන් තබා පවත්වාගෙන යායුතු අතර, ඒ එක් එක් සේවකයා සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි සියලුම විස්තර එහි සටහන් කළ යුතුය.

(ආ) එහි සේවකයන් සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි වාර්තා හෝ සටහන් හෝ කොමිෂන් සභාවට අවශ්‍ය වී සපයන ලෙස කලින් කල නියම කළහැකි තොරතුරු කොමිෂන් සභාව වෙත සැපයිය යුතුය. තවද,

(ඇ) සමිතියේ කාර්යාලවලින් යම් කාර්යාලයකට ඇතුලුවී එහි තබාගෙන යනු ලබන පොත්, ගණන් සටහන් හෝ වෙනත් ලේඛන කිසිවක් පරීක්ෂා කිරීමට හා ඒවායේ පිටපත් ගැනීමට බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ යම් සේවකයෙකුට හෝ සාමාජිකයෙකුට එසේ කිරීමට ඉඩදිය යුතුය.

**27**. සේවා යෝජකයෙකු වූ සෑම සමුපකාර සමිතියක්ම හා ඒ සමිතියේ සෑම සේවකයෙකු විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි යම් මුදලක් වාරපතා දායක මුදල් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතුය.

අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල.

**28**. සේවයට ගන්නා ලද්දේ මෙම ප්‍රඥප්තිය පනවනු ලැබූ දිනයට පෙර වුවද, පසු වුවද, සියලු සේවකයින් ඔවුන් සේවයට බඳවා ගන්නා ලද්දේ යම් සමිතියක් විසින්ද, ඔවුන් එම සමිතියේ සේවයේ නියුක්ත සේවකයන් විය යුතු අතර, ඒ සමිතියට පක්ෂපාතී විය යුතුය.

සමුපකාර සේවකයින් කොමිෂන් සභාවේ නොව සමිතියේ සේවකයින් බව.

## <u>III වැනි කොටස</u>
## <u>පළාත් කොමසාරිස්වරයාගේ බලතල.</u>

**29**. (1) සමුපකාර සමිතිවල තනතුරු සඳහා වැටුප් ක්‍රම නියම කිරීමේ කාර්යය සඳහා එක් එක් සමුපකාර සමිති වර්ග කිරීමේදී, යම් සමුපකාර සමිතියක, සේවකයින්ගේ ශ්‍රේණි හෝ පන්ති සහ ඒ එක් එක් ශ්‍රේණිය හෝ පන්තියේ විය යුතු සේවකයින්ගේ ගණන නිශ්චය කිරීමේදී තමා සුදුසු යැයි සළකන අන්දමින් කලින් කල එය වෙනස් කිරීමේදී බලය පළාත් කොමසාරිස්ට තිබිය යුතුය.

පළාත් කොමසාරිස් විසින් සමිති වර්ග කළ යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කළයුතු බව

(2) 1 වන උප වගන්තිය යටතේ පළාත් කොමසාරිස් විසින් කරනු ලබන නිශ්චය කිරීම කඩකරමින් කිසිම සමුපකාර සමිතියක් විසින් කිසිම තැනැත්තෙකු සේවයට බඳවා නොගත යුතුය.

**30**. කොමිෂන් සභාව විසින් සමුපකාර සමිතිවල යම් තනතුරකට පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීමද, යම් පන්තියක හෝ යම් ශ්‍රේණියක යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළයුතු වැටුප් ක්‍රම නියම කිරීමටද, ඒ වැටුප් ක්‍රම කළින් කළ ප්‍රතිශෝධනය කිරීමද, පළාත් කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කළ යුතුය

සුදුසුකම්, වැටුප් ක්‍රම ආදිය පිළිබඳව කොමිෂන් සභාව පළාත් කොමසාරිස්ගේ එකඟත්වය ලබාගත යුතු බව.

## IV වැනි කොටස
## විවිධ විධිවිධාන.

**31**. මෙම ප්‍රඥප්තිය විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී මේ ප්‍රඥප්තියේ කිසිම විධිවිධානයක් හෝ සාර්ථක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවක් උද්ගත වුවහොත්, අමාත්‍යවරයා විසින් ආඥාවක් මගින් සැකය හෝ දුෂ්කරතාවය ඉවත් කළ හැකිය. නොහොත් නිශ්චය කළ හැකිය. එවැනි සෑම ආඥාවක්ම ගැසට් පත්‍රයෙහි පලකළ යුතු අතර, ගැසට් පත්‍රයෙහි පළ කිරීමට පෙරාතුව පළාත් සභාවේ අනුමැතිය ලබාගත යුතුය. එසේ කරනු ලැබීමෙන් පසු එයට නීතිමය බලය තිබිය යුතුවාක් හැර මෙහිලා පනවනු ලැබුවාක් මෙන් වලංගුව බල පැවැත්විය යුතුය. දුෂ්කරතා ඉවත් කිරීම

**32**. (1) ප්‍රකාශිතවම අන් ආකාරයක විධිවිධාන සලස්වන ලද්දේ නම්, මිස නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය යටතේ බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන්ද, ඒ සියලු කරුණු සහ නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් ප්‍රකාශ කර හෝ නියම කර ඇති සියලු කරුණු සඳහා හෝ නියෝග ඇතුලුව මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි ප්‍රඥප්තිය එලගැන්වීම සඳහා අවශ්‍ය බව කොමිෂන් සභාවට පෙනී යා හැකි සියලු නියෝග කොමිෂන් සභාව විසින් පැනවිය හැකිය. කොමිෂන් සභාව විසින් නියෝග පැනවිය හැකි බව.

(2) එවැනි කිසිම නියෝගයක් දකුණු පළාත් සභාවේ විෂය භාර අමාත්‍යවරයා විසින් එය අනුමත කරනු ලබන තුරු හා ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පලකරනු ලබන තුරු බල නොපැවැත්විය යුතුය.

(3) යම් නිවේදනයක් (2) වැනි උප වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ විට ඒ නිවේදනය අදාල වන නියෝගය එය මෙහිලා පනවනු ලැබූවක්, මෙන් වලංගුව බල පැවැත්විය යුතුය.

**33**. කොමිෂන් සභාවේ යම් තනි සාමාජිකයෙකු විසින් ඒ සාමාජිකයා වශයෙන් හෝ නීතිගත තත්ත්වයෙන් කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් තීරණයක් හෝ කරන ලද හෝ නොකරන හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තනි සාමාජිකයාට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ අන් නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය. කොමිෂන් සභාවේ තනි සාමාජිකයන්ගේ නිදහස

**34**. මේ ප්‍රඥප්තියේ විධිවිධාන ගැන නොතකා සමුපකාර සමිතියක් විසින් එහි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයේ දියුණුව පිණිස,

ගිවිසුම්ගත හෝඅනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයින් සේවයේ යොදවා ගැනීම

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ගිවිසුම් පදනමක් පිට යම් නිශ්චිත කාලයකට ප්‍රවීනයෙකුගේ හෝ විශේෂඥයෙකුගේ සේවය ලබාගත හැකිය.

නැතහොත්,

(ආ) හදිසි හා අත්‍යාවශ්‍ය අවස්ථාවකදී අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයින් හෝ කෑලි මිම්මේ පදනම පිට ගෙවන සේවකයින් සේවයේ යොදවා ගත හැකිය.

එසේ වුවද, කොමිෂන් සභාවේ එකඟත්වය නොමැතිව එවැනි සේවකයින් දින 30 කට වැඩි කාලයක් සේවයේ නොයෙදවිය යුතුය.

කොමිෂන් සභාවේ එකඟත්වය නොමැතිව කිසිම ස්ථිර තනතුරක් නොදිය යුතුය.

**35**. (1) (අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන කඩකරන හෝ,

වැරදි

(ආ) කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන යම් ක්‍රියාවක් හෝ මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කොමිෂන් සභාව හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු සපයන ලෙස නියම කරන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින් නොසළකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ,

(ඇ) ඕනෑකමින් අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන යම් සමුපකාර සමිතියක් හෝ එහි යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරු විය යුතුය.

(2) (1) වැනි වගන්තියෙහි සඳහන් යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක්ම හෝ සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබුව අවස්ථාවක ඒ සමිතියේ සෑම නිලධාරියෙකුම ඒ වරද කර ඇත්තේ තම දැනුම නොමැතිව බව හෝ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි සියලු උද්යෝගයෙන් තමා ක්‍රියාකළ බව ඔහු විසින් ඔප්පු කරන තෙක්, මිස ඒ වරදට වරදකරු ලෙස සළකනු ලැබිය යුතුය.

(4) යම් සේවකයෙකු නැවත සේවයට ගැනීම නියම කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ උපදෙස් කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳව සමුපකාර සමිතියක් වරදකරු කරනු ලැබූ විට ඒ සමුපකාර සමිතිය

(i) (2) වැනි උප වගන්තිය යටතේ එයට නියම කරනු ලැබිය හැකි යම් දඩුවමකට අතිරේකව ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ පැහැර හැරීම ඉදිරියටත් පවත්වාගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් සියයක දඩයක් ගෙවීමට හා

(ii) ඒ එක් එක් දවසෙහි හා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඒ සේවකයා නැවත සේවයට බඳවාගත යුතුව තිබූ දිනයෙන් ආරම්භව ඒ සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වූ කාලපරිච්ඡේදයේ එක් එක් දවසෙහි ඒ සේවකයා සේවයේ යෙදී සිටියේ නම්, ඔහුගේ සේවය අවසන් කරනු නොලැබ තිබිණි නම්, ඔහුට හිමිකම් තිබුණු වැටුපෙහි හෝ වේතනයෙහි ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ පාරිශ්‍රමිකය ඒ සේවකයාට ගෙවීමට යටත් විය යුතුය. සමුපකාර සමිතියක් මේ උප වගන්තියේ (ii) ඡේදය යටතේ ගෙවීමට යටත්වන යම් මුදලක් ඒ සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ අධිකරණය විසින් ඒ සමිතියට නියම කරනු ලැබූ දඩයක් ලෙස ඒ අධිකරණයේ ආඥාවක් පිට අයකර ගනු ලැබිය හැකි අතර, එසේ අයකර ගන්නා මුදල ඒ සේවකයාට ගෙවිය යුතුය.

**36**. තම රාජකාරිය කිරීමේදී හැර නියමින් හෝ අනියමින් තමා විසින්ම හෝ අන් තැනැත්තෙකුගේ මාර්ගයෙන් කවර වූ හෝ ආකාරයකින් කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි යම් සාමාජිකයෙකු කෙරෙහි බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන සෑම තැනැත්තෙකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු

කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම

ඉදිරියේ ලසු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතුය.

බලය නොමැතිව තොරතුරු හෙළිදරව් කිරීම තහනම් බව

**37**. කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයෙකු කොමිෂන් සභාවේ ලේකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අන් කවර තැනැත්තෙකු විසින් වුවද, තම නිල කාර්යයන් කිරීමෙහිලා නොවන අන් ආකාරයකින් තමාගේ රාජකාරි ඉටු කිරීමේදී තමාට දැන ගන්නට ලැබුණු කවර හෝ ලේඛනයක්, සංදේශයක් හෝ තොරතුරක් පළ කිරීම හෝ අන් තැනැත්තෙකුට එළිදරව් කිරීම නොකළ යුතුය.

කොමිෂන් සභාවේ සංදේශ වරප්‍රසාද යුක්ත බව

**38**. කොමිෂන් සභාව හෝ යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හා යම් සමුපකාර සමිතියක් හෝ ඒ සමුපකාර සමිතියේ පාලන කාරක සභාවේ යම් සාමාජිකයෙකු හෝ එහි නිලධාරියකු හා අතර, හෝ කොමිෂන් සභාවේ කාර්යයන් අතුරෙන් යම් කාර්යයක් කිරීමෙහිලා හෝ ඒ කාර්යය කිරීම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික යම් සංදේශයක් යම් නීති කෘත්‍යකදී ඉදිරිපත් කරන ලෙස හෝ එළිදරව් කරන ලෙස එසේ ඉදිරිපත් කිරීමට හෝ එළිදරව් කිරීමට සභාපති ලියවිල්ලකින් කැමැත්ත දෙතහොත්, මිස කිසිම තැනැත්තෙකුට අවසර නොදිය යුතුය. නොහොත් බල නොකළ යුතුය.

සමුපකාර සමිති සහ ඒවායේ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනත අදාල වීම

**39**. (1) යම් සේවා නියුක්තයෙකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයකන් ඉදිරිපත් කර ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ කාර්මික ආරවුල පනතේ 31“ආ“ වගන්තිය යටතේ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්, එම පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් විසින් භාර නොගත යුතුය.

(2) කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත යම් සේවා නියුක්තයෙකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 31“ආ“ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූළව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් කොමිෂන් සභාව විසින් භාර නොගත යුතුය.

**40**. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි "කොමිෂන් සභාව" යනුවෙන් දකුණු පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව අදහස් වේ. "කොමසාරිස්" යන්නෙන් දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් අදහස් වේ.

අර්ථ නිරූපණය

"සමුපකාර සමිතිය" යන්නෙන් සමුපකාර සමිතිවලට අදාල නීතිය යටතේ ලියාපදිංචි කරන ලද දකුණු පළාත තුල ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන දකුණු පළාත තුළ ක්‍රියාත්මක වන සමිතියක් බව අදහස් කෙරේ.

"දිස්ත්‍රික්කය" යන්නෙන් අදහස් කරන්නේ දකුණු පළාත් තුළ පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය වේ.

"සේවකයා" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ අර්ථානුකූලව සමුපකාර සමිතියක සේවකයෙක් යන්න අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ දකුණු පළාතේ සමුපකාර සංවර්ධන විෂය හෝ කාර්යයන් කරනු ලැබ සිටි අමාත්‍යවරයා යන්න අදහස් වේ.

"නියම කරනු ලබන" යන්නෙන් කොමිෂන් සභාව විසින් පනවන ලද නියෝගවලින් නියමිත බව අදහස් වේ.

**41**. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වේ.

**42**. (1) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම 1991 මැයි මස 01 වන දින ආරම්භ වූ අතර, එසේ ආරම්භ වූ බව සියලු කාර්ය සඳහා සළකනු ලැබිය යුතුය. ඒ අනුව, මේ ප්‍රඥප්තියේ ඉහත දැක්වෙන 3 සහ 4 (1) සහ (2) වන වගන්ති ප්‍රකාර (දකුණු පළාතේ) සමුපකාර සේවක කොමිෂන් සභාව සහ එහි සාමාජිකයින් තිදෙනා පත් කිරීමට බලතල සහ අධිකාරිය 1991 මැයි මස 01 වන දින දී එදින සිට අමාත්‍යවරයා වෙත පවරා තිබුණු ලෙසත්, ඒ අනුව අමාත්‍යවරයා විසින් (දකුණු පළාතේ) සමුපකාර සේවක කොමිෂන් සභාව සහ එකි සාමාජිකවරුන් තිදෙනා 1991 මැයි මස 01 වන දින පත් කරනු ලැබීම සහ වලංගුව පැවති ලෙස සහ වලංගුව පවත්නා ලෙසත්, (දකුණු පළාතේ) සමුපකාර සේවක කොමිෂන් සභාව මේ ප්‍රඥප්තිය ප්‍රකාර නීත්‍යානුකූලව වලංගුව පිහිටුවා තිබුණු ලෙසත්, සළකනු ලැබිය යුතුය.

අතීතයට බලපාන පරිදි ක්‍රියාත්මක කිරීම

(2) මෙම ප්‍රඥප්තිය යටතේ කොමිසමට ඉදිරිපත් කරනු ලැබූ යම් අභියාචනා හා,

(අ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දින විමසීමට නියමිතව තිබූ අභියාචනා, මෙම ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ ලෙස සැළකෙන අතර, ඒවා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ විමසා තීරණය කරනු ලබන්නේය.

නිත්‍යානුකූලව පිහිටුවන ලද කොමිසමක් නොතිබීමේ හේතුවෙන් අභියාචනාවල අන්තර්ගත කරුණු සැළකිල්ලට භාජනය නොකර ඒවා නිෂ්ප්‍රභා කර ඇත්නම්, අදාළ අභියාචනාකරු විසින් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේ දිනයේ සිට මාස 06 ක් ඇතුලත කොමිසමට අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබුවහොත්, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ එම අභියාචනය විමසා තීරණය කරනු ලබන්නේය.

## 22. දකුණු පළාත් සභාවේ 1999 අංක 01 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීම (සංශෝධන) ප්‍රඥප්තිය.

(1989 අංක 06 දරන දකුණු පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීම ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් 1999 මාර්තු මස 30 වන දින සම්මත කරන ලදුව 1999 අප්‍රේල් මස 19 වන දින ආණ්ඩුකාරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී. එම්. තිලකා කල්‍යාණි
සභා ලේකම්,
දකුණු පළාත් සභාව.

1999 ඔක්තෝබර් මස 21 වන දින,
ගාල්ලේ, හිල්ටොප් මන්දිරයේ පිහිටි,
දකුණු පළාත් සභා ලේකම් කාර්යාලයේදී ය.

### දකුණු පළාත් සභාවේ 1999 අංක 01 දරන පළාත් සභා වැටුප් හා දීමනා (සංශෝධන) ප්‍රඥප්තිය.

**01.** මෙම ප්‍රඥප්තිය, 1999 අංක 01 දරන පළාත් සභා වැටුප් හා දීමනා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**02.** 1989 අංක 06 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (අ) සහ (ආ) ඡේද 1998.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1989 අංක 6 දරන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප සහ දීමනාව 1998.01.01 දින සිට රුපියල් හයදහසක් (රු. 6,000/=) ද,

(ආ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ මාසික වැටුප සහ දීමනාව 1998.01.01 දින සිට රුපියල් හාරදහස් පන්සියයක් (රු. 4,500/=) ද ගෙවිය යුත්තේය.

## 23. 2000 අංක 01 දරන රුහුණු සංචාරක කාර්යාංශ ප්‍රඥප්තිය

දකුණු පළාත තුළ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා පාලනය කිරීම සඳහා රුහුණු සංචාරක කාර්යාංශය ස්ථාපනය කිරීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුශාංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**01**. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ, 2000 අංක 01 දරන රුහුණු සංචාරක කාර්යාංශ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයන් මගින්, නියම කරනු ලබන දිනක සිට ක්‍රියාත්මක වන්නේය.

කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය

### <u>1 වැනි කොටස</u>

### <u>රුහුණු සංචාරක කාර්යාංශය – සංයුක්ත බලතල හා කාර්යයන්.</u>

**02**. මෙම ප්‍රඥප්තියෙහි මින් මතු කාර්යාංශය යනුවෙන් නම් කෙරෙන පොදු අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

රුහුණු සංචාරක කාර්යාංශය

**03**. දෙවන වගන්තියෙන් කාර්යාංශයට දී ඇති නාමයෙන් එම කාර්යාංශයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත ආයතනයක් වන අතර, එම නාමයෙන් කාර්යාංශය විසින් නඩු පැවරීමට ද, කාර්යාංශයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය.

කාර්යාංශය සංස්ථාපිත ආයතනයක් බව

**04**. කාර්යාංශයේ පරමාර්ථ වනුයේ –

කාර්යාංශයේ පරමාර්ථ

(1) සංචාරක ව්‍යාපාරයට අදාළ ජාතික සැලසුම් හා ජාතික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි දකුණු පළාත වෙත හා දකුණු පළාත තුළ සංචාරක ගමන් දිරි ගැන්වීම, නංවාලීම හා වර්ධනය කිරීම.

(2) දකුණු පළාත තුළ කාර්යක්ෂම සංචාරක සේවාවන් දිරි ගැන්වීම, නංවාලීම හා වර්ධනය කිරීම.

(3) කාර්යාංශයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනිම උදෙසා, යම් සංචාරක සේවාවන් ක්‍රියාත්මක කරන හෝ පවත්වාගෙන යන යම් පළාත් පාලන බල මණ්ඩලයකට, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තුවකට, මුදලින් හෝ වෙනත් අයුරකින් උපකාරීවීම සහ යම් පුද්ගලයෙකුට හෝ වෙනත් පුද්ගල

මණ්ඩලයකට (සංස්ථාපිත හෝ සංස්ථාපිත නොවන) ණය ලබාදීමෙන් උපකාරී වීම.

(4) දකුණු පළාතේ සිත් ගන්නා සුළු ස්ථාන කෙරෙහි අවධානය යොමු කිරීමට සකස් කරන ලද ප්‍රස්තාරික ද්‍රව්‍ය, ප්‍රදර්ශන භාණ්ඩ ප්‍රදර්ශනය හා බෙදා හැරීම උදෙසා සංචාරක ගමන් හා සෙසු නියෝජ්‍යායතන යෙදවීම හා ඒවාට සහය දැක්වීම හා සිත් ගන්නා සුළු ස්ථාන, ගමන් ගන්නා මාර්ග, ප්‍රවාහන පහසුකම්, සංචාරක සේවාවන් සහ ස්වකීය පරමාර්ථ සාක්ෂාත් කිරීමට අවශ්‍ය විය හැකි හෝ උපකාරී විය හැකි එබඳු වෙනත් කාර්යයන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම, ප්‍රසිද්ධ කිරීම හා බෙදා හැරීම.

(5) කාර්යාංශයේ පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය උදෙසා මෙම ප්‍රඥප්තිය හෝ වෙනත් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ කාර්යාංශය වෙත පවරන ලද හෝ නියම කරන ලද බලතල කාර්යයන්, හා වගකීම් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කිරීම, කාර්ය සාධන හා ඉටු කරනු ලැබිය හැක.

කාර්යාංශයේ බලතල, කාර්යයන් හා වගකීම්.

**06**. ඉහත තුන්වන වගන්තියේ සඳහන් යම් කරුණක් හෝ සියළුම කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම කාර්යාංශය සතු වගකීම විය යුතුය.

අමාත්‍යවරයාට උපදෙස් දීම

**07**. කාර්යාංශයේ පරමාර්ථ, බලතල හා කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පහත දැක්වෙන බලතල, කාර්යාංශය සතු විය යුතුය:-

කාර්යාංශයේ පරමාර්ථ සපුරාලීම සඳහා සිය බලය පාවිච්චි කළ හැකි බව.

(1). මිළදී ගැනීමෙන් හෝ අන් අයුරකින් හෝ යම් චංචල හා නිශ්චල දේපළක් අත්කර ගැනීම හා දැරීම, බදු හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, හුවමාරු කිරීම, විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම.

(2). සංචාරක කටයුතු වර්ධනය කිරීම, ප්‍රචාරණය හා තොරතුරු බෙදා හැරීම හා කාර්යාංශයේ වෙනත් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා වූ වෙනත් කටයුතු පිළිබඳ පුහුණුවීම් පැවැත්වෙන ස්ථාන පිහිටුවීම හා ඒවා පවත්වාගෙන යාම.

(3). දකුණු පළාතේ සංචාරක කර්මාන්තයේ තත්ත්වය නංවාලීම හා වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු කෙරෙන කටයුතු පවත්වාගෙන යාමට සහය වීම, සම්බන්ධීකරණය හා දිරිගැන්වීම.

(4). කාර්යාංශය විසින් සපයනු ලබන යම් යම් සේවාවන් වෙනුවෙන් ගාස්තු හෝ කුළී අය කිරීම.

(5). කාර්යාංශයට කරනු ලබන යම් යම් සේවාවන් වෙනුවෙන් ගාස්තු හෝ කුළී ගෙවීම.

(6) මුළුමනින්ම හෝ ප්‍රධාන වශයෙන් සංචාරක ගම හා සංචාරක සේවාවන් හා සම්බන්ධ වැඩ කිරීම සඳහා පුද්ගලයින් පුහුණු කිරීම, හෝ එවැනි පුහුණු කිරීම් සඳහා මුදලින් ආධාර දීම, එසේ වුවද, මෙහි සඳහන් කාර්යයන් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත සමග ගැටීමක් ඇති නොවිය යුතුය.

(7) ස්වකීය සේවකයන් පත්කිරීම, සේවයේහි යෙදවීම, ඔවුනට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතුකිරීම.

(8) ස්වකීය සේවකයන් පත් කිරීම, පුහුණු කිරීම, උසස් කිරීම, ඔවුනට පරිශ්‍රමික ගෙවීම, ඔවුන් ගේ විනය පාලනය, හැසිරීම, නිවාඩු ලබාදීම ඇතුළුව ස්වකීය සේවකයින් සම්බන්ධයෙන් රීති සම්පාදනය කිරීම.

(9) ස්වකීය සේවකයන් සම්බන්ධයෙන් කාර්ය නියමයන් ඇති කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම සහ ඒවා පිළිබඳව අවශ්‍ය පිළියම් යෙදීම සඳහා කාර්යාංශයට බලය ඇත.

(10) කාර්යාංශයෙහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, යන්ත්‍රෝපකරණ උපකරණ හා ද්‍රව්‍ය ආනයනය කිරීම සහ කාර්යාංශයෙහි පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි ද්‍රව්‍ය, උපකරණ, අරමුදල, කාර්යමණ්ඩලය හා වෙනත් ආධාර පිළි ගැනීම.

**08**. ස්වකීය කාර්යයන් නිසියාකාරව හා ඵලදායි අයුරින් ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන දෙපාර්තමේන්තු අංශ හෝ නියෝජ්‍ය ආයතන යම් සංඛ්‍යාවක් කාර්යාංශය විසින් පිහිටුවා පවත්වාගෙන යා හැකිය. කාර්යාංශයේ නියෝජන ආයතන, දෙපාර්තමේන්තු හා අංශ

## II වන කොටස

## කාර්යාංශයේ පාලක අධ්‍යක්ෂ මණ්ඩලය.

**09**. (1) කාර්යංශයේ පාලක අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබිය යුතු අතර, එම මණ්ඩලය නිල සාමාජිකයින් සිවු දෙනෙකුගෙන් ද, නම් කරනු ලබන සාමජිකයින් පස් දෙනෙකුගෙන් ද, සමන්විය යුතුය. කාර්යාංශයේ පාලක අධ්‍යක්ෂ මණ්ඩලය.

(2) විෂය භාර ආමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන නිල සාමාජිකයින් සිවු දෙනා දකුණු පළාතේ සංචාරක විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන අයෙකුගෙන් ද, ලංකා සංචාරක මණ්ඩලය මගින් නම් කරනු ලබන අයෙකුගෙන් ද, ලංකා හෝටල් පාසැල සහ සංචාරක පාසැල මගින් නම් කරනු ලබන අයෙකුගෙන් ද, ලංකා හෝටල් සංස්ථාව මගින් නම් කරනු ලබන අයෙකුගෙන් ද සමන්විත විය යුතුය.

(3) නම් කරනු ලබන සාමාජිකයින් පස් දෙනා අමාත්‍යවරයා විසින් සංචාරක කර්මාන්තයට අදාළ කටයුතු සම්බන්ධයෙන් විශේෂ දැනුමක් හා පළපුරුද්දක් ඇති අයවලුන් අතරින් පත් කරනු ලැබේ.

(4) කාර්යංශයේ පාලක මණ්ඩලය මගින් නිරීක්ෂකයින් වශයෙන් රැස්වීම්වලට සහභාගි වීමට සුදුසු යැයි හැඟෙන පුද්ගලයින්ට ආරාධනය කරනු ලැබිය හැක.

නුසුදුසුකම්

**10**. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් නීතියක් යටතේ සිහිවිකල් බවට පත් වූ තැනැත්තෙකු හෝ අපරාධ නීතිය යටතේ මුදල් වංචා සම්බන්ධයෙන් අධිකරණයේ වරදකරුවකු වූ (විශ්වාසය කඩ කිරීම හා බංකොලොත් භාවයට පත් කිරීම) අය ද ඇතුලත්ව මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම වැඩ කිරීමට සුදුසුකම් නොලබන්නේය.

සාමාජිකයින්ගේ ධූර කාලය

**11**. තනතුරු අතහැර යාමෙන් හෝ නියමිත කාලයකට පෙර නිල සාමාජිකයෙක් නම් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ නම් කළ සාමාජිකයකු නම් අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් මිස සෑම සාමාජිකයෙක්ම අවුරුදු 03 ක කාලයක සිය ධූරය දැරිය යුතුය.

වැඩ බලන සාමාජිකයින් පත් කිරීම

**12**. අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සිය ධූරයේ රාජකාරි ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වේ නම්, දහවන වගන්තියේ නියමයන්ට යටත්ව නිළ සාමාජිකයෙක් නම් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ නම් කළ සාමාජිකයකු නම් අමාත්‍යවරයා විසින් එම සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැක.

**13**. (1) නිල සාමාජිකයකු නම් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නම් කළ සාමාජිකයකු නම් අමාත්‍යවරයා වෙත ද ආමන්ත්‍රික ලිපියක් එවීමෙන් සෑම සාමාජිකයෙකුටම තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

සාමාජිකයින් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම

(2) එසේ කිරීම අවස්ථානුකූල යයි තමාහට හැඟී යන්නේ නම් නිල සාමාජිකයකු විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් ද, නම් කළ සාමාජිකයකු නම් අමාත්‍යවරයා විසින් ද සිය ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(3) යම් හෙයකින් කිසියම් සාමාජිකයකු පිළිගත හැකි හේතු නොදක්වා නොකඩවා සභා වාර 03 කට හෝ ඊට වැඩි ගණනකට සහභාගි නොවූයේ නම් ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලිඛිත දැනුම් දීමකින් පසු ඔහු සාමාජික ධූරයෙන් ඉවත් කළ හැක.

**14**. කාලය ඉකුත් වීමෙන් ධූරයෙන් ඉවත් වන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබිය හැක.

සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසුකම්

**15**. (1) අමාත්‍යවරයා විසින් පාලක මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂක මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

මණ්ඩලයේ සභාපති හා උප සභාපති

(2) සාමාජිකයින් අතුරින් එක් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ උප සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතුය. සභාපති සහභාගී නොවන අවස්ථාවල දී ඔහු වෙනුවට උප සභාපති කටයුතු කළ යුතුය.

(3) ඉහත (12) වගන්තියේ සඳහන් යම් හේතුවක් නිසා සභාපතිට හෝ උප සභාපතිට සිය ධූරයෙහි කාර්යයන් තාවකාලිකව ඉටු කළ නොහැකි අවස්ථා වලදී අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතුරින් යම් සාමාජිකයකු වැඩ බලන සභාපති වශයෙන් පත් කරනු ලැබිය හැකිය.

(4) මණ්ඩලයේ රැස්වීමක දී යම් කරුණක් පිළිබඳ කැමැත්ත විමසීමේ දී, පක්ෂ විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමානවේ නම්, සභාපති වරයාට තම ඡන්දයට අතිරේකව දෙවන ඡන්දයක් නැතහොත් තීරක ඡන්දයක් හිමි වේ.

**16**. (1) අධ්‍යක්ෂක මණ්ඩලය මසකට අවම වශයෙන් එක් වරක් වත් රැස් විය යුතුය.

මණ්ඩල රැස්වීම

(2) සභාපති හෝ උප සභාපති හෝ 15 (3) වන වගන්තිය අනුව පත් කරනු ලැබූ වැඩ බලන සභාපති විසින් අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීම් වලට මූලාසනය දැරිය යුතුය.

(3) සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පිළිබඳවම ලිඛිත දැන්වීමක් එක් එක් සාමාජිකයෙකුටම, රැස්වීම් දිනට දින හතකට පෙර ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එම රැස්වීමේ දී කිරීමට නියමිත කාර්යයන් කවරේදැයි එහි නිශ්චිත වශයෙන් සඳහන් විය යුතුය.

**17**. මණ්ඩල රැස්වීම සඳහා ගණපූරණය මුලසුන දරන සභාපතිවරයා ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකු විය යුතුය. මණ්ඩල රැස්වීම සඳහා ගණපූරණය.

**18**. මණ්ඩලයේ රැස්වීම පැවැත්වීම හා එම රැස්වීම් වල කටයුතු කරගෙන යාම පළිබඳ කාර්යය පරිපාටි මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් සකස් කර ගත හැකිය. මණ්ඩලයේ රැස්වීම පිළිබඳ කාර්ය පරිපාටිය.

**19**. මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එකී සාමාජිකයකු පත් කිරීම දෝෂ සහිත වීම යන හේතු නිසාම පමණක්, මණ්ඩලය විසින් කරනු ලැබූ යම්කිසි ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ බල රහිත යැයි නොසැලකිය යුතුය. මණ්ඩලයේ පුරප්පාඩු නිසා එකී කටයුතුබල රහිත නොවන බව

**20**. අමාත්‍යවරයා තීරණය කරනු ලබන ආකාරයට සහ ප්‍රමාණවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතුය. මණ්ඩල සාමාජිකයින්ගේ පාරිශ්‍රමික

**21**. (1) කාර්යාංශයේ පොදු මුද්‍රාව, මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරනු ලබන තැනැත්තෙකු භාරයේ තිබිය යුතුය. කාර්යාංශයේ මුද්‍රාව

(2) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට, කාර්යාංශයේ පොදු මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර, කාර්යාංශයේ මුද්‍රාව යම් සාධන පත්‍රයක හෝ ලේඛනයක හෝ නොයෙදිය යුතු අතර, ඒ මණ්ඩල සාමාජිකයන් දෙදෙනා විසින් ඔවුන් එම අවස්ථාවේ එහි සිටි බවට සළකුණු වශයෙන් එම සාධන පත්‍රයෙහි නැතහොත් ලේඛනයෙහි තම අත්සන යෙදිය යුතුය.

(4) කාර්යංශයේ මුද්‍රාව යොදන ලද සාධන පත්‍ර හෝ ලේඛන හෝ පිළිබඳව මණ්ඩලය විසින් ලේඛනයක් පවත්වා ගත යුතුය.

**22**. මණ්ඩලය ස්වකීය බලතල, කාර්යයා හා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී, ඉටු කිරීමේදි හා කාර්ය සාධනයේ දී අමාත්‍යවරයා විසින් කලින් කලට නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ නියමයන්ට මණ්ඩලය යටතේ විය යුතුවාක් මෙන්ම, එම නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය

අමාත්‍යවරයා විසින් මණ්ඩලයට කරනු ලබන නියමයන්

**23**. (1) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන වගකීම්, කාර්යයා හා බලතල, කාර්යාංශයේ කවර හෝ සාමාජිකයෙකු හෝ සේවකයෙකු වෙත මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකිය.

මණ්ඩලය විසින් වගකීම්, කාර්යයන් හා බලතල පැවරීම

(2) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාරක සභා, උපකාරක සභා හා උපදේශක මණ්ඩල පත් කරනු ලැබිය හැකි අතර, විශේෂයෙන් හෝ අධ්‍යක්ෂක මණ්ඩලයේ ඕනෑම වගකීමක්, කාර්යයක් හෝ බලයක් ඒවාට පවරනු ලැබිය හැකිය.

(3) ඉහත (1) හා (2) උප වගන්ති යටතේ බලතල පවරනු ලැබූ සෑම අයෙකුම හෝ කණ්ඩායකම අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ නිශ්චිත නියමයකට යටත්ව,තමන් වෙත පවරනු ලැබූ වගකීම්, කාර්යන් හා බලතල ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතුය.

## III වන කොටස

## කාර්යංශයේ ප්‍රධාන විධායක හා සෙසු කාර්ය මණ්ඩලය.

**24**. (1) කාර්යාංශයේ ප්‍රධාන විධායක වශයෙන් පැවරෙන වගකීම් දැරීමට නිසි සුදුසුකම් ඇති පුද්ගලයකු (මෙම ප්‍රඥප්තියෙහි මින් මතු “කළමනාකාර අධ්‍යක්ෂ”වශයෙන් හඳුන්වනු ලබන)ප්‍රධාන විධායක වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතුය.

කාර්යාංශයේ ප්‍රධාන විධායක

කළමණාකාර අධ්‍යක්ෂ ධූරයේ පුරප්පාඩුවක් ඇති වූ විටෙක එම තනතුරේ කටයුතු ඉටු කිරීම පිණිස උපදේශකවරුන් හෝ වෙන යම් අය හෝ පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත්තේය.

(2) අමාත්‍යවරයා ගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිශ්‍රමික, එසේ පත් කරනු ලබන අයට ගෙවිය හැකිය.

**25**. (1) කාර්යාංශයේ එදිනෙදා සියලුම පරිපාලක කටයුතු පිළිබඳව කළමනාකාර අධ්‍යක්ෂක වගකිව යුතු වේ.

කළමණාකාර අධ්‍යක්ෂවරයාගේ බලතල කාර්ය හා වගකීම්

(2) මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව -

(අ) කාර්යාංශය විසින් සේවයේ යොදවා ඇති අයගේ කුසලතා වර්ධනය.

(ආ) කාර්යාංශයේ කාර්යක්ෂමතාවය හා කාර්යාංශයේ පරමාර්ථ සාක්ෂාත් කිරීමෙහි ලා ඵලදායීතාවය වැඩි දියුණු කිරීම.

(ඇ) කාර්යාංශයේ අරමුණු සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ සේවාවන් සංවිධානය කිරීම, කළමණාකාර අධ්‍යක්ෂවරයාගේ කටයුතු වලට ඇතුළත් විය යුතුය.

(3) මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමණාකාර අධ්‍යක්ෂ වෙත පවරනු ලබන බලතල, කාර්ය හා වගකීම්, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතුය.

කාර්යාංශයේ සෙසු කාර්ය මණ්ඩලය

**26**. මෙම ප්‍රඥප්තියේ අනෙකුත් විධිවිධානවලට යටත්ව -

(1) කාර්යාංශයේ සේවකයින් පත් කිරීම, සේවකයින් සේවයෙන් පහ කිරීම හා ඔවුන් ගේ විනය පාලනය ගැන ක්‍රියා කිරීම.

(2) එහි කාර්ය මණ්ඩලයේ වැටුප්, වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම.

(3) එහි කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි තීරණය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළ හැකිය.

(4) ඉහත 1 හා 2 කරුණු සම්බන්ධයෙන් කිසියම් සේවකයෙකුට අසාධාරණයක් සිදු වී ඇතැයි හැඟී යන අවස්ථාවේ දී එම තීරණයට විරුද්ධව සංචාරක විෂය භාර පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් වෙත එම තීරණය දැනුම් දුන් දින සිට මාස 03 ක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එම අභියාචනය සලකා බැලීමෙන් පසුව ලේකම් විසින් ගනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

## 1V වන කොටස

## මුදල් හා ගිණුම්.

**27**. (1) කාර්යාංශයට එහිම අරමුදලක් තිබිය යුතුය. කාර්යාංශයේ අරමුදල්

(අ) කාර්යාංශයේ ප්‍රයෝජනය උදෙසා පළාත් සභාව විසින් කලින් කලට සම්මත කරනු ලබන මුදල්,

(ආ)කාර්යාංශයට පැවරී ඇති බලතල, කාර්ය හා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී කාර්යාංශයට ලැබෙන මුදල්,

(ඇ) වෙනත් ප්‍රභවවලින් ලැබෙන මුදල්, කාර්යාංශයේ අරමුදලට බැර කළ යුතුය.

(2) මෙම අරමුදල, පළාත් අරමුදලේ වෙනම ගිණුමක් විය යුතු අතර, එම අරමුදලට 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 111 වැනි කොටසේ විධිවිධානවලට අදාළ විය යුතුය.

**28**. කාර්යාංශයේ පරමාර්ථ සාක්ෂාත් කිරීමේ කාර්යය පිණිස හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ පැවරී ඇති බලතල, කාර්ය හා වගකීම් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා කාර්යාංශයේ අරමුදල් යොදා ගත හැකිය. කාර්යාංශය විසින් එහි අරමුදල් යෙදවිය හැකි බව

**29**. එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් සිය ආදායම් හා වියදම් පිළිබඳවත්/වෙනත් සියළු ගණුදෙනු පිළිබඳවත් / නිසි පරිදි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැළැස්විය යුතු අතර , අමාත්‍යවරයා විසින් ඇතුළත් කරනු ලබන තොරතුරු ඇතුළත් කොට සිය කාර්යාංශයට අදාළව, ගිණුම් හා සංඛ්‍යා ලේඛණ ඇතුලත් වාර්ෂික ප්‍රකාශයක් කාර්යාංශය විසින් පිළියෙල කළ යුතුය. කාර්යාංශයේ ගිණුම්

**30**. කාර්යාංශයේ මුදල් වර්ෂය ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වේ. මුදල් වර්ෂය

**31**. (1) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් කාර්යාංශයේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයෙකු ලවා විගණනය කළ යුතුය. මණ්ඩලය විසින් වාර්ෂික ගිණුම් වාර්තාවක් ප්‍රසිද්ධ කළ යුතුය.

(2) කාර්යාංශයේ ගිණුම් විගණනය කිරීමේ කාර්යය උදෙසා, විගණකවරයා දරන වියදම් පියවීම සඳහා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිශ්‍රමික, කාර්යාංශයේ අරමුදලින් ඔහුට ගෙවිය යුතුය.

(3) මෙම වගන්තියේ කාර්යය උදෙසා "සුදුසුකම් ලත් විගණකවරයා" යනුවෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වූ ද, එම ආයතනයේ සභාව විසින් විගණකාධිපතිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදවීමට නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තකු හෝ

(ආ) යම් වරලත් ගණකාධිකාරී සමාගමක එක් එක් හවුල්කරුවෙකු එම ආයතනයේ සාමාජිකයෙකුව සිටින්නේද, එමෙන්ම ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

(4) විගණකාධිපතිවරයා විසින් ගිණුම් පරීක්ෂා කොට පහත සඳහන් කරුණු අඩංගු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(අ) තමන්ට අවශ්‍ය සියළු තොරතුරු පැහැදිළි කිරීම් ලැබුණේ ද, නැද්ද යන වග.

(ආ) කාර්යාංශයේ කටයුතු පිළිබඳ නිවැරදි හා සාධාරණ අදහස් ලබා ගැනීමට හැකිවන පරිදි ගිණුම් නිසියාකාරව පවත්වාගෙන ගොස් තිබෙන්නේ ද යන වග.

(ඇ) තමන්ගේ හැඟීම් අනුව පළාත් සභාවට වැදගත් වන යම් කරුණු විගණනය කිරීමේ දී හෙළිදරව් වූයේ නම් ඒ කරුණු.

විගණන වාර්තාව හා කාර්යංශයේ වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයාට යැවිය යුතු බව

**32**. විගණනය කරන ලද ගිණුම් වාර්තාව, එක් එක් වර්ෂයේ දී ලැබුණු විට, එම වාර්තාව අභ්‍යන්තර විගණනය විසින් අදාළ වර්ෂය තුළ දී, කාර්යාංශය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු එම ගිණුම්වලට අදාළ මුදල් වර්ෂය ඉකුත් වී දොළොස්මසක් ඉකුත් වීමට පෙර ඒවායේ පිටපත් අමාත්‍ය මණ්ඩලයට හා පළාත් සභාවට ඉදිරිපත් කිරීමට සැළැස්විය යුතුය.

## V වැනි කොටස

## පොදු කරුණු

නියෝග

**33**. (1) මේ ප්‍රඥප්තියේ සිද්ධාන්ත හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, නියම කළ යුතු යැයි නැතහොත් නියෝග සෑදිය යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති සියළුම කරුණු ක්‍රියාත්මක කිරීම සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එය පළ වූ දිනයේ සිට හෝ ඒ නියෝගයේ සඳහන් ඊට පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වේ.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ගැසට් පත්‍රයේ පළ වීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අයුරින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් වෙතොත්, එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කළා සේ සැළකිය යුතු අතර, එම නියෝගය එතෙක් ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයක් කෙරෙහි එම අවලංගු වීම බල නොපෑ යුතුය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් මේ අයුරින් අවලංගු වූවා සේ සැළකිය යුත්තේ කවර දිනක සිටද යන්න දැන්වීමක් මගින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

**රීති**

**34**. රීති සෑදිය යුතු යයි බලය දෙන ලද හෝ මේ ප්‍රඥප්තිය මගින් නියම කර ඇති හෝ කරුණුවලට අදාළව, කාර්යාංශය විසින් රීති සම්පාදනය කළ හැකිය. කාර්යාංශය විසින් සම්පාදනය කරන ලද කවර හෝ රීතියක් එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන තෙක් බල රහිත විය යුතුය.

**නිශ්චල දේපළ**

**35**. කාර්යාංශයේ කාර්යය උදෙසා යම් නිශ්චල දේපළක් ලබාගැනීමට අවශ්‍ය වුවහොත්, කාර්යාංශය වෙනුවෙන් අමාත්‍යවරයා විසින් ආණ්ඩුව වෙත අයදුම් කිරීමෙන් අනතුරුව, දේපළ ලබා ගැනීම පිණිස වැය වන මුදල, අරමුදලින් ගෙවිය යුතුය.

**චංචල හා නිශ්චල රජයේ දේපළ**

**36**. කාර්යාංශයේ කාර්යය උදෙසා රජයේ යම් චංචල හෝ නිශ්චල දේපළක් අවශ්‍ය වේ නම්, කාර්යාංශය විසින් ඒ පිළිබඳව ඉල්ලීමක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

**කාර්යංශයේ කටයුතු සඳහා අවශ්‍ය පරිශ්‍ර රජය විසින් ලබා දීම.**

**37**. කාර්යාංශයේ කටයුතු සඳහා යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් පහසුකම් අවශ්‍ය වේ නම්, රජය විසින් එය ලබා දිය හැකිය.

**කාර්යංශය සමඟ ගිවිසුම් ඇති කර ගැනීමට සමාගම් වලට ඇති බලය**

**38**. කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ අවශ්‍ය වන කොන්ත්‍රාත්තුවලට බැඳී ඒවා ඉටු කිරීමට යම් රාජ්‍ය ආයතනයකට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයකට (සංස්ථාපිත හෝ එසේ නොමැති) හෝ හැකිය.

**කාර්යංශයේ සේවකයින් රාජ්‍ය සේවකයින් සේ සැලකීම**

**39**. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථය ඇතුළත හා එහි කාර්යය උදෙසා, කාර්යාංශයේ සියළුම සේවකයින් රාජ්‍ය සේවකයින් ලෙස සැළකිය යුතුය.

**රහස්‍යභාවය**

**40**. අමාත්‍යවරයාට සිය රාජකාරි කටයුතු ඉටුකිරීම සඳහා නැතහොත් වගකීම් දැරීම සඳහා අවශ්‍ය වූ විට, අධිකරණයක් ඉදිරියේ එසේ කිරීමට සිදු වූ විට හෝ යම් නීතියක් අවශ්‍ය වූ විට හෝ හැරෙන්නට, තම රාජකාරිය ඉටු කිරීමේ දී නැතහොත් වගකීම් හෝ තමන්ට ලැබෙන කිසියම් තොරතුරක් කාර්යාංශයේ කාර්ය මණ්ඩලය විසින් හෙළි නොකළ යුතුය.

**41**. මෙම ප්‍රඥප්තිය යටතේ අවංක සිතින් කරනු ලබන ක්‍රියාවන් සම්බන්ධයෙන් මණ්ඩල සාමාජිකයන්ට නැතහොත් කාර්යාංශයේ සෙසු නිලධාරීන්ට හෝ කාර්ය මණ්ඩලයට විරුද්ධව නඩු පැවරීමක් හෝ නීති කෘත්‍යයක් හෝ ඇති නොවිය යුතුය.

මෙම ප්‍රඥප්තිය යටතේ කටයුතු සඳහා ආරක්ෂාව

**42**. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ සහ සිංහල හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති සිංහල භාෂා පාඨ බල පැවැත් විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූවිට

**43**. මෙම ප්‍රඥප්තියෙහි අන්‍යාකාරයකින් සඳහන් වුවහොත් මිස

අර්ථ නිරූපනය

"අනුමත බැංකුව" යන්නෙන් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බැංකුව ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, දකුණු පළාත් ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාත් සභාවේ විෂය භාර අමාත්‍යවරයා ද,

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාත් සභාව ද යනුවෙන් අර්ථ දැක්විය යුතු වන්නේය.

## 24. දකුණු පළාත් සභාවේ 2001 අංක 02 දරන ආගමික සාහිත්‍ය හා කලා සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් 2001 මැයි මස 25 වැනි දින සම්මත කරන ලදුව 2001 ජූලි මස 28 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළුදෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

2001 නොවැම්බර් මස 05 වන දින
ගාල්ලේ හිල්ටොප් මන්දිරයේ පිහිටි
සභා ලේකම් කාර්යාලයේ දීය.

දකුණු පළාත් සභාවේ 2001 අංක 02 දරණ ආගමික සාහිත්‍ය හා කලා
සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ පිහිටුවා ඇති ආගමික සාහිත්‍ය හා කලා සමිති හා සංගම් විධිමත් කිරීම සහ ඒ හා සම්බන්ධ කටයුතු සංවර්ධනයට පියවර ගැනීම පළාතේ අප්‍රකට වුත් පෞරාණික වූත්, ස්මාරක හා වාර්තා ආරක්ෂා කිරීම පළාතට විශේෂිත කෞතුකාගාර සේවා පිහිටුවීම පළාතේ රූඟුම්හල් රඟ දැක්වීම් සංගීත ප්‍රසංග හා විනෝද කටයුතු විධිමත් කිරීම සහ පාලනය කිරීම සඳහා වූ ඊට සම්බන්ධ හෝ ආනුශාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මේ ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 2001 අංක 02 දරණ ආගමික සාහිත්‍ය හා කලා සංවර්ධන කටයුතු පිළිබඳව ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් සහතිකය සටහන් කරන ලද දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේය. ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වන දිනය

**02**. මේ ප්‍රඥප්තියේ පරමාර්ථ පහත සඳහන් වන්නේය. පොදු පරමාර්ථ

(අ) පළාතේ සියළු ආගමික සිද්ධස්ථාන හා වෙනත් ආයතන මුල් කොටගෙන ආගමික සමිති හා සංගම් පිහිටුවීම ලියාපදිංචි කිරීම හා විධිමත්ව පවත්වාගෙන යාම හා ආගමික කටයුතු සංවර්ධනයට පියවර ගැනීම.

(ආ) සාහිත්‍ය සමිති හා සංගම් පිහිටුවීම විධිමත්ව පවත්වාගෙන යාම හා සාහිත්‍යය කටයුතු සංවර්ධනයට පියවර ගැනීම.

(ඇ) නිර්මාණකරණයෙහි ලේඛකයන් උනන්දු කිරීම සඳහා ලේඛක ආධාර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

(ඈ) හඳුනා නොගත් පෞරාණික ස්ථාන හා ඓතිහාසික ස්ථාන හඳුනා ගැනීම හා ඓතිහාසික වැදගත්කමක් ඇති වාර්තා රැස් කිරීම හා ඒ ඒ ස්ථාන හා වාර්තා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

(ඉ) පළාතේ රඟුම්හල් හා රඟ දැක්වීම් පාලනය කිරීම.

(ඊ) කලා සමිති සංගම් පිහිටුවීම ලියාපදිංචි කිරීම හා කලා ශිල්පීන්ගේ කලා ශිල්ප දියුණුවට පියවර ගැනීම.

(උ) පළාතට විශේෂිත කෞතුකාගාර පිහිටුවීම හා පවත්වාගෙන යාම.

**03**. එකී පරමාර්ථ ඉෂ්ටකර ගැනීමේ කාර්ය සඳහා මින් මතු දැක්වෙන විධිවිධාන වලට අනුකූලව අමාත්‍යවරයා විසින්, උපදේශ මණ්ඩල ආදිය පිහිටුවීම.

(අ) උපදේශක මණ්ඩලයක්,

(ආ) පළාත් අධ්‍යක්ෂකවරයකු යටතේ ස්ථිර කාර්ය මණ්ඩලයකින් යුතු පරිපාලන ඒකකයක්,

(ඇ) ආගමික සාහිත්‍ය හා කලා සංවර්ධන අරමුදල් ගිණුමක්, සහ

(ඈ) භාරකාර මණ්ඩලය විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන වෙනත් යම් මණ්ඩලයක් ආයතනයක් හෝ ඒකකයක් පිහිටවනු ලැබිය හැකිය.

## 1 වන කොටස

**04**. (1) ඉහත 2 වගන්තියේ දක්වා ඇති පරමාර්ථ ඉටු කිරීම සඳහා ඒ වගන්තියේ සඳහන් පරමාර්ථ වලට අදාළ කාරණා පිළිබඳ නිපුණත්වයක් ඇති තැනැත්තන් විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන 15 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වන උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර ඔවුන් අතුරෙන් එක් තැනැත්තකු ඒ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. උපදේශ මණ්ඩලය හා අනු මණ්ඩල

(2) දෙවන උප වගන්තියේ දක්වා ඇති පරමාර්ථ වලට ඇතුළත් වන එක් එක් විෂය සඳහා අනු මණ්ඩලයක් බැවින් සංයුක්ත වන සේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන අනු මණ්ඩල අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

(3). අදාළ විෂයය භාර පළාත් අධ්‍යක්ෂවරයා මේ වගන්තියේ විධිවිධාන යටතේ පත් කරනු ලැබූ එක් එක් මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතුය.

(4) ඉල්ලා අස්වීම, මරණය හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතු කොටගෙන කලින් තම ධුරය හිස්කළහොත් මිස, එසේ පත් කරනු ලැබූ සමාජිකයකු විසින් එසේ පත් කරන ලද දින සිට අවුරුදු තුනක කාලයක් තම ධුරය දැරිය යුතුය.

(5) පත්කරනු ලැබූ සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා වෙත යවන ලිපියක් මගින් කවර වේලාවකදී වුවද තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකිය.

(6) පත්කරනු ලැබූ සාමාජිකයකු තම ධුර කාලය ඉකුත් වීමට පෙර ඉල්ලා අස්වූ අවස්ථාවලදී ඒ වෙනුවට වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලැබූ සාමාජිකයකු විසින් තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ශේෂ වී ඇති ධූර කාලය තුල පමණක් ධූරය දැරිය යුතුය.

(7) කාලය ඉකුත් වීම නිසා හෝ ඊට පෙර හෝ තම ධූරය හිස් කරන සාමාජිකයෙක් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නුසුදුස්සකු බවට පත්වී නැත්නම් නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙකු වන්නේය.

(8) රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව ගොස් සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධූරයෙන් කටයුතු කිරීමට පත් කරන ලද යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(9) සභාපතිවරයා ඇතුළුව පත් කරනු ලැබූ යම් සාමාජිකයෙකුගේ විෂමාචාර ක්‍රියාවක් හේතු කොට ගෙන අමාත්‍යවරයාට ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(10) යම් තැනැත්තකු,

(අ) සාපරාධී වරදක් සඳහා රුපියල් පන්සියයක් ඉක්මවන දඩයට හෝ (අත් හිටවූ සිර දඬුවමක් ද ඇතුළුව) බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩනයකට හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ අධිකරණයක් විසින් යටත් කොට තිබුණහොත්, හෝ

(ආ) බරපතල විෂමාචාර චෝදනා පිට සේවයෙන් ඉවත් කරනු ලැබූ තැනැත්තකු වුවහොත්, හෝ

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකුව හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුව හෝ සිටී නම් නැතහොත් එවැන්නකු බවට පත් වුවහොත් එවැනි තැනැත්තකු යට කී මණ්ඩලයට සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එවැනි සාමාජිකයෙකු වශයෙන් ධුරයේ සිටීමට හෝ නුසුදුස්සෙකු වන්නේය.

(11) පහත දැක්වෙන අවස්ථාවකදී සාමාජිකයකුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

(අ) ඔහු ඉල්ලා අස්වුවහොත්,

(ආ) ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්,

(ඇ) ප්‍රඥප්තියේ නිශ්චිත දක්වා ඇති ධුර කාලය අවසන් වුවහොත්,

(ඈ) රුපියල් පන්සියයකට වැඩි දඩයකින් හෝ අත්හිටවූ සිර දඬුවමක්ද ඇතුළුව බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩනයකින් ශ්‍රී ලංකාවේ නැතහොත් වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් ඔහුට දඬුවම් කර තිබුණහොත්, හෝ,

(ඉ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු බවට පත් වුවහොත් හෝ,

(ඊ) මණ්ඩලයේ අනුයාත රැස්වීම් තුනකට පැමිණීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ,

## II වන කොටස

## කාර්ය මණ්ඩලය

**05.** (1) මේ ප්‍රඥප්තිය යටතේ පවරනු ලබන වගකීම් හා කාර්යය යථා පරිදි ඉටු කිරීම සඳහා පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයකු පත්කරනු ලැබිය යුතුය. පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා වශයෙන් ඔහු වෙත මේ ප්‍රඥප්තිය යටතේ පවරනු ලබන යුතුකම් හා කාර්යය යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය.

පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා සහ අනෙකුත් නිලධාරීන්

(2) සහකාර සංස්කෘතික අධ්‍යක්ෂවරයකු හෝ ඊට වැඩි ගණනක්ද මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන්ද පත් කරනු ලැබිය හැකිය.

(3) මේ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති යටතේ පත් කරනු ලබන සියළු නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

(4) මේ ප්‍රඥප්ති යටතේ ක්‍රියා කරන යම් නිලධරයකු විසින් සත් භාවයෙන් කරන ලද හෝ නොකරන ලද හෝ යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

(5) මේ වගන්තිය යටත් පත් කරන ලද සියළු නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ තම කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීමේදී අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(6) පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා අදාළ බඳවා ගැනීම් පටිපාටි සහ ඔවුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා ඔවුන්ගේ සේවා කොන්දේසි ආදිය ප්‍රඥප්තිය විශේෂයෙන් සඳහන් කොට නොමැති විට, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකිය.

## III කොටස

## මුදල්

**06.** (1) දකුණු පළාත් ආගමික සාහිත්‍ය හා කලා සංවර්ධන අරමුදල් ගිණුමේ ආරම්භක ප්‍රාග්ධන රුපියල් ලක්ෂ 02ක් වන්නේය. එම මූලික ප්‍රාග්ධනය ප්‍රධාන අමාත්‍යවරයා විමසා මුදල් විෂයය භාර

අරමුදල් ගිණුමේ ආරම්භක ප්‍රාග්ධනය

පළාත් අමාත්‍යවරයා විසින් නිශ්චිත කරනු ලබන වාරිකවලින් පළාත් අරමුදල් ගිණුමින් ගෙවනු ලැබිය යුතුය.

(2) අරමුදල් ගිණුමේ ප්‍රාග්ධනය පළාත් සභාවේ යෝජනා සම්මුතියක් මගින් අනුමත කරනු ලබන පරිදි කලින් කල වැඩිකරනු ලැබිය හැකිය.

දකුණු පළාත් ආගමික සාහිත්‍ය සහ කලා අරමුදල් ගිණුම

**07.** (1) දකුණු පළාත් සභා අරමුදල යටතේ පවත්වාගෙන යනු ලබන ආගමික සාහිත්‍ය හා කලා සංවර්ධන අරමුදල නමින් ගිණුමක් පිහිටවනු ලැබිය යුතුය.

(2) පහත දැක්වෙන මුදල් ඒ අරමුදලට බැර කළ යුතුය :-

(අ) ඉහත සඳහන් පරමාර්ථ ඉටුකිරීමේ කාර්යය සඳහා කලින් කලට දකුණු පළාත් සභාව විසින් සම්මත කරනු ලබන මුදල්.

(ආ) පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ යෝජනා පරිදි වෙන් කරනු ලබන පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන.

(ඇ) යම් දේශීය හෝ විදේශීය ආයතනයකින් හෝ රටකින් ලැබෙන සියළු මුදල් හා ද්‍රව්‍ය ආධාර.

(ඈ) යම් පුද්ගලයකු හෝ පුද්ගල සමූහයක් විසින් පිරිනමන මුදල් හා ද්‍රව්‍ය පරිත්‍යාග.

(ඉ) විවිධ ප්‍රසංග, කොඩි දින, ලොතරැයි, චිත්‍රපටි හා නාට්‍ය සංදර්ශන ආදී විවිධ ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් හා භාණ්ඩ

(3) භාරකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත යුතු වීමේ කොන්දේසි මත (2) වන උප වගන්තියේ (ඇ) (ඈ) හා (ඉ) ඡේද යටතේ ලැබෙන මුදල් අරමුදලේ ගිණුමට භාර ගැනීම සම්පූර්ණයෙන්ම භාරකාර මණ්ඩලයේ අභිමතය අනුව විය යුතුය.

(4) යම් නිශ්චල හෝ චංචල දේපළ පරිත්‍යාගයක් මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා යෙදීම පිණිස භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සහ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබිය හැකිය. එවැනි යම් දේපළක් විකිණීමෙන් ලැබෙන මුදල් අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය හැකිය.

(5) භාරකාර මණ්ඩලය විසින් නිශ්චිත කරනු ලබන පරිදි පහත දැක්වෙන පරිදි ගෙවීම් අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(අ) මේ ප්‍රඥප්තියෙහි පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය වන සියළු මුදල්,

(ආ) පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මේ ප්‍රඥප්තියේ පරමාර්ථ වලට අදාළව කෙරෙන යොජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියළු මුදල්,

(ඇ) ආගමික සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රවල ප්‍රදානය කරනු ලබන සම්මාන හිමි කරගත් තැනැත්තන්ට ගෙවනු ලැබීමට නියමිත සියළු මුදල්,

(ඈ) යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස හෝ ආණ්ඩුවේ යම් ණය මුදලක හෝ ණයකරවල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය සියළු මුදල්.

(6) (i) රාජ්‍ය බැංකුවක විවෘත කරනු ලබන තැන්පතු ගිණුම තුළින් අරමුදල් ගිණුම ක්‍රියාත්මක විය යුතුය.

(ii) යථෝක්ත බැංකු ගිණුම ක්‍රියාත්මක කිරීම සඳහා චෙක්පත් අත්සන් කිරීමේ බලය භාරකාර මණ්ඩලයේ ලේකම් භාණ්ඩාගාරික හෝ පළාත් සංස්කෘතික අධ්‍යක්ෂක සතුය.

(iii) ගෙවීමට අදාළ පරිදි චෙක්පත් මඟින් හෝ මුදලින් ගෙවිය හැකිය.

(iv) මෙම අරමුදලේ ගිණුමේ සියළු ලැබීම් හා ගෙවීම් සහ එයට අදාල සියළු කටයුතු සම්බන්ධ ගිණුම් පවත්වාගෙන යාම භාණ්ඩාගාරික සතුය.

(v) ගිණුම පවත්වාගෙන යාම ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට හා පළාත් අරමුදල සම්බන්ධයෙන් වන 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ තුන්වන පරිච්ඡේදයේ විධිවිධාන වලට යටත් විය යුතුය.

(vi) වර්ෂයක් පාසා අරමුදලේ ගිණුම් නිසි පරිදි විගණනය කළ යුතු අතර එක් එක් ලිත් වර්ෂය අවසන් වූ පසු හැකිතාක් ඉක්මණින් අරමුදලේ ගිණුමේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙළ කොට විගණන

නිලධාරියාගේ වාර්තාව ද සමග එම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(vii) අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(viii) අරමුදල් ගිණුමේ සඳහන් නොවන හෝ ගැටළුමය අවස්ථාවකදී භාරකාර මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන්නේය.

## IV වන කොටස

## භාරකාර මණ්ඩලය

**08**. (1) මේ ප්‍රඥප්තියේ පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීම සඳහා පිහිටුවන ලද ආගමික සාහිත්‍ය හා කලා අරමුදල් ගිණුමේ කටයුතු මෙහෙයවීම සඳහා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශය මත දකුණු පළාත් අණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතුය. භාරකාර මණ්ඩලය

(අ) දකුණු පළාත් සභා සංස්කෘතික අමාත්‍යවරයා / ඔහු භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය;

(ආ) දකුණු පළාත් සභා සංස්කෘතික අමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ / ඔහු භාරකාර මණ්ඩලයේ ලේකම්වරයා වන්නේය;

(ඇ) දකුණු පළාත් සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී /ඔහු භාරකාර මණ්ඩලයේ භාණ්ඩාගාරිකවරයා වන්නේය;

(ඈ) විපක්ෂ නායකවරයාගේ එකඟතාවය මත විපක්ෂ නියෝජනය කරන දකුණු පළාත් සභා මන්ත්‍රීවරු දෙදෙනෙක්;

(ඉ) දකුණු පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයා.

(2) භාරකාර මණ්ඩලයේ වගකීම් බලතල හා කාර්යයභාරය පහත දැක්වෙන පරිදි වන්නේය;

(අ) දෙවන වගන්තියේ සඳහන් පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, සහ

(ආ) අරමුදල තර කර ගැනීම සඳහා මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීමට පියවර ගැනීම, අරමුදල් පිරිනැමීම හා එයට අදාළ අනෙකුත් සංවිධානාත්මක කටයුතු ඉටු කිරීම.

## V වන කොටස

## පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය

**09**. අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි පහත සඳහන් කාර්යය සඳහා (මෙහි මින් මතු පුහුණු මධ්‍යස්ථාන යනුවෙන් හඳුන්වනු ලබන) පුහුණු පර්යේෂණ සහ සේවා මධ්‍යස්ථාන එකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටවනු ලැබිය හැකිය. පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම

(අ) නැටුම්, සංගීතය, චිත්‍රකර්මය, ප්‍රතිමා ශිල්පය, සිනමාකරණය හා රූපවාහිනී වැඩසටහන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ ලලිතකලා සම්බන්ධ රැස්වීම්, වැඩමුළු, සම්මේලන යනාදිය පැවැත්වීම.

(ආ) සංදර්ශන, ප්‍රසංග, ප්‍රදර්ශනාදිය පැවැත්වීම.

(ඇ) කලා මාධ්‍ය සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සේවා හා දත්ත තොරතුරු සැපයීම, සහ

(ඈ) දේශීය විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

**10**. අමාත්‍යවරයා විසින් නියමයන් මඟින් පහත දැක්වෙන කාරණා තීරණය කරනු ලැබිය හැකිය. නියෝග

(අ) බඳවා ගැනීමේ පටිපාටි;

(ආ) අධ්‍යාපනයට පුහුණුවට හා විභාග වල වලට අදාළ නිර්දේශ පත්‍රිකා; සහ

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි ඒ ඒ ආයතනවලට අධ්‍යක්ෂකවරුන් සහකාර අධ්‍යක්ෂකවරුන් ගුරුවරුන් උපදේශකයන් සහ වෙනත් නිලධරයන් පත් කිරීම ඔවුන්ට පරිශ්‍රමික ගෙවීම් හා ඔවුන් විෂයෙහි විනය පාලනය පැවැත්වීම.

**11**. (1) මේ ප්‍රඥප්තිය යටතේ පහත දැක්වෙන බලතල භාරකාර මණ්ඩලය වෙත පැවරෙන්නේය. පුහුණු මධ්‍යස්ථාන සඳහා පහසුකම් සැලසීම ආදිය සඳහා භාරකාර මණ්ඩලය සතු බලය.

(අ) පුහුණු ආයතන වලට අවශ්‍ය පහසුකම් සැපයීම හා පුහුණු කිරීම නේවාසික පහසුකම් හා වෙනත් කාර්ය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, ඒවා නඩත්තු කිරීම හා ඒවාට උපකරණ සැපයීම සම්බන්ධයෙන්;

(ආ) ශිෂ්‍යයන්ගේ හා ආචාර්ය මණ්ඩලයේ විනය හා සුභ සාධන ඇති කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන්; සහ

(ඇ) ඒ ආයතන මගින් සහතික පත් හා සම්මාන ප්‍රදානය කිරීමට විධිවිධාන සැලසීම සම්බන්ධයෙන්;

(2) මේ ප්‍රඥප්තියේ ඉහත සඳහන් කරුණු වලට අමතරව භාරකාර මණ්ඩලය විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන මණ්ඩලයක් ආයතනයක් හෝ ඒකකයක් පිහිටුවීමට බලය ඇත.

**12.** මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස : අර්ථ නිරූපණය

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ සංස්කෘතික කටයුතු විෂය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වෙයි.

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව අදහස් වෙයි.

"ගිණුම" යන්නෙන් දකුණු පළාතේ ආගමික සාහිත්‍ය හා කලා අරමුදල් ගිණුම.

"පළාත" යන්නෙන් දකුණු පළාත අදහස් වෙයි.

"ලේකම්වරයා" යන්නෙන් දකුණු පළාතේ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වෙයි.

"සංස්කෘතික අධ්‍යක්ෂවරයා" යන්නෙන් දකුණු පළාතේ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරයා අදහස් වෙයි.

**13.** මේ ප්‍රඥප්තියේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

12 - 187

## 25. 2001 අංක 03 දරණ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**1.** මෙම ප්‍රඥප්තිය 2001 අංක 03 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** 1989 අංක 06 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (අ) (ආ) ඡේද 2001.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1989 අංක 06 දරන ප්‍රඥාප්තියේ දෙවන වගන්තියේ සංශෝධනය කිරීම.

(අ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප සහ දීමනාව රුපියල් හත් දහසක්ද (7 000) ද :

(ආ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ මාසික වැටුප සහ දීමනාව රුපියල් පන්දහස් පන්සීයයක් (5 500) ද ගෙවිය යුත්තේය.

3. 1999 අංක 01 දරන සංශෝධනය ප්‍රඥප්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

## 26. 2002 අංක 01 දරණ දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය

දකුණු පළාතේ කාර්මික ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරිම, සංවර්ධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන අධිකාරියක් පිහිටුවීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතට අනුකූල වූවකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** මේ ප්‍රඥප්තිය 2002 අංක 01 දරන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඒ සඳහා ආණ්ඩුකාරවරයා විසින් අනුමතය දෙනු ලැබූ යම් දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

### I වැනි කොටස
### කාර්මික සංවර්ධන අධිකාරිය

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය පිහිටුවීම

**2.** (මෙහි මින් මතු මේ ප්‍රඥප්තිය "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය යනුවෙන් හැඳින්වෙන අධිකාරියක් පිහිටවනු ලැබිය යුතු ය.

අධිකාරිය සංස්ථාවක් විය යුතු බව

**3.** අධිකාරියේ 2 වැනි වගන්තිය යටතේ එයට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින්ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

අධිකාරියේ පරමාර්ථ

**4.** අධිකාරියේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය.

(අ) දකුණු පළාතේ කර්මාන්ත පිහිටුවීම හා සංවර්ධනය දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරිම;

(ආ) කාර්මික ව්‍යාපෘති පිහිටුවිමේ කාර්ය සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන් දකුණු පළාතට ආකර්ශණය කර ගැනීම සහ අවශ්‍ය උපදෙස් දීමෙන් ඒ ආයෝජකයන්ට සහාය වීම.

(ඇ) මූලික පහසුකම් සුලභව ලබා ගත හැකි ස්ථාවර ආර්ථිකයක් හා ආයෝජනය සඳහා සුදුසු පරිසරයක් ඇති කිරීමට කටයුතු කිරීම.

(ඇ) අභ්‍යාස වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, වැඩසටහන්, සම්මේලන, අධ්‍යාපනික චාරිකා සහ කාර්මික පර්යේෂණ පැවැත්වීම මගින් ව්‍යාපාරික නිපුණතා වැඩි දියුණු කිරීමට අදාළ අභ්‍යාස සහ අධ්‍යාපනික කටයුතු භාර ගැනීම;

(ඉ) කාර්මික සංවර්ධනයට අදාල තොරතුරු හා දැනුම පතල කිරීම.

(ඊ) පළාතේ කර්මාන්තකරුවන් අතර සුහද සබඳතා ඇති කිරීමෙහි ලා ඔවුන් දිරිමත් කිරීම සහ සියලු කාර්මික ව්‍යාපාර නියමාකාරයෙන් සම්බන්ධීකරණය කිරීම හා එවායේ වර්ධනය අන්තර් සබඳතා ගොඩනැගීම මගින් ප්‍රවර්ධනය කිරීම;

(උ) පළාත ඇතුලත නිෂ්පාදන සඳහා වෙළඳපොලවල් ඇති කිරීම සහ පළාතෙන් පිටත වෙළඳපොලවල් හසුකර ගැනීම;

(ඌ) අලෙවියට අදාළ ආධාර ලබා ගැනීමට අදහස් කරන කර්මාන්තකරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(එ) කර්මාන්ත නවීකරණය සඳහා අවශ්‍ය කාර්මික දැනුම ලබාගැනීමට පහසු කිරීම හා කාර්මික නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා මූලාධාර දීම;

(ඒ) කළමණාකරණය, නිෂ්පාදනය හා බෙදාහැරීම පිළිබඳ නවීන ක්‍රම ඇති කිරීමෙහි ලා ධෛර්යමත් කිරීම සහ කාර්ය ඵලය පිළිබඳ තත්ත්ව වර්ධනය හා දියුණුව ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඔ) අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අධිකාරියේ පරමාර්ථ වලට අදාළ වෙනත් සංවර්ධන කටයුතු භාර ගැනීම.

**5.** 4 වැනි වගන්තියේ ඇතුලත් කරුණු සියල්ලම හෝ ඒ අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් නැතහොත් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම අධිකාරියේ වගකීම වන්නේය. අමාත්‍යවරයාට උපදෙස් දීම

**6.** අධිකාරිය විසින් - අධිකාරියේ බලතල හා කර්තව්‍ය

(1) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට දීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම;

(2) අධිකාරිය වෙත පවරන ලද හෝ අධිකාරිය විසින් අත් කරගන්නා ලද යම් ඉඩමක ගොඩනැගිලි ඉදි කිරීම;

(3) යම් බැංකුවක හෝ බැංකු වල ජංගම , ඉතිරි කිරීමේ හෝ තැන්පත් ගිණුම් විවෘතකර පවත්වාගෙන යාම;

(4) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාර , පෙළඹවීම සහිත නිශ්පාදන දීරිගැන්වීම;

(5) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරිම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු හවුල් ගිවිසුම් .කොන්ත්‍රාත්තු හෝ සාමුහික ගිවිසුම් වලට කෙලින්ම හෝ ඒ සඳහා බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයෙකු මගින් ඇතුලත් වීමේ හා ඒ කටයුතු ඉටු කිරිම;

(6) සෑම කාර්මික සංවර්ධන ක්ෂේත්‍රයකම පර්යේෂණ පවත්වාගෙන යාම හා ඒ කටයුතු වලට සහය වීම සහ ඒ කටයුතු සම්බන්ධීකරණය කිරීම;

(7) අධිකාරිය විසින් ඉටු කරන ලද සේවාවන් සහ අධිකාරිය විසින් කුලියට දෙන ලද හෝ බදු දෙන ලද ගොඩනැගිලි, පරිශ්‍ර හෝ උපකරණ සම්බන්ධයෙන් ගාස්තු හා කුලී අය කර ගැනීම;

(8) අධිකාරිය වෙත සපයන ලද සේවාවන් හෝ අධිකාරිය වෙත කුලියට හෝ බද්දට දෙන ලද ගොඩනැගිලි, පරිශ්‍ර හෝ උපකරණ සම්බන්ධයෙන් ගාස්තු හෝ කුලී ගෙවීම;

(9) කාර්ය මණ්ඩලය පත් කිරීම, පුහුණු කිරීම, ඔවුන්ට වේතන හා වැටුප් ගෙවීම, නිවාඩු දීම හා කාර්ය මණ්ඩලයේ සේවා අවසන් කිරීම ඇතුළු ඔවුන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(10) කාර්ය මණ්ඩලය වෙත රාජකාරි ලැයිස්තුවක් සැපයීම, ඔවුන්ගේ වැඩ කටයුකු ඇගයීම හා ඊට අදාළ ක්‍රියා මාර්ග ගැනීම;

(11) අධිකාරියේ නිලධරයන්, සේවකයන් හා වෙනත් සේවා නියුක්තයන්ගේ ප්‍රයෝජනය සඳහා අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රම හා වෙනත් යම් සුබ සාධක යෝජනා ක්‍රමයක් පිහිටුවීම;

(12) අධිකාරියේ අභිප්‍රායන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය

යන්ත්‍රෝපකරණ, උපකරණ හා වාහන ආනයනය කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් ලබා ගැනීම ;

(13) අධිකාරියේ අභිප්‍රායන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වියදම් දැරීම ;

(14) ප්‍රාදේශීය ප්‍රභවයන්ගෙන් සහ ලංකාණ්ඩුව හරහා විදේශීය සහ ජාත්‍යන්තර ප්‍රභවයන්ගෙන් චංචල හා නිශ්චල දෙවර්ගයේම දේපළ, ප්‍රදාන, පරිත්‍යාග, රික්තවර්ණ, ද්‍රව්‍යාධාර, උපදේශාත්මක සේවා සහ මූල්‍යාධාර සහ වෙනත් යම් වර්ගයේ ආධාර පිළිගැනීම සහ ලබා ගැනීම ;

(15) මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව, අධිකාරියේ අභිප්‍රායන් මුදුන් පමුණුවා ගත හැකි වක පරිදි, දේශීය හෝ විදේශීය හෝ සංවිධාන හෝ කාර්ය මණ්ඩලය සමග ඒකාබද්ධ ව්‍යවසාය හෝ හවුල් ව්‍යාපෘති වලට ඇතුලත් වී, ඒවා ක්‍රියාත්මක කිරීම ;

(16) අධිකාරියේ තර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණ, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව බැංකු, මූල්‍ය සංවිධාන හෝ වෙනත් යම් ආණ්ඩුවේ හෝ පෞද්ගලික සංවිධානවලින් ණය හෝ අයිරා මාර්ගයෙන් ණයට ගැනිම;

(17) අධිකාරියේ මග පෙන්වීම යටතේ විවිධ කර්මාන්ත හා රැකියා උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීමේ කාර්යය සඳහා පහසුකම් සැපයීම, ප්‍රාග්ධන ආයෝජන වලට දායක වීම, පහසුකම් සහ වෙනත් ආම්පන්න ප්‍රදානය කිරීම කරනු ලැබිය හැකිය;

අධිකාරියේ නියෝජ්‍යායතන හා දෙපාර්තමේන්තු

**7**. අධිකාරියේ අභිප්‍රායයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, අධිකාරිය විසින් දෙපාර්තමේන්තු හා නියෝජ්‍යායතන කාර්යාල පිහිටුවනු ලැබිය හැකිය.

කර්මාන්ත ලියාපදිංචි කිරීම

**8**. (1) ආණ්ඩුව විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් පිහිටුවා හෝ පවත්වාගෙන යනු ලබන කර්මාන්තයක්, ව්‍යවසායක් හෝ ව්‍යාපෘතියක් හැර, දකුණු පළාත ඇතුළත ක්‍රියාත්මකව පවතින කර්මාන්තයක් විසින්, අධිකාරියෙහි ලියාපදිංචි කරනු ලැබීම පිණිස නියමිත ආකෘතියෙන් අධිකාරිය වෙත ඉල්ලුම් කළ යුතුය.

(2) කර්මාන්තයට අදාළ ගාස්තු සහ කර්මාන්තයක් ලියාපදිංචි කිරීමේ දී යටත් කරනු ලැබිය යුතු කොන්දේසි නියමිත පරිදි විය යුතුය.

(3) ඉල්ලුම්කරු නියමිත කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇති බවට හා නියමිත ගාස්තු ගෙවා ඇති බවට මණ්ඩලය සෑහීමකට පත් වේ නම් , මණ්ඩලය විසින් ඒ කර්මාන්තය ලියාපදිංචි කර, ලියාපදිංචි කිරිමේ සහතිකයක් ප්‍රදානය කරනු ලැබිය යුතුය.

## II වැනි කොටස

## අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය

**9**. (1) අධිකාරියේ කළමණාකරණය සහ පරිපාලනය අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතුය. මේ ප්‍රඥප්තිය මගින් අධිකාරිය වෙත පැවරුණු යම් බලයක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය. නැතහොත් යම් කර්තව්‍යයක් ඉටු කරනු ලැබිය හැකිය.

(2) අධ්‍යක්ෂක මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය :-

i. පහත දැක්වෙන නිල බලයෙන් යුත් සාමාජිකයන්ගෙන්-

(අ) දකුණු පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්);

(ආ) දකුණු පළාත් සභාවේ කර්මාන්ත නියෝජ්‍ය ලේකම්;

(ඇ) දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්;

(ඇ) දකුණු පළාත් කාර්මික සංවර්ධන මණ්ඩලයේ කළමණාකරු;

(ඉ) දකුණු පළාත් හස්ත කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක;

(ඊ) 1979 අංක 40 දරණ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නම් කරනු ලැබූ ඒ මණ්ඩලයේ නියෝජිතයෙක්;

(උ) 1982 අංක 35 දරණ පනත යටතේ පිහිටුවන ලද ජාතික ශිල්ප සභාව විසින් නම් කරනු ලැබූ ඒ සභාවේ නියෝජිතයෙක්;

(ඌ) 1996 අංක 18 දරණ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් විසින් නම් කරනු ලැබූ, ඒ අධිකාරියේ නියෝජිතයෙක්.

i. මෙහි මින්මතු “ පත් කළ සාමාජිකයන් ” යනුවෙන් සඳහන් කරනු ලබන, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් පස් දෙනෙකුගෙන් -

(අ) දකුණු පළාතේ බැංකු ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයක් ලැබූ තැනැත්තෙක්;

(ආ) දකුණු පළාතේ පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවෙක් ; සහ

(ඇ) කර්මාන්ත හා වාණිජ ක්ෂේත්‍රයේ ඔප්පු කළ හැකි පළපුරුද්දක් ඇති සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ඈ) හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ඔප්පු කළ හැකි පළපුරුද්දක් ඇති තැනැත්තෙක්.

(3) අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් කෙනෙකු මණ්ඩලයේ සභාපති වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය .

**10** යම් තැනැත්තෙකු -

සාමාජිකයෙකු වීමට නුසුදුසුකම්

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාළන ආයතනයක මන්ත්‍රීවරයෙකු හෝ වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ තමා සිහිවිකල් තැනැත්තෙකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම් හෝ ;

(ඇ) මණ්ඩලය විසින් හෝ ඒ වෙනුවෙන් ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරයි නම්,හෝ භුක්ති විඳී නම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද යම් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයන් තමා විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්,

(ඉ) මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තමා විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේදී හානිකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් තමාට ඇත්නම්,
ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙකු විය යුතු ය.

**11.** සෑම පත් කරනු ලැබූ සාමාජිකයෙක්ම, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධූරය අත් හරිනු ලැබුවහොත් මිස , තම පත් වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධූරය දැරිය යුතු අතර, ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

පත් කරනු ලැබූ සාමාජිකයන්ගේ ධූර කාලය

**12.** (1) මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපති පැමිණ නොමැති විට පැමිණ ඇති සාමාජිකයන් අතරින් තෝරා ගනු ලැබූ යම් සාමාජිකයෙකු විසින් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතුය.

මණ්ඩලයේ සභාපතිවරයා

(2) මණ්ඩලයේ තිරණ ක්‍රියාත්මක කිරීමේදී උද්ගත වන්නා වූ ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත උපදෙස් හා මාර්ගෝපදේශ ලබාදීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

(3) මේ පරමාර්ථ ඉෂ්ට කර ගැනිම තහවුරු කර ගැනීම සඳහා අධිකාරියේ කටයුතු පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය සහ මෙහෙයවීම සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතු වන්නේ ය.

**13.** (1) නියමිත හේතු දක්වා යම් පත් කළ සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

පත් කරනු ලැබූ සාමාජිකයන් ඉවත්කිරීම හා ඉල්ලා අස්වීම

(2) යම් පත් කරනු ලැබූ සාමාජිකයෙකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ධූරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් 9 වැනි වගන්තියේ (2) 11 වැනි උපවගන්තියෙහි විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලැබූ යම් සාමාජිකයෙකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉකුත් නොවූ ධූර කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(3) යම් පත් කරනු ලැබූ සාමාජිකයෙකුට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලද ලිපියක් මගින් යම් අවස්ථාවකදී ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) (අ) රෝගාතුරවීම, දුබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම නිසා ස්වකීය ධූරයේ කාර්යය ඉටු කිරීමට, පත් කළ සාමාජිකයෙකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකියාව පිළිබඳව අමාත්‍යවරයාට ලියවිල්ලකින් දැන්වීම, ඒ සාමාජිකයාගේ යුතුකම විය යුතුය. ඉක්බිතිව 9 වැනි වගන්තියේ

(2) වැනි උප වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

(ආ) රෝගාතුර වීම, දුබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොට ගෙන ස්වකීය ධූරයෙහි කාර්යය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඒ නොපැමිණි කාල පරිච්ඡේදය තුළ දී කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයෙකු පත් කරනු ලැබිය හැකිය.

**14.** (1) මණ්ඩලය, අවශ්‍ය වන සියලු අවස්ථාවල දී හා යටත් පිරිසෙයින් සෑම මසකට ම වරක්වත් රැස්විය යුතු ය. මණ්ඩලයේ රැස්වීම

(2) මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට හා ඒ යටතේ සාදන ලද යම් රීතියකට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් පිළිබඳ කාර්ය පරිපාටිය හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම විධිමත් කරනු ලැබිය හැකිය.

(3) සෑම මණ්ඩල රැස්වීමක් පිළිබඳවම සත් දිනක පූර්ව දැනුම් දීමක් සෑම සාමාජිකයෙකු වෙතම ලියවිල්ලකින් කළ යුතුය. ඒ දැන්වීමෙහි ඒ රැස්වීම සඳහා වූ න්‍යාය පත්‍රය ඇතුලත් විය යුතුය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් පස්දෙනෙකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් මණ්ඩලයෙහි විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය හැකිය.

(6) යම් රැස්වීමක ඡන්ද සමානත්වයක් වූ විට, සභාපතිවරයාට ස්වකීය ඡන්දය අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතු ය.

**15**. මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් සත් දෙනෙකු විය යුතුය. ගණ පූරණය

**16**. මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලය සඳහා වූ වාර්ෂික වැඩසටහන් පිළියෙල කරනු ලැබිය යුතුය. වැඩසටහන

**17.** මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීම හේතුවෙන් හෝ එහි යම් සාමාජිකයෙකු ගේ පත්වීමෙහි යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් , තීරණයක් හෝ නීති කෘත්‍යයක් බලරහිත ලෙස සලකනු නොලැබිය යුතුය.

පුරප්පාඩුවක් පැවතීමේ හේතුවෙන් ක්‍රියා නිර්බල නොවන බව

**18**. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව , අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතුය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**19**. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කර, සකස් කරනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය.

අධිකාරියේ මුද්‍රාව

(2) අධිකාරියේ මුද්‍රාව, මණ්ඩලයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(3) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලයේ අනුදැනුම ඇතිව මිස සහ තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කරනු ලැබිය යුතු සභාපතිවරයා හා මණ්ඩලයේ එක් සාමාජිකයෙකු ඉදිරියේ හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතුය ;

(4) මණ්ඩලයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ යම් රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබිය යුතුය.

**20**. ස්වකීය බලතල හා වගකීම ක්‍රියාත්මක කිරිමේ දී අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ උපදෙස් වලට මණ්ඩලය යටත් විය යුතු අතර , ඒ උපදෙස් ක්‍රියාත්මක කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතුය.

මණ්ඩලය වෙත දෙනු ලබන අමාත්‍යවරයාගේ උපදෙස්

**21**. (1) මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ මණ්ඩලය වෙත පවරන ලද , බලතල පනවන ලද හෝ නියම කරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් යම් සාමාජිකයෙකුට හෝ නිලධරයෙකුට මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි ය.

මණ්ඩලය විසින් හා කාර්යය පැවරීම

(2) ඒ සාමාජිකයා හෝ නිලධරයා ඒ බලය, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරිමේ දී හෝ ඉටු කිරීමේ දී මණ්ඩලයේ සාමාන්‍ය හා විශේෂ විධානවලින් යටත් විය යුතුය.

**22.** අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව මණ්ඩලය විසින් , කමිටු පත් කිරීම.

(අ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි , යම් සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත යම් කමිටු පත් කරනු ලැබිය හැකිය.

(ආ) ඒ කමිටුවල නිර්ණය විෂය, බලතල, කර්තව්‍ය හා කාර්ය නිශ්චය කරනු ලැබිය හැකිය.

(ඇ) ඒ කමිටුවල කටයුතු පවත්වාගෙන යාම සඳහා රීති සාදනු ලැබිය හැකිය.

## III කොටස

## අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් හා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පත් කිරිම, ඔහුගේ බලතල හා කාර්යය

**23.** (1) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා හා ලේකම් විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයකු, මණ්ඩලය විසින් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය යුතුය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය හා විශේෂ විධාන වලට යටත්ව, හා සභාපතිවරයාගේ සාමාන්‍ය අධීක්ෂණයට යටත්ව මණ්ඩලය විසින් තමා වෙත පවරනු ලැබිය හැකි යම් බලතල , කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම අධ්‍යක්ෂක ජනරාල් විසින් කරනු ලැබිය යුතුය. අධිකාරියේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පරිපාලනය හා විනය පාලනය සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය;

(3) මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවලට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලය විසින් ඔහුට භාරදෙන බලතල කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම ඉටු කිරීම කළ යුතු අතර ඔහු විශේෂයෙන්ම,

(අ) අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරවන ලද තැනැත්තන්ගේ අභියෝග්‍යතා වැඩි දියුණු කිරීම;

(ආ) අධිකාරියේ කාර්යය ඵලය වැඩි දියුණු කිරීම; සහ

(ඇ) අධිකාරියේ අභිප්‍රායයන් මුදුන් පත් කර ගැනීම සඳහා අවශ්‍ය සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

**24**. (1) මණ්ඩලයේ කර්තව්‍ය නියමාකාරයෙන් හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය සලකන යම් නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකිය.

අධිකාරියේ වෙනත් කාර්ය මණ්ඩලය

(2) මේ ප්‍රඥප්තියෙන් වෙනත් විධිවිධාන වලට යටත්ව, මණ්ඩලය විසින්

(අ) අධිකාරියේ යම් නිලධරයෙකු හෝ සේවකයෙකු සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ ඔවුන් සේවයෙන් පහ කිරීම කරනු ලැබිය හැකි ය.

(ආ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකිය.

(ඇ) ඒ නිලධරයන්ගේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කරනු ලැබිය හැකිය.

(ඈ) අධිකාරියේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා අර්ථසාධක අරමුදලක් හා වෙන යම් සුබසාධක යෝජනා ක්‍රමයක් පිහිටුවා විධිමත් කරනු ලැබිය හැකිය.

## IV කොටස

## මුදල් හා ගිණුම්

**25**. (1) (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන ) කාර්මික සංවර්ධන ගිණුම යනුවෙන් හඳුන්වනු ලබන, දකුණු පළාතේ අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.

කාර්මික සංවර්ධන ගිණුම

(2) අරමුදලට-

(අ) දකුණු පළාත් සභාව මගින් කලින් කල වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණ;

(ආ) සේවා සැපයිම මගින් අධිකාරිය විසින් ලබා ගන්නා සියලු අදායම ;

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව විදේශ ආධාර, ප්‍රදාන හා පරිත්‍යාග, රික්ව්වරණ හා ණය මගින් අධිකාරිය විසින් ලබාගත හැකි සියලු මුදල් ප්‍රමාණ ;

(ඈ) අධිකාරියේ යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමෙන් ලත් මුදල්වලින් අධිකාරිය විසින් ලබාගත හැකි සියලු මුදල් ප්‍රමාණ; සහ

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී අධිකාරිය විසින් ලබා ගන්නා වෙනත් ආදායම්,

ගෙවනු ලැබිය යුතුය.

විගණනය සහ ගිණුම්

**26**. (1) මණ්ඩලයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ විධිවිධාන සහ දකුණු පළාත් සභා රීති ද අධිකාරියේ ගිණුම් විගණනය පිළිබඳ කාරණා සම්බන්ධයෙන් අදාල විය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය.

**27**.අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

අධිකාරියේ මුදල් ආයෝජනය කිරීම

**28**. අධිකාරියට අයත් යම් මුදල් ප්‍රමාණයක් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකිය.

## V වැනි කොටස
## සාමාන්‍ය විධිවිධාන

නියෝග

**29**. (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය යුතු යැයි හෝ නියෝග සෑදිය යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

එසේ අනුමත කරනු නොලැබූ එවැනි යම් නියෝගයක්, අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

**30**. (1) නියම කරනු ලැබිය යුතු යැයි මේ ප්‍රඥප්තිය මගින් නියමිත හෝ රීති සෑදිය යුතු යයි මේ ප්‍රඥප්තිය යටතේ බලය දෙන ලද සියළු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකිය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදන ලද කිසිම රීතියක් එය පළාත් සභාව විසින් අනුමත කර, ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතුය.

රාජ්‍ය නිලධරයන් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කිරිම

**31**. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, දකුණු පළාතේ පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයෙකු ඒ නිලධරයාගේ සහ ඒ නිලධරයා සේවයේ නියුක්ත කරන ලද අමාත්‍යාංශයේ සහ දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා පළාත් සභාවට සේවය කිරීමට එකඟ වී ඇති, පළාත් සභාව සමග ගිවිසුමකට ඇතුලත් වූ යම් තැනැත්තෙකු අධිකාරිය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට කරන ලද යම් සේවා කාල පරිච්ඡේදයක්, ඒ ගිවිසුම යටතේ ඔහුගේ බැඳීම් ඉටු කිරිමේ කාර්යය සඳහා පළාත් සභාවට කරන ලද යම් සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ සේවා නියුක්තයන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

**32**. අධිකාරියේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

නඩු කටයුතු පිළිබඳ ආරක්ෂාව

**33**. (1) (අ) මේ ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අධිකාරියට විරුද්ධව,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ මණ්ඩලයේ විධානය මත තමා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, අධිකාරියේ නිලධරයෙකුට, සේවකයෙකුට හෝ අනුයෝජිතයෙකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ අධිකාරිය විසින් හෝ ඊට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරණ ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර,එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය වෙත ගෙවන ලද හෝ අධිකාරිය විසින් අය කරගන්නා ලද නඩු ගාස්තු කිසිවක් ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය මත තමා විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ තමාට විරුද්ධව ඉදිරියේ කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය පිළිගන්නේ නම් (1) වැනි උප වගන්තියෙහි (ආ) ඡේදයෙහි සඳහන් එවැනි යම් තැනැත්තෙකු විසින් දරන ලද යම් වියදමක් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේදී ඔහු විසින් අය කර ගනු ලැබ ඇත්නම් මිස, ඒ වියදම අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

**34.** එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසුව මාස හයක කාලයක් ඇතුලත ඒ වර්ෂය තුළ අධිකාරියේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් දැක්වෙන වාර්තාවක් මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

මණ්ඩලයේ වාර්තාව පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු බව

**35**. මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක, විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙකු, මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස එකක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

නිලධරයන් හා කාර්ය මණ්ඩලය දණ්ඩ නීති සංග්‍රහයට යටත් විය යුතු බව

**36**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ

අර්ථ නිරූපණය

"මණ්ඩලය" යන්නෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ;

"සභාපතිවරයා"යන්නෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ;

"ආණ්ඩුකාරවරයා "දකුණු පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාත් සභාවේ කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"මුදල් විෂයය භාර අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාත් සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"පළාත යන්නෙන් "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයේ දක්වා ඇති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ;

"පළාත් සභාව"යන්නෙන්, දකුණු පළාත් සභාව අදහස් වේ.

## 27. දකුණු පළාත් සභාවේ 2002 අංක 02 දරණ සමාජ සේවා ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ දිළිඳු හා අසරණ ජන කොටස් සඳහා හා ආබාධිත පුද්ගලයන් සඳහා ආධාර සහ සහනාධාර ලබාදීම, වාසස්ථාන අහිමි වයෝවෘද්ධ තැනැත්තන් සඳහා වැඩිහිටි හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා පවත්වා ගෙන යාම, විවිධ රෝගාබාධ සඳහා ආධාර සහ සහනාධාර සැපයීම ආදී වශයෙන් දකුණු පළාතේ ආර්ථික හා සමාජීය වශයෙන් පසුබෑමකට ලක්වූ ජන කොටස් වලට විවිධ සේවා හා පහසුකම් සැපයීම සඳහා ද එසේ පහසුකම් සලසන්නාවූ ස්වේච්ඡා සංවිධානවල කටයුතු විධිමත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**1.** මේ ප්‍රඥප්තිය "දකුණු පළාත් සභාවේ අංක 02 දරණ සමාජසේවා ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වන දිනය

**2.** මේ ප්‍රඥප්තියේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුය.

ප්‍රඥාප්තියේ පරමාර්ථ

(අ) දකුණු පළාත තුළ පදිංචි දිළිඳු හා අසරණ තැනැත්තන්ට සහ ආබාධිත තැනැත්තන්ට ආධාර හා සහනාධාර සැපයීම;

(ආ) වයෝවෘද්ධ තැනැත්තන් සඳහා නිවාස පිහිටුවීම හා පවත්වාගෙන යාම;

(ඇ) ආබාධිත හා මන්ද බුද්ධික පුද්ගලයින් සඳහා නිවාස පිහිටුවා පවත්වා ගෙනයාම ඔවුන් සඳහා ආධාර හා සහනාධාර ලබාදීම සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම;

(ඈ) හදිසි ව්‍යසන අවස්ථාවලදී විපතට පත්වූවන්ට සහනාධාර සැලැස්වීම;

(ඉ) විවිධ රෝගාබාධ සහිත තැනැත්තන්ට ආධාර හා සහනාධාර සැපයීම;

(ඊ) ඉහත කී කාර්යවල යෙදී සිටින ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම හා ඔවුන්ට අවශ්‍ය මග පෙන්වීම සහ

(උ) ආබාධිත හා මන්ද බුද්ධික පුද්ගලයින් සහ වැඩිහිටියන් සඳහා පවත්වාගෙන යන ආයතනවලට ආධාර සැපයීම සහ ඒවා විධිමත් කිරීමට කටයුතු කිරීම;

(ඌ) ආබාධ සහිත පුද්ගලයන්ට උපකරණ සැපයීම.

නිලධාරීන් පත් කිරීම

**3**. (1) 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 1 වන ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) අංක 7 යටතේ විමධ්‍යගත කරන ලද සමාජසේවා විෂයය සඳහා සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් පත්කරනු ලැබ දකුණු පළාතේ ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල සේවයේ යොදවා සිටින සමාජ සේවා නිලධාරීන් මෙම ප්‍රඥප්තිය යටතේ දකුණු පළාත් සභාවේ සමාජසේවා අමාත්‍යාංශයට අනුයුක්ත කරනු ලැබිය හැකිය.

(2) දකුණු පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යාංශයට පළාත් අධ්‍යක්ෂවරයෙකු සහ සමාජසේවා සහකාර ලේකම්වරයෙකු පත්කරනු ලැබිය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන කාර්ය හා කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් සමාජසේවා පළාත් අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

(4) පළාත් අධ්‍යක්ෂවරයාගේ බලතල හා කාර්යභාරය අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු අතර, මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ මුදුන් පත්කර ගැනීම සඳහා ඔහු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතුය.

(5) මේ ප්‍රඥප්තිය යටතේ අපේක්ෂිත කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සමාජසේවා නිලධාරීන් පත්කරනු ලැබිය හැකිය.

(6) මේ ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලබන සියලුම නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ නිලධාරීන් ලෙස සලකනු ලැබිය යුතුය.

(7) මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියාකරන යම් රාජ්‍ය නිලධාරියෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද හෝ යම් කාර්යයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

(8) මෙම ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (3) වන සහ (4) වන උප වගන්ති යටතේ පත් කරන ලද සියලුම නිලධාරීන් තම බලතල ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ නියෝගවලට හා විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

දකුණු පළාත් සමාජසේවා අරමුදල් ගිණුම

**4**. (1) දකුණු පළාතේ සමාජසේවා කටයුතු ඉටු කිරීමේදී ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා (මෙහි මින් මතු "අරමුදල් ගිණුම" යනුවෙන් සඳහන් කරන්නාවූ) "දකුණු පළාත් සමාජසේවා අරමුදල් ගිණුම" යනුවෙන් හැඳින්වෙන්නා වූ ගිණුමක්, පළාත්සභාවේ අරමුදලේම ගිණුමක් වශයෙන් ආරම්භ කොට පවත්වා ගෙන යා යුතුය.

(2) මෙම අරමුදල් ගිණුම, 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ III වැනි කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(3) මෙම අරමුදල් ගිණුමට, පහත සඳහන් මුදල් බැර කළ යුතුය:-

(අ) රජයේ මුදල් ආධාර වශයෙන් වරින්වර ප්‍රදානය කරනු ලබන මුදල්

(ආ) දකුණු පළාත් සභාව විසින්, අරමුදල් ගිණුමේ කාර්ය සඳහා සම්මත කරනු ලබන මුදල්

(ඇ) යම් පුද්ගලයෙකු, ආයතනයක් හෝ සංවිධානයක් මඟින් කෙරෙන පරිත්‍යාග මඟින් ලැබෙන සියලුම මුදල්;

(ඈ) පළාත් සභා පනතේ 22 වගන්තිය යටතේ රජය විසින් ලබාදෙන විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියලුම මුදල්;

(ඉ) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රමවලින් ලබා ගන්නා සියලුම මුදල්

(4) මේ ප්‍රඥප්තියේ පරමාර්ථ ඉටුකර ගැනීමේදී දරනු ලබන වියදම් සඳහා අවශ්‍ය වන සියලු මුදල් ඒ අරමුදලින් ගෙවිය යුතුය.

(5) එසේ වුවද, යම් නිශ්චිත කාර්යයන් සඳහා යෙදවිය යුතුය යන කොන්දේසිය මත ඉහත (3) උප වගන්තියේ (ඇ), (ඈ) සහ (ඉ) ඡේද යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක එම මුදල් අරමුදලේ ගිණුමේ බැරට භාර ගැනීම අමාත්‍යවරයාගේ අභිමතය පරිදි විය යුතුය.

**5.** (1) අමාත්‍යවරයාගේ අභිමතය පරිදි, පත් කරනු ලබන මණ්ඩලයක උපදේශකත්වය යටතේ, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, අරමුදල් ගිණුම පවත්වාගෙන යෑමේ වගකීම අමාත්‍යාංශ ලේකම්වරයා සතුය. අරමුදල් ගිණුම පාලනය කිරීම

(2) එක් එක් ලිත් වර්ෂය සඳහා සම්පූර්ණ ලෙස හා උචිත ලෙස ගිණුම පවත්වාගෙන යෑමට ලේකම්වරයා විසින් විධිවිධාන සැලැස්විය යුතුය.

(3) එක් එක් ලිත් වර්ෂය අවසන් වී මාස 6 තුළ අරමුදල් ගිණුමේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සකස් කළ යුතුය.

(4) 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ II විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, අරමුදල් ගිණුමේ මුදල් පාලනය සහ ගණන් හිලව් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(5) අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතුය. අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය

**6**. (1) රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන, දකුණු පළාත් සභා රීති, අරමුදල් ගිණුමේ, ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

අරමුදල් ගිණුමේ මුදල් විගණනය

(2) අමාත්‍යවරයා විසින් ලිත් වර්ෂය අවසන් වී මාස 9 ක් ඇතුළත එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදල් ගිණුමේ පරිපාලනය ගැන වූ වාර්තාවක් ද, එම අරමුදල් ගිණුමේ විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම්වල පිටපතක්ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ දකුණු පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයලට හා දකුණු පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

අරමුදල් ගිණුම පිළිබඳ වාර්තා

**7**. මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කරනු ලබන වැඩ සටහන් වෙනුවෙන් අදාළ උපදේශක මණ්ඩලයේ නිර්දේශය මත, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ගෙවීම් කටයුතු කළ හැකිය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්

**8**. (1) අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්ය සඳහා ශිෂ්‍යත්ව පිහිටුවනු ලැබිය හැකිය.

ශිෂ්‍යත්ව පිහිටුවීම

(අ) සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නව ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු හා පරිපාලන ක්ෂේත්‍රයේ දී ඇතිවන අනුබද්ධ ගැටළු විසඳීමේ විධික්‍රම පිළිබඳව දැනුමක් ලබාදීම;

(ආ) සමාජසේවා සංවර්ධන ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳ නියුක්ත සමාජසේවා නිලධාරීන්ට හා සමාජසේවා ආයතනවල අධිකාරීන්ට ඔවුන්ගේ කටයුතුවලට අදාළ නව තාක්ෂණ දැනුම ලබාදීම;

(ඇ) ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කාර්ය සඳහා ක්‍රියාශීලී දායකත්වයක් දක්වන ස්වේච්ඡා සමිතිවල හා කාන්තා බල මණ්ඩලවල සාමාජිකාවන්ට නායකත්වය හා වෙනත් කළමනාකරණ හැකියාවන් පිළිබඳව වැඩිපුර දැනුමක් ලබා දීම සහ;

(ඈ) ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ විවිධ ආබාධිත පුද්ගලයින්ට ඔවුන්ගේ නිර්මාණශීලී දක්ෂතා දියුණුකර ගැනීම සඳහා වැඩිපුර දැනුමක් ලබාදීම;

(2) ඉහත සඳහන් ශිෂ්‍යත්ව සඳහා දේශීය හා විදේශීය අරමුදල් උපයෝගී කරගත හැකිය.

(3) මෙම ශිෂ්‍යත්ව සඳහා අරමුදල් යෙදවීම හා ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීම, අමාත්‍යවරයාගේ අවසාන තීරණයන්ට යටත් වේ.

9\. (1) සමාජසේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරන ව්‍යවස්ථාව අනුව, කටයුතු කිරීමට සියලුම ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානවල නිලධාරීන් බැඳී සිටිය යුතුය.

ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම

(2) ලියාපදිංචි කරන ලද සියලුම ස්වේච්ඡා සමිතිවලට අදාළ ලේඛනයක් සමාජසේවා අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යා යුතුය.

10\. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට හා අනුමත ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියා කරන බවට චෝදනා ලැබ, අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියමයෙන් පවත්වන ලද විධිමත් පරීක්ෂණයකින් වැරදිකරුවන් වන යම් ස්වේච්ඡා සමිතියක හෝ සංවිධානයක කළමනාකරණ මණ්ඩලය විසුරුවා හැරීමට, අමාත්‍යාංශ ලේකම්වරයාට බලය තිබේ.

ස්වේච්ඡා සමිතියක හෝ සංවිධානයක කළමනාකරණ මණ්ඩල විසිරුවා හැරීම

(2) ඉහත සඳහන් ලෙස කළමනාකරණ මණ්ඩලය විසුරුවා හරින ලද සමිතියේ හෝ සංවිධානයේ ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ එය නැවත ප්‍රතිසංවිධානය කිරීමට හෝ අවශ්‍ය කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට බලය තිබේ.

(3) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතියකට හෝ සංවිධානයකට අයත් සියලුම දේපල සමාජසේවා අමාත්‍යාංශය වෙත පැවරේ. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නම් කරනු ලබන නිලධාරියකුට එම දේපළ භාරදී නිදහස් වනතුරු විසුරුවා හරින ලද නිලධාරී මණ්ඩලය වගකීමෙන් නිදහස් නොවේ.

11\. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ සමාජසේවා විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

අර්ථ නිරූපණය

"අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ සමාජසේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

"දේපළ" යන්නෙන් ස්වේච්ඡා සමිති සතු පොත්පත් ලේඛන, අත ඉතිරි හා බැංකුවේ ඇති මුදල්, ලී බඩු, උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම් යන සියලුම දේපල අදහස් වේ.

## 28. දකුණු පළාත් සභාවේ 2006 අංක 01 දරන පුස්තකාල ප්‍රඥප්තිය

දකුණු පළාතේ පාඨකයන්ගේ පාඨක අවශ්‍යතාවයන් සහ අභිලාෂයන් ඉටු කිරීමේ අරමුණින් දකුණු පළාත තුළ පුස්තකාල සේවා මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ;

**1**. මේ ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 2006 අංක 01 දරන පුස්තකාල සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා විසින් ස්වකීය අනුමැතිය දෙන ලද දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය. — ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

### I වන කොටස
### දකුණු පළාතේ පුස්තකාල සේවා මණ්ඩලයක් පිහිටුවීම

**2**. (1) (මෙහි මින්මතු "මණ්ඩලයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) දකුණු පළාතේ පුස්තකාල සේවා මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතුය. — දකුණු පළාත් පුස්තකාල සේවා මණ්ඩලයක් පිහිටුවීම

(2) මණ්ඩලය (1) වන උප වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් සංස්ථාව විසින් නඩු පැවරීම ද සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය'

**3**. දකුණු පළාතේ පාඨකයන්ගේ පාඨක අවශ්‍යතාවයන් හා අභිලාෂයන් ඉටු කිරීමේ අදහසින් දකුණු පළාත තුළ පුස්තකාල සැලසුම් කිරීම, පිහිටුවීම, පුස්තකාල නිසි ආකාරයෙන් පවත්වා ගෙන යාම, සම්බන්ධීකරණය කිරීම සහ පරිපාලනය කිරීම මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍ය විය යුතුය. — මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍යයන්

**4**. 3 වන වගන්තියේ විධිවිධාන වල ව්‍යාප්තියට අගතියක් නොමැති මණ්ඩලයේ අනෙකුත් කර්තව්‍යයන් පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය. — මණ්ඩලයේ අනෙකුත් කර්තව්‍යයන්

(අ) පුස්තකාල සහ තොරතුරු සේවාවන් පිළිබඳව අමාත්‍යවරයාට අවශ්‍ය උපදෙස් ලබා දීම;

(ආ) පළාත් මධ්‍යම පුස්තකාලයක් පිහිටුවා පවත්වාගෙන යාම සහ එය පරිපාලනය කිරීම සහ ඒ පළාත් මධ්‍යම පුස්තකාලය දකුණු පළාතේ ප්‍රධාන පුස්තකාලය වශයෙන් සංවර්ධනය කිරීම;

(ඇ) පළාතේ එක් එක් දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් කලාපීය පුස්තකාල පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ ඒවා පරිපාලනය කිරීම;

(ඈ) පවතින අරමුදල් වලට අනුව දකුණු පළාතේ පළාත් පාලන බල ප්‍රදේශ සඳහා පුස්තකාල පිහිටුවීම පවත්වා ගෙන යාම සහ ඒවා පරිපාලනය කිරීම;

(ඉ) දකුණු පළාතේ පුස්තකාල සේවාවන් වෙනුවෙන් සුදුසු ප්‍රතිපත්තියක් නිර්ණය කිරීම සහ එහි සෑම පුස්තකාලයක් විසින්ම පවත්වා ගෙන යා යුතු ප්‍රමිතීන් නිර්දේශ කිරීම;

(ඊ) පුස්තකාල විද්‍යාව සහ ප්‍රලේඛනය පිළිබඳව පුද්ගලයින් පුහුණු කර වීම;

(උ) මණ්ඩලය විසින් පිහිටුවනු ලැබූ එක් එක් පුස්තකාලයට අනුබද්ධ පාඨක සංගම් පිහිටුවා එමගින් එකී පුස්තකාලය සහ මණ්ඩලය අතර මනා සම්බන්ධීකරණයක් ඇති කරමින් එකී පුස්තකාලය මනාව පවත්වා ගෙන යාම;

(ඌ) විශේෂයෙන්ම මහළු නිවාස වල නේවාසිකයින්ට සහ බන්ධනාගාරගත වූවන්ට පුස්තකාල සේවාවන් සැපයීමේ අරමුණින් මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ පුස්තකාල වලට අනුබද්ධව ජංගම පුස්තකාල සේවා පිහිටුවීම සහ පවත්වා ගෙන යාම;

(එ) දකුණු පළාතට විශේෂ වැදගත්කමක් ඇති පොත්පත් ලේඛන වාර්තා එක් රැස් කොට සංරක්ෂණය කිරීම;

(ඒ) ඓතිහාසික වටිනාකමක් ඇති පොත් ලේඛන වාර්තා සහ ඒවායේ මුල් පිටපත් එක් රැස් කොට සංරක්ෂණය කිරීම;

(ඔ) දකුණු පළාතේ පුස්තකාල සේවාව වැඩිදියුණු කිරීමේ අදහසින් ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි අනෙකුත් පුස්තකාල සේවාවන් සමග සම්බන්ධීකාරකව සහ සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඕ) තරුණ පරපුර වෙත පුස්තකාල වලට දායක වීමේ අගය වටහා දීමට සහ ඔවුන් අතර කියවීමේ පුරුදු වඩවාලීමට සහ ඒ සඳහා ඔවුන් උනන්දු කර වීමට සම්මන්ත්‍රණ, දේශන, ප්‍රදර්ශන සහ අදාළ වෙනත් වැඩ සටහන් සංවිධානය කිරීම.

**5**. (1) 4 වන වගන්තිය යටතේ පිහිටවනු ලබන දකුණු පළාත් මධ්‍ය පුස්තකාලය පළාතේ ප්‍රධාන පුස්තකාලය ලෙස ක්‍රියා කළ යුතුය.

පළාත් මධ්‍ය පුස්තකාලයේ කර්තව්‍යය

(2) 20 වන වගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා පළාත් මධ්‍ය පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපති ලෙස ක්‍රියා කළ යුතුය.

(3) අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා පළාත් මධ්‍ය පුස්තකාලයට අවශ්‍ය කාර්යය මණ්ඩලය පත් කළ යුතුය.

(4) පළාත් මධ්‍ය පුස්තකාලය විසින්, මණ්ඩලය විසින් පවත්වාගෙන යන අනෙකුත් පුස්තකාල වලට අවශ්‍ය වෘත්තීමය සහ කාර්මික උපදෙස් හා අනෙකුත් උපකරණ හා ද්‍රව්‍යමය අවශ්‍යතාවයන් සපයා දිය හැකිය.

**6**. (1). අමාත්‍යවරයා විමසා ප්‍රධාන අමාත්‍යවරයා පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතුය:-

මණ්ඩලයේ සංයුතිය

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අමාත්‍ය මණ්ඩලයේ පුස්තකාල සේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(අ) පළාතේ, පළාත් පාලන අධ්‍යක්ෂවරයා;

(ඇ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙක්;

(ඈ) ශ්‍රී ලංකා පුස්තකාල සේවා මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයෙකු;

(ඉ) දකුණු පළාතේ විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන හෝ කාර්මික අධ්‍යාපන ආයතන වල ප්‍රධාන පුස්තකාලාධිපතිවරුන් අතරින් පත් කරනු ලබන සාමාජිකයෙකු;

(ඊ) දකුණු පළාතේ පළාත් පාලන ආයතන සම්මේලනය මගින් නම් කරනු ලබන එක් සාමාජිකයකු;

(උ) ඕනෑම විෂය ක්ෂේත්‍රයක ප්‍රවීනත්වය ලැබූ, පුස්තකාල සේවා සංවර්ධනය කොට වැඩි දියුණු කිරීම සඳහා උනන්දුවක් දක්වන දකුණු පළාතේ ස්ථිර පදිංචි තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක්

(2) 1 වන උප වගන්තියේ (ඇ), (ඉ), (ඊ) සහ (උ) ඡේද යටතේ පත්කළ සාමාජිකයකු මෙහි මින්මතු "පත්කළ සාමාජික" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතුය.

සාමාජික ධූර කාලය

7. (1) සෑම පත් කළ සාමාජිකයෙකු මිය යාමෙන්, ඉල්ලා අස් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් කළහොත් මිස ඔහුගේ පත් වීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ධූරය දැරිය යුතු අතර ධූරයෙන් ඉවත් කරනු ලැබ ඇත්තේ නම් මිස, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතුය.

(2) නිල බලයෙන් පත් වූ 6 වන වගන්තියේ (අ), (ආ), සහ (ඇ) ඡේද වල සඳහන් කරනු ලැබූ සාමාජිකයින් තමා මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් දැරීම හේතුවෙන් ද ඒ තනතුර දරන තාක් කල් ධූරය දැරිය යුතුය.

මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට නුසුදුසුකම්

8. යම් තැනැත්තෙකු

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුව සිටීම නතර වුව හොත්;

(ඇ) මණ්ඩලය විසින් හෝ මණ්ඩලය වෙනුවෙන් ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් යටතේ වූ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් දරයි නම් හෝ භුක්ති විදියි නම්;

(ඈ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහු විසින් ඔහුගේ කාර්යය ඉටුකිරීමෙහි ලා හානිකර ලෙස බලපෑමට ඉඩ තිබෙන යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් දරයි නම්; හෝ

(ඉ) ඔහු ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්වන නීතිය මගින් මානසික රෝගියෙකු ලෙස ප්‍රකාශයට පත් කර ඇත්නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙකු විය යුතුය.

පත් කළ සාමාජිකයින් ධූරයෙන් ඉවත් කිරීම හා ඉල්ලා අස්වීම.

9. (1). ප්‍රධාන අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා හේතු දක්වා යම් පත් කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(2) යම් පත් කළ සාමාජිකයෙකු මිය යාමෙන්, ඉල්ලා අස් වීමෙන්, හෝ ඉවත් කරනු ලැබූ අවස්ථාවක (6) වන වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත් වෙමින් ප්‍රධාන අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීමට වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකි අතර එසේ පත් කර ගනු ලැබූ යම් සාමාජිකයෙකු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයෙකු වෙනුවට ද ඔහු විසින් ඒ අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දරනු ලැබිය යුතුය.

(3) යම් පත් කළ සාමාජිකයෙකු තමා ධූරයෙන් ඉල්ලා අස්වන බවට ප්‍රධාන අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් කවර හෝ වේලාවක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස් විය හැකිය.

(4) (අ) යම් පත් කළ සාමාජිකයකුට, අසනීප වීම අබලතාවට පත් වීම හෝ මාස 6 කට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධූරයේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, එසේ නොහැකිවීම පිළිබඳ ලියවිල්ලකින් ප්‍රධාන අමාත්‍යවරයා වෙත දැනුම් දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතුය;

(ආ) පූර්ව දැනුම් දීමකින් තොරව අනුගාමී රැස්වීම් 3 කට පැමිණීමට අසමත් වී ඇති යම් පත් කළ සාමාජිකයකු ඔහු නැවත පත් කරනු ලැබ ඇත්නම් මිස ඒ තුන්වන රැස්වීම් දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වී ඇති ලෙස සැලකිය යුතුය.

**10**. ප්‍රධාන අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකිය. සාමාජිකයන්ගේ පරිශ්‍රමික

**11**. (1). මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින මණ්ඩලයේ සියළු රැස්වීම් වල මූලාසනය ඔහු විසින් දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක උප සභාපතිවරයා ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතුය. සභාපතිවරයා සහ උප සභාපතිවරයා යන දෙදෙනාම මණ්ඩලයේ රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවක ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරාපත් කරගනු ලබන යම් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරීමට තෝරා පත් කර ගත යුතුය. සභාපතිවරයා සහ රැස්වීම් කටයුතු මෙහෙයවීම

(2). මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් 4 දෙනෙක් විය යුතුය.

(3). මෙම ප්‍රඥප්තියේ අනෙකුත් විධිවිධාන වලට සහ ඒ යටතේ සාදන ලද යම් රීති වලට යටත්ව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වේලාවක දී හා ස්ථානයකදී අවශ්‍ය ඕනෑම විටෙක මණ්ඩලය රැස්විය හැකි අතර මණ්ඩලය යටත් පිරිසෙයින් සෑම තුන් මසකටම වරක් හෝ රැස්විය යුතු අතර මණ්ඩලය විසින් තම රැස්වීම් වල කටයුතු කිරීම සම්බන්ධයෙන් කාර්යය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකිය.

පුරප්පාඩු හේතුකොට ගෙන මණ්ඩලයේ ක්‍රියාවන් බල රහිත නොවිය යුතු බව

**12**. මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ නීති කෘත්‍යයක් මණ්ඩලයේ පවතින යම් පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයෙකු පත් කිරීමේ දී සිදුවන යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන බල රහිත වන්නේ යැයි නොසැලකිය යුතුය.

මණ්ඩලයේ බලතල සාමාජිකයන් වෙත පැවරීම

**13**. මේ ප්‍රඥප්තියෙන් මණ්ඩලය වෙත පිරිනැමුණු හෝ නියම කෙරුණු හෝ පැවරුණු යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පවරනු ලැබිය හැකි අතර ඒ සාමාජිකයා විසින් ඒ බලය කාර්යය හෝ කර්තව්‍යය මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන වලට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව

**14**.(1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කොට සකස් කර ගත හැකි අතර එය මණ්ඩලය විසින් නිශ්චය කරන යම් ආකාරයකට වෙනස් කර ගනු ලැබිය හැකිය.

(2). මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතුය.

(3) මණ්ඩලයේ අවසර ඇතිව සහ මණ්ඩලයේ සභාපතිවරයා හා එක් සාමාජිකයකු ඉදිරිපිටදී හැර මණ්ඩලයේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ වෙනත් ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ දෙදෙනා ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතුය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හෝ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වා ගත යුතුය.

**15**. මණ්ඩලය විසින්:- මණ්ඩලයේ බලතල

(අ) යම් නිශ්චල හෝ චංචල දේපලක් දැරීම බද්දට ගැනීම හෝ බද්දට දීම උකස් කිරීම ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) මණ්ඩලයට ලැබුණු හෝ මණ්ඩලය විසින් අත්කර ගත් යම් ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම;

(ඇ) කෙලින්ම හෝ තත් කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයෙකු හෝ නියෝජිතයකු මගින් මණ්ඩලයේ කර්තව්‍යය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු ගිවිසුම් වලට ඇතුලත් වීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඈ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම;

(ඉ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මුදල් ණයට ගැනීම;

(ඊ) ශ්‍රී ලංකාවේ හා පිටත ප්‍රභවයන්ගෙන් ප්‍රතිපාදන පරිත්‍යාග හා නිශ්චල හා චංචල රික්තවරණ පිළි ගැනීම සහ ලබා ගැනීම සහ ඒවා මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා යොදා ගැනීම;

(උ) මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් රීති සෑදීම.

(ඌ) පොදුවේ මණ්ඩලයේ කර්තව්‍ය යථා පරිදි ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය විය හැකි වෙනත් සියළු කාර්ය සහ දේ කිරීම.

යන බලතල ද ඇතුලත්ව මණ්ඩලයේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

**16**. අමාත්‍යවරයාගේ පූර්ණ අනුමැතිය ඇතිව, මණ්ඩලය විසින්, කමිටු පත් කිරීම

(අ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන කමිටු පත් කිරීම;

(ආ) එකී කමිටුවලට අදාළ කරුණු, ඒවායේ බලතල, කර්තව්‍ය සහ කාර්ය තීරණය කිරීම;

(ඇ) එකී කමිටුවල කටයුතු පවත්වාගෙන යෑම සඳහා රීති සෑදීම කරනු ලැබිය හැකිය.

## II වන කොටස

## මුදල්

**17**. (1) මණ්ඩලයට අරමුදල් ගිණුමක් තිබිය යුතුය. මණ්ඩලයේ අරමුදල් ගිණුම

(2) පහත දැක්වෙන මුදල් අරමුදල් ගිණුමට ගෙවනු ලැබිය යුතුය;

(අ) පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග හෝ රික්තවරණ ආධාර හෝ ප්‍රතිපාදන වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල්;

(ඇ) මණ්ඩලයේ යම් චංචල හෝ නිශ්චල දේපළ විකිණීමෙන් උපලබ්ධිතව මණ්ඩලයට ලැබෙන සියලු මුදල්.

(3) පහත දැක්වෙන මුදල් අරමුදල් ගිණුමෙන් ගෙවනු ලැබිය යුතුය;

(අ) මේ ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය විසින් ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී මණ්ඩලය විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්;

(ආ) මේ ප්‍රඥප්තිය මගින් හෝ එය යටතේ අරරමුදලින් ගෙවීමට බලය දෙන ලද හෝ අවශ්‍ය කරන සියළු මුදල්;

(4) මණ්ඩලය විසින් මණ්ඩලයේ ආදායම සහ වියදම වත්කම් බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතුය.

## III වන කොටස

## මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

**18**. (1) පුස්තකාල සහ ප්‍රලේඛන විද්‍යාව පිළිබඳ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති පුද්ගලයන් අතුරින්, අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, මණ්ඩලය විසින් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය යුතුය. මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා සහ මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරනු ලැබිය යුතුය.

(3) මණ්ඩලයේ පොදු විධානවලට යටත්ව, මණ්ඩලයේ කටයුතු පරිපාලනය සහ මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පාලනය අධ්‍යක්ෂ ජනරාල්වරයා භාරයේ පැවතිය යතුය. මණ්ඩලයේ සියළුම තීරණ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතුය.

(4) මණ්ඩලය විසින් තමා වෙත පවරනු ලබන බලතල, කර්තව්‍ය හා කාර්ය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතුය.

(5) මණ්ඩලයේ හෝ මේ පනත මගින් පිහිටුවන ලද යම් කමිටුවක රැස්වීමක දී ඡන්දය දීම හැර, පැමිණ කථා කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම් තිබිය යුතුය.

(6) අධ්‍යක්ෂ ජනරාල් ධූරය අධ්‍යක්ෂ ජනරාල්වරයා මිය යෑමේ දී හෝ සභාපතිවරයා අමතන ලද ලිපියක් මගින් ඉල්ලා අස් වූ විට හිස් විය යුතුය.

මණ්ඩලයේ අනෙකුත් කාර්ය මණ්ඩලය

**19**. (1) මණ්ඩලය විසින් ස්වකීය කර්තව්‍ය යථා පරිදි සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්ට යටත්ව;

(අ) මණ්ඩලයේ යම් නිලධරයෙකු හෝ සේවකයෙකුගේ විනය පාලනය කිරීම හෝ ඔහු සේවයෙන් පහ කිරීම.

(ආ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම;

(ඇ) ඒ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සේවා නියම හා සේවා කොන්දේසි නිශ්චය කිරීම;

(ඈ) මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් සහ වෙනත් යම් සුබසාධක යෝජනා ක්‍රම පිහිටුවීම සහ විධිමත් කිරීම හා එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකිය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම

**20**. (1) දකුණු පළාතේ පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධරයෙකු මණ්ඩලයේ ඉල්ලීම පිට සහ ඒ නිලධරයාගේ හා ඒ නිලධරයා සේවයේ නියුක්තව ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට මණ්ඩලයේ කාර්ය මණ්ඩලය තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(2) නියමිත කාලසීමාවක් සඳහා පළාත් සභාවට සේවය කිරීමට එකඟ වී පළාත් සභාව සමග ගිවිසුමකට එළඹුණු යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයේ යොදවනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් සේවා කාලයක් වේ නම් එය එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ඔහු විසින් පළාත් සභාවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

## IV වන කොටස

### සාමාන්‍ය

කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව

**21.** (1) (අ) මේ ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ද;

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයෙකු, නිලධරයෙකු, සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ද කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ද, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය වෙත ගෙවූ හෝ මණ්ඩල විසින් අය කර ගන්නා ගාස්තු කිසිවක් මණ්ඩලයේ අරමුදලට බැරකරනු ලැබිය යුතුය.

(3) (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේදී, ඔහු විසින් අය කර ගෙන ඇත්නම් මිස, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබුවේ යැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ තැනැත්තාට අරමුදලෙන් ගෙවනු ලැබිය යුතුය.

මණ්ඩලයේ වාර්තාව පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බව

**22.** එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු, මාස හයක කාලයක් ඇතුළත, ඒ මුදල් වර්ෂය ඇතුළත මණ්ඩලයේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සපයන වාර්තාවක් මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ අවසානයට පෙර අමාත්‍යවරයා විසින් ඒ වාර්තාව පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතුය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයට විධාන කළ යුතු බව

**23.** මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අමාත්‍යවරයා විසින් මණ්ඩලයට දෙනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට මණ්ඩලය යටත් විය යුතුය.

රීති

**24.** (1) මේ ප්‍රඥප්තිය යටතේ සෑදීමට බලය දෙනු ලැබූ රීති සම්බන්ධයෙන් හෝ මේ ප්‍රඥප්තිය මගින් නියම කළ යුතු යැයි නියමිත සියළු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකිය.

(2) මණ්ඩලය විසින් (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන කිසිම රීතියක් පළාත් සභාව විසින් අනුමත කරනු ලබන තෙක් සහ එකී අනුමැතිය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතුය.

**25.** මේ ප්‍රඥප්තියේ විධිවිධානයක් කඩ කරන සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේදී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය. වැරදි

**26.** මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**27.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

අර්ථ නිරූපණය

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන්, දකුණු පළාතේ අමාත්‍ය මණ්ඩලයේ පුස්තකාල සේවා විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"නියමිත" යන්නෙන්, මේ ප්‍රඥප්තියේ 24 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියමිත යන්න අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ දකුණු පළාත් සභාව අදහස් වේ.

06-112

## 29. දකුණු පළාතේ පළාත් සභාවේ 2007 අංක 01 දරන දකුණු පළාත් සභාවේ සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ 2007 අංක 01 දරන දකුණු පළාත් සභාවේ සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

මෙම ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට 1989 අංක 05 දරන දකුණු පළාත් සභාවේ දකුණු පළාත් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය අහෝසි වන්නේය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**01.** මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ පළාත් සභාවේ 2007 අංක 01 දරන දකුණු පළාත් සභාවේ සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

සභාවේ ලේකම්වරයා

**02.** (i) ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු වන අතර, ඔහු මෙහි අනුඡේදයන්හි විධිවිධානවලට යටත්ව යථා පැවැත්මෙන් සිටින තාක්කල් ස්වකීය ධූරය දරන්නේය.

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් හොබවන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ පන්තියේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සභාපතිවරයාගේ එකඟතාවය මත ලේකම් ධූරය සඳහා ඉහත (i) අනුඡේදය යටතේ පත්කළ හැකිය.

(iii) ලේකම්වරයාට ගෙවනු ලබන වැටුප්, දීමනා හා වරප්‍රසාද පළාත් අමාත්‍යාංශ ලේකම්වරයෙකු හට ගෙවනු ලබන වැටුප්, දීමනා හා වරප්‍රසාදවලට සමාන විය යුතු අතර, එය පළාත් සභා අරමුදලට වැය බරක් විය යුතුය.

(iv) ලේකම් ධූරය විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වන අතර,

(v) ලේකම්වරයා-

(අ) මියයාමෙන් හෝ

(ආ) ආණ්ඩුකාරවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන් හෝ

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ වෙනත් තනතුරකට ස්ථාන මාරුවීමෙන් හෝ

(ඇ) වයස අවුරුදු පනස්පහ සම්පූර්ණ වීමේදී හෝ ඊටපසු ඕනෑම අවස්ථාවකදී ආණ්ඩුකාරවරයාට දැනුම් දීමකට යටත්ව විශ්‍රාම ගැනීමේ මනාපය පළ කිරීමෙන් හෝ,

(ඉ) රෝගාතුරවීම නිසා හෝ ශාරීරික හෝ මානසික දුර්වලතාවයක් නිසා හෝ යම් විනය තීරණයක් මත හෝ ආණ්ඩුකාරවරයා විසින් ධූරයෙන් ඉවත් කිරීම නිසා හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම නිසා හෝ,

(ඊ) යම් අධිකරණයක් මගින් දෙනු ලැබූ තීන්දුවක් මගින් රුපියල් 1000 කට නොඅඩු දඩයක් නිසා හෝ සිර දඬුවමක් නිසා හෝ ලේකම් ධූරය හිස් වන්නේය. මෙයින් පරිබාහිරව වෙනත් කරුණක් මත ලේකම් ධූරය හිස් නොවන්නේය.

(උ) රෝගාතුරවීම නිසා හෝ වෙනත් දුබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ හේතු කොටගෙන ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට ලේකම්වරයාට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක (i) වැනි උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ආණ්ඩුකාරවරයා විසින් වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

**03.** (1) සභාවට ලේකම් කාර්යාලයක් තිබිය යුතු අතර, (මෙහි මින්මතු "ලේකම් කාර්ය මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) ලේකම් කාර්ය මණ්ඩලය, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව, ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය. ලේකම් කාර්යාලය හා ලේකම් කාර්ය මණ්ඩලය

(2) ලේකම් කාර්ය මණ්ඩලයේ නිලධරයන් සංඛ්‍යාව, කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ නිර්දේශය මත ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව වෙනස් කරනු ලැබිය හැකිය.

(3) ලේකම් කාර්ය මණ්ඩලයට නිලධරයන් පත් කිරීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලේකම්වරයා විසින් කරනු ලබන ඉල්ලීමක් මත ඒ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුතුය.

(4) 1989 අංක 5 දරන ව්‍යවස්ථාව යටතේ ලේකම් කාර්ය මණ්ඩලයට පත් කරන ලද නිලධරයන් මේ ව්‍යවස්ථාව ආරම්භ වන දින පටන් පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබිය යුතු අතර,

(අ) ලේකම් කාර්යාලයට කරනු ලැබූ ඔවුන්ගේ පත්වීම් දින, සියලු කාර්ය සඳහා පළාත් රාජ්‍ය සේවයට කරනු ලැබූ පත්වීම් දින ලෙස සලකනු ලැබිය යුතුය.

(ආ) ලේකම් කාර්යාලයේ ඔවුන්ගේ සේවා කාලය, පළාත් රාජ්‍ය සේවයේ සේවා කාලය මෙන් සළකනු ලැබිය යුතුය.

(ඇ) පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම හේතු කොට ගෙන, එය ලේකම් කාර්යාලයේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය කෙරෙහි හානිකර ලෙස බල නොපෑ යුතුය.

(ඈ) පළාත් රාජ්‍ය සේවයේ සමාන හෝ එම තනතුරම දරන සාමාජිකයෙකුගේ ජ්‍යෝෂ්ඨතාවයට, ඒ අන්තර්ග්‍රහණය කිරීම හානිකර ලෙස බල නොපෑ යුතුය.

**04.** ලේකම්වරයා විසින් ආණ්ඩුකාරවයාගේ පූර්ව අනුමැතිය ඇතිව, සේවයේ හදිසි අවශ්‍යතා අනුව අනියම් හෝ දෛනික පදනම මත නැතහොත් කොන්ත්‍රාත් පදනම මත උචිත පරිදි සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් ලේකම් කාර්ය මණ්ඩලයට තාවකාලික පත්වීම් කරනු ලැබිය හැකිය. වෙනත් පත්වීම්

**05.** (අ) පළාත් රාජ්‍ය සේවයේ යම් තනතුරක් දරන යම් තැනැත්තෙකු ලේකම් කාර්ය මණ්ඩලයට මාරු කිරීම, ඒ කාර්යය සඳහා ලේකම්වරයාගේ කැමැත්ත ප්‍රථමයෙන් ලබාගෙන කරනු ලැබිය හැකිය. මාරුවීම

(ආ) ලේකම්වරයා විසින් කරන ලද ඉල්ලීමක් මත ලේකම් කාර්ය මණ්ඩලයට පත් කරන ලද්දා වූ හෝ මාරු කරන ලද්දා වූ යම් තැනැත්තකු ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, ලේකම් කාර්ය මණ්ඩලයෙන් මාරු කරනු නොලැබිය යුතුය.

එසේ වුවද, එවැනි යම් නිලධරයෙකු සේවා නියුක්තිය සඳහා මුදා හැරීම, පහත දැක්වෙන හේතූන් නිසා හැර, ලේකම්වරයා විසින් සාමාන්‍යයෙන් ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතුය. එනම්,

(අ) ලේකම් කාර්ය මණ්ඩලයේ ඔහුගේ සේවය බැඳුම් කරයකට යටත් වූ අවස්ථාවක, හෝ

(ආ) ඔහුගේ සේවය බැඳුම්කරයකට යටත් නොවුවද ලේකම් කාර්යාලයේ සේවය කිරීම සඳහා ලේකම් කාර්යාලය විසින් ඔහු විශේෂයෙන් පුහුණු කරනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) එවැනි යම් නිලධරයෙකු මුදා හැරීම, ලේකම් කාර්යාලයේ කාර්ය කිරීමෙහිලා අහිතකර ලෙස බලපෑ හැකි යැයි ලේකම්වරයා සලකන අවස්ථාවක.

**06**. ලේකම් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධූරය පහත සඳහන් හේතූන් නිසා හිස්විය යුතුය. එනම්, — ධූරය අත්හැරීම

(අ) විශ්‍රාම යාම
(ආ) මාරු කිරීම
(ඇ) ඉල්ලා අස්වීම
(ඈ) ඉවත් කිරීම හෝ
(ඉ) මරණය

**07**. (1) ලේකම් කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු වැටුප් සහ වෙනත් දීමනා සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතුය. — කාර්ය මණ්ඩලයේ වැටුප් සහ දීමනා

(2) 5 වැනි වගන්තියේ (අ) ඡේදය යටතේ කාර්ය මණ්ඩලයට මාරු කරන ලද්දා වූ හෝ 3 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ පත් කරන ලද්දා වූ නිලධරයන්ට ඔවුන් ලේකම් කාර්යාලයේ සේවයේ සිටින තාක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව, වැටුපට අතිරේකව දීමනාවක් ගෙවනු ලැබිය හැකිය.

**08**. 9 වැනි වගන්තියේ සඳහන් කාර්ය මණ්ඩල උපදේශක සභාවේ නිර්දේශය මත, අලුත් නිලධරයන් පත් කිරීමට හැකිවන පරිදි සභාවේ වඩා හොඳ පරිපාලනයක් සඳහා අවශ්‍ය වන අලුත් තනතුරු හඳුනා ගැනීම ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතුය. — අලුත් තනතුරු ඇති කිරීම

**09**. (1) (මෙහි මින්මතු "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩල උපදේශක කමිටුවක් තිබිය යුතුය. — කාර්ය මණ්ඩල උපදේශක සභාව

(අ) සභාවේ සභාපති
(ආ) සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා
(ඇ) සභාවේ විරුද්ධ පක්ෂයේ නායක
(ඈ) ප්‍රධාන ලේකම්
(ඉ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සහ
(ඊ) සභාවේ ලේකම්

(2) සභාවේ සභාපති හා ලේකම් පිළිවෙලින් උපදේශක කමිටුවේ සභාපති හා ලේකම් විය යුතුය.

කාර්ය මණ්ඩල උපදේශක කමිටුවේ කර්තව්‍යය

**10**. කාර්ය මණ්ඩල උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතුය. එනම්,

(අ) 8 වැනි වගන්තියෙන් සඳහන් පරිදි අලුත් තනතුරු හඳුනා ගැනීම

(ආ) ලේකම් කාර්ය මණ්ඩලය සඳහා සැපයිය යුතු පහසුකම් හා වරප්‍රසාද නිශ්චය කිරීම

(ඇ) ලේකම් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව හා කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා නිශ්චය කිරීමේදී ආණ්ඩුකාරවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

නියෝග

**11**. ආණ්ඩුකාරවරයා හෝ පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් දැනටමත් පනවනු ලැබ ඇත්තා වූ හෝ කලින් කළ පනවනු ලැබිය හැකිවූ රීති හා නියෝග ලේකම් කාර්ය මණ්ඩලයට අදාල විය යුතුය.

කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් රජයේ සේවකයන් වශයෙන් සැළකිය යුතු බව

**12**. ලේකම් කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දණ්ඩ නීති සංග්‍රහයේ සහ අල්ලස් පනතේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සැළකිය යුතුය.

කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විශ්‍රාම යාම

**13**. (1) ලේකම් කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, වයස අවුරුදු පනස් හත (57) එළඹීමේදී හෝ ඊට පෙර යටත් පිරිසෙයින් තම විශ්‍රාම යාමේ දිනට මාස තුනකටවත් පෙර ලේකම් වෙත ඉදිරිපත් කෙරෙන ලිපියක් මගින් විශ්‍රාම යාමේ මනාපය ඇත්තේය.

(2) වයස අවුරුදු පනස් හත (57) ඉක්මවා සේවය කිරීමට කැමැත්තක් දක්වන යම් නිලධාරියෙකු විසින් තමා අවුරුදු පනස් හතට එළඹෙන දිනට මාස තුනකට කලින් සහ ඉන් පසුව තමාට දෙන ලද එක් එක් සේවා දිගු කිරීමේ කාලපරිච්ඡේද ඉකුත්වීමට මාස තුනකට පෙර ආණ්ඩුකාරවරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු

ලැබිය යුතු අතර, ආණ්ඩුකාරවරයා විසින් ලේකම්ගේ නිර්දේශය මත ඒ සේවා දිගු කිරීම, දෙනු ලැබිය හැකිය. වයස අවුරුදු 60 ඉක්මවා කිසිම සේවා දිගු කිරීමක් දෙනු නොලැබේ.

**14**. ආණ්ඩුකාරවරයා විසින් සාදන ලදුව, සභාව විසින් සම්මත කරන ලද සභා අරමුදල් වලට අදාළ රීතිවලට අනුකූලව එක් එක් වර්ෂය සඳහා සභාවේ වියදමට අදාල වූ ඇස්තමේන්තුවක් ලේකම් විසින් පිළියෙල කර, සභාවේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මුදල්

**15**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ව්‍යවස්ථාවෙහි අර්ථ නිරූපණය

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, දකුණු පළාතේ ආණ්ඩුකාරවයා අදහස් වේ.

"සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

"පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් වේ.

"ලේකම්" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභා ලේකම් අදහස් වේ.

"ලේකම් කාර්යාලය" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය අදහස් වේ.

මේ ව්‍යස්ථාවේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය

අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතු බව.

## 30. දකුණු පළාත් සභාවේ 2007 අංක 02 දරන විකල්ප බලශක්ති කටයුතු පිළිබඳ ප්‍රඥප්ති කෙටුම්පත.

දකුණු පළාතේ මහජන ශුභ සිද්ධිය පිණිස බලශක්ති ප්‍රචලිත කිරීම උදෙසා විකල්ප බලශක්ති ප්‍රභව හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම, වැඩිදියුණු කිරීම සහ පාරිසරික හානි අවම වන අයුරින් උපයෝගී කර ගැනීම පිණිස දකුණු පළාත තුළ විකල්ප බලශක්තිය සහ විෂයය ස්ථාපිත කිරීම හා ඊට සම්බන්ධ හෝ ආනුශාංගික හෝ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව මගින් මෙසේ පනවනු ලැබේ.

**01.** මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ 2007 අංක 02 දරන විකල්ප බලශක්ති කටයුතු පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

**02.** මෙම ප්‍රඥප්තියේ පොදු පරමාර්ථ වනුයේ, පොදු පරමාර්ථ

1. විදුලි බලශක්ති උත්පාදනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත ඇතුළත වැඩ බිම් හා පහසුකම් සංවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම සහ පාලනය කිරීම (ජාතික විදුලි බල පද්ධතිය පෝෂණය කිරීම සඳහා උත්පාදනය කරනු ලබන ජල විදුලි බලය හැර)
2. පළාත් සභා බල ප්‍රදේශය තුළ දැනට පවතින හා ඉදිරියේ දී හඳුනා ගැනීමට අපේක්ෂිත බලශක්ති ජනන ව්‍යාපෘතීන් ආරක්ෂා කර පවත්වාගෙන යාම.
3. ඵලදායී ලෙස භාවිතයට නොගෙන ඇත්තා වූ ස්වභාවික ජලධාරාවන්, සූර්ය ශක්තිය, සුළං බලය, ජීවවායු හා දැව ඉන්ධන ඇතුළු පුනර්ජනනය කළ හැකි බලශක්ති ප්‍රභව උපයෝගී කර ගැනීම මගින් බලශක්ති උත්පාදනය කිරීම.
4. විකල්ප බලශක්ති ප්‍රභව සැලසුම් කිරීම, ක්‍රියාවට නැංවීම හා තිරසාර භාවය ශක්තිමත් කිරීම උදෙසා සියලුම ආකාරයේ සංවිධාන කළමනාකරණ තාක්ෂණ හා මූල්‍ය උපදේශක සේවාවන් සඳහා පිළිගත හැකි සුදුසුකම් ඉදිරිපත් කරන අය, අත්දැකීම් ඇති රාජ්‍ය නොවන ආයතනයන්, පුද්ගලයන් හා සංවිධානයන් මැදිහත් කර ගැනීම හා අධීක්ෂණයට යටත්ව පිළිගැනීම.

5. ක්‍රියාත්මක යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය මග පෙන්වීම, සම්බන්ධීකරණය, උපදේශනය, අධීක්ෂණය අරමුණු කොට ගත්,

(අ) පළාත් කමිටු හා අනු මණ්ඩල,

(ආ) ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු,

සංවිධානය කිරීමට ද ඒ සඳහා අවශ්‍ය වන්නා වූ සම්පත් සම්පාදනය කිරීම.

6. පොදු මහජන සුභ සිද්ධිය පරමාර්ථ කොට ගත් විකල්ප බලශක්ති ජනන ව්‍යාපෘතීන් ප්‍රවර්ධනයට හා පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි කලින් කලට, තීරණය කරන්නා වූ යම් ප්‍රතිපත්තියක් ප්‍රඥප්තියට අනුකූලව ඇතුළත් කළ හැකිවීම.

7. ගෘහස්ථ පරිභෝජනය, සංවර්ධනය හා නිෂ්පාදන කටයුතුවලදී විකල්ප බලශක්ති ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි මහජනතාව උනන්දු කරවීම සහ ඒ සඳහා අවශ්‍ය ආධාර උපකාර හා මග පෙන්වීම ලබා දීම.

8. විකල්ප බලශක්ති ප්‍රභව මෙහෙයවීමේදී හා ප්‍රයෝජනයට ගැනීමේදී පරිසර පද්ධතීන්ට හානි නොවන අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම.

9. බලශක්ති උත්පාදනය හා භාවිතය ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා පියවර ගැනීම ඒ සඳහා දිරි ගැන්වීම

10. විකල්ප බලශක්ති උත්පාදනය හා භාවිතය ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කරන සමිති හා සංවිධාන විකල්ප බලශක්ති අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීම හා රාජ්‍ය ආධාර ලබාදීම.

## I කොටස

**03**. 2 වගන්තියේ සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මින්මතු දැක්වෙන විධිවිධාන වලට අනුකූලව අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව, පළාත් කමිටු හා අනු මණ්ඩල පිහිටුවීම

(අ) පළාත් කමිටුවක්,

(ආ) අමාත්‍යාංශ ලේකම් යටතේ පරිපාලන ඒකකයක්,

(ඇ) විකල්ප බල ශක්ති සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

**04**. විකල්ප බලශක්ති විෂය පිළිබඳ නිපුණත්වයක් ඇති තැනැත්තන්ගෙන් සමන්විත පළාත් කමිටුවක් පිහිටුවනු ලැබිය යුතුය. එහි සාමාජිකයන් 13 කට නොවැඩි විය යුතු අතර, ඔවුන් අතරින් පළාත් කමිටුවේ සංයුතිය

විකල්ප බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ මණ්ඩලයේ සභාපති වශයෙන් පත්විය යුතුය.

(අ) පළාත් විකල්ප බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්,

(ආ) පළාත් පරිසර විෂය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් හෝ නම් කරන නියෝජිතයෙකු,

(ඇ) පළාත් කෘෂිකර්ම විෂය පිළිබඳ අමාත්‍යාංශ ලේකම් හෝ නම් කරනු ලබන නියෝජිතයෙකු,

(ඈ) විදුලිබල මණ්ඩලය වෙනුවෙන් නියෝජිතයෙකු,

(ඉ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරියෙකු,

(ඊ) පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් හෝ නම් කරනු ලබන නියෝජිතයෙකු

(උ) පළාත් පාලන කොමසාරිස්,

(ඌ) පළාත් ජල සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිතයෙකු,

(එ) පළාත් සංචාරක අමාත්‍යාංශයේ නියෝජිතයෙකු,

(ඒ) ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්,

(ඔ) පළාත් සමුපකාර කොමසාරිස්,

(ඕ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අදාළ විෂය සම්බන්ධ ප්‍රවීනතාවයක් ඇති නියෝජිතයන් දෙදෙනෙකු.

පළාත් කමිටුවේ කාර්යයන්

**05**. (අ) පළාත් සභා බල ප්‍රදේශය තුළ දැනට පවතින බලශක්ති ප්‍රභව හඳුනා ගැනීම හා සංරක්ෂණ කොට පවත්වාගෙන යාම.

(ආ) බලශක්ති ප්‍රභව සැලසුම් කිරීම, සංවිධානය සහ කළමනාකරණය.

(ඇ) තාක්ෂණ, මූල්‍ය හා උපදේශන සේවාවන් සැපයීම.

(ඈ) රාජ්‍ය නොවන ආයතන, පුද්ලයන් හා සංවිධාන අධීක්ෂණයකින් යුතුව සම්බන්ධීකරණය කිරීම

(ඇ) ලැබෙන චංචල හෝ නිශ්චල දේපල, පරිත්‍යාගයන් විකිණීමෙන් ලැබෙන මුදල්, අරමුදලේ ගිණුමට බැර කිරීම.

ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේ සංයුතිය

**06**. (1) විකල්ප බල ශක්ති විෂය පිළිබඳ නිපුණත්වයක් ඇති තැනැත්තන්ගෙන් නම් කරන ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවක් පිහිටුවනු ලැබිය යුතුය. එහි සාමාජිකයන් 08 කට නොවැඩි විය යුතු අතර ඔවුන් අතරින් අදාළ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් එහි සභාපති වශයෙන් පත්විය යුතුය.

(අ) ප්‍රාදේශීය ලේකම්,

(ආ) පරිසර නිලධාරී,

(ඇ) ග්‍රාම සංවර්ධන නිලධාරී,

(ඈ) ප්‍රජා සංවර්ධන නිලධාරී,

(ඉ) විද්‍යා හා තාක්ෂණ නිලධාරී,

(ඊ) ගොවිජන සංවර්ධන නිලධාරී,

(උ) සංවර්ධන නිලධාරී,

(ඌ) අඩවි වන නිලධාරී,

ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේ කාර්යයන්

**07**. (අ) විකල්ප බලශක්ති ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම,

(ආ) උපදේශක සේවාවන් සැපයීම,

(ඇ) උපදේශක සේවාවන් සඳහා පිළිගත හැකි සුදුසුකම් ඉදිරිපත් කරන අය, අත්දැකීම් ඇති රාජ්‍ය නොවන ආයතන, පුද්ගලයින් සහ සංවිධානයන් පළාත් කමිටුවේ අධීක්ෂණයට යටත්ව පිළිගැනීම.

පළාත් කමිටුවේ සාමාජිකයන්ගේ ධූර කාලය

**08**. (1) ඉල්ලා අස්වීම, මරණය හෝ ධූරයෙන් ඉවත් කිරීම හේතු කොට ගෙන කලින් තම ධූරය හිස් වුවහොත් මිස, එසේ පළාත් කමිටුවට හෝ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවට පත් කරනු ලැබූ සාමාජිකයෙකු විසින් එසේ පත් කරන ලද දින සිට අවුරුදු 03 ක කාලයක් තම ධූරය දැරිය හැකි විය යුතුය.

(2) පත් කරනු ලැබූ සාමාජිකයෙකු විසින් අමාත්‍යවරයා මගින් ගරු ආණ්ඩුකාරවරයා වෙත යවනු ලබන ලිපියක් ගරු ආණ්ඩුකාරවරයා විසින් පිළිගැනීමෙන් පසු තම ධූරයෙන් ඉල්ලා අස්විය යුතුය.

(3) පත්කරනු ලැබූ සාමාජිකයෙකු තම ධූරකාලය ඉකුත් වීමට පෙර ඉල්ලා අස්වූ අවස්ථාවක දී ඒ වෙනුවට වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලැබූ සාමාජිකයෙකු විසින් තම පූර්වගාමිකයාගේ ධූර කාලයේ ශේෂ වී ඇති ධූර කාලය තුළ පමණක් ධූරය දැරිය යුතුය.

(4) කාලය ඉකුත්වීම නිසා හෝ ඊට පෙර හෝ තම ධූරය හිස්කරන සාමාජිකයෙක් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නුසුදුස්සෙකු බවට පත්වීම නැත්නම්, නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙකු වන්නේය.

(5) රෝගාතුර වී හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව ගොස් සිටි හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම ධූරයේ කටයුතු කිරීමට පත් කරන ලද යම් සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවකදී ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයාගේ නිර්දේශය පරිදි ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(6) සභාපතිවරයා ඇතුළු පත්කරනු ලැබූ යම් සාමාජිකයෙකු විසින් යම් විෂමාචාරයක් කර ඇති අමාත්‍යවරයාට දන්වනු ලැබ හෝ දැන ගන්නට ලැබූ විටක ලේකම්වරයා විසින් පත් කරනු ලබන පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් අමාත්‍යවරයා විසින් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව ඒ අය ඉවත් කරනු ලැබිය හැකිය.

**09**. යම් තැනැත්තෙකු

සාමාජිකත්වයට නුසුදුසුකම්

(අ) සාපරාධී වරදක් සඳහා රුපියල් පන්සියයක් ඉක්මවන දඩයකට හෝ (අත්හිටවූ දඬුවමකට ඇතුළ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට ශ්‍රීලංකාවේ හෝ වෙනත් යම් රටක හෝ අධිකරණයක් විසින් යටත් කොට නම් කොට තිබුණොත් : හෝ

(ආ) බරපතල විෂමාචාර චෝදනා පිට සේවයෙන් ඉවත් කරනු ලැබූ තැනැත්තෙකු වුවහොත්: හෝ

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ට හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයෙක් හෝ පළාත් පාලන අයතනයක සභිකයෙක් හෝ සිටී නම්, නැතහොත් එවැන්නෙකු බවට පත්වුවහොත් එවැනි තැනැත්තෙකු යටත් මණ්ඩලයට සාමාජිකයෙකු වශයෙන් පත් කිරීමට හෝ එවැනි සාමාජිකයෙකු වශයෙන් පත් කිරීමට එවැනි සාමාජිකයෙකු වශයෙන් ධූරයේ සිටීමට නුසුදුස්සෙකු වන්නේය.

**10**. යම් සාමාජිකයෙකු

සාමාජිකත්වය අහෝසිවීම

(අ) ඉල්ලා අස්වුවහොත්

(ආ) ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත්

(ඇ) ප්‍රඥප්තියේ නිශ්චිතව දක්වා ඇති ධූර කාලය අවසන් වුවහොත්

(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු බවට පත්වුවහොත්: හෝ

(ඊ) පළාත් කමිටුවේ හෝ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේ අනුයාත රැස්වීම් තුනකට පැමිණීම පැහැර හරිනු ලැබුවහොත් ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

**11**. පළාත් කමිටුවේ හෝ ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේ අනුයාත රැස්වීමක දී යම් කරුණක් පිළිබඳව කැමැත්ත විමසීමේදී පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වේ නම්, සභාපතිවරයාට එම ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් හිමිවේ.

සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමිවන බව

## II කොටස
## මුදල් හා ගිණුම්.

**12**. දකුණු පළාත් විකල්ප බලශක්ති සංවර්ධන අරමුදල් ගිණුමේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් ලක්ෂ 10 ක් වන්නේය. මූලික ප්‍රාග්ධනය විෂය භාර අමාත්‍යවරයාගෙන් විමසා ප්‍රධාන අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් අරමුදලේ ප්‍රාග්ධනය ලෙස ගිණුමට බැරකළ යුතුය.

අරමුදල් ගිණුමේ ආරම්භක ප්‍රාග්ධනය

**13**. 1. දකුණු පළාත් සභා අරමුදල් යටතේ පවත්වාගෙනයනු ලබන විකල්ප බලශක්ති සංවර්ධන අරමුදල නමින් ගිණුමක් පිහිටුවනු ලැබිය යුතුය.

2. පහත දැක්වෙන මුදල් අරමුදලට බැර කළ යුතුය.

(අ) ඉහත සඳහන් පරමාර්ථ ඉටු කිරීමේ කාර්යයන් සඳහා කලින් කලට දකුණු පළාත් සභාව විසින් නම් කරනු ලබන මුදල්,

(ආ) පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ යෝජනා පරිදි වෙන් කරනු ලබන පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන,

(ඇ) යම් දේශීය හෝ විදේශීය ආයතනයකින් හෝ රටකට ලැබෙන සියලු මුදල්,

(ඈ) යම් පුද්ගලයෙකු හෝ පුද්ගල සමූහයක් විසින් පිරිනැමෙන මුදල්,

(ඉ) වෙනත් ක්‍රමවලින් ලැබෙන මුදල්.

දකුණු පළාත් විකල්ප බලශක්ති සංවර්ධන අරමුදල් ගිණුම

3. ඉහත (2) උප වගන්තියේ (ඇ), (ඈ) හා (ඉ) ඡේද යටතේ ලැබෙන මුදල් අරමුදල් පළාත්බද උපදේශක මණ්ඩලයේ මග පෙන්වීම අනුව නිශ්චිත කාර්යයක් සඳහා පමණක් වැයකළ යුතුය.

4. මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා යෙදවීම පිණිස ලැබෙන යම් නිශ්චිත හෝ චංචල දේපලක් පරිත්‍යාග උපදේශක මණ්ඩලයේ එකඟත්වය මත අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබිය හැකිය. එවැනි දේපළක් විකිණීමෙන් ලැබෙන මුදල් අරමුදලේ ගිණුමට බැරකළ හැකිය.

**14.** 1. පළාත් කම්ටුවේ ආදායම් හා වියදම් වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට පළාත් කම්ටුව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතුය. විගණනය හා ගිණුම්

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන සහ දකුණු පළාත් සභා රීති ද ගිණුම් විගණනය පිළිබඳ කාරණා සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

**15.** මෙම ප්‍රඥප්තියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය. මුදල් වර්ෂය

## III කොටස
## පුහුණු හා පර්යේෂණ

**16.** පළාත් කම්ටුව විසින් නිර්දේශ කරන පරිදි පහත සඳහන් කාර්ය සඳහා පුහුණු පර්යේෂණ සහිත සේවා මධ්‍යස්ථාන එකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටුවනු ලැබිය හැකිය. පුහුණු හා පර්යේෂණ මධ්‍ය ස්ථාන පිහිටුවීම

(අ) විකල්ප බලශක්ති විෂයට අදාළ පුහුණු කිරීමේ මධ්‍යස්ථාන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ බලශක්ති සම්බන්ධ රැස්වීම් වැඩමුළු, සම්මේලන යනාදිය පැවැත්වීම

(ආ) සංදර්ශන, ප්‍රසංග, ප්‍රදර්ශනාදිය පැවැත්වීම

(ඇ) විකල්ප බලශක්ති ප්‍රභවයන් සහ භාවිතයන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සේවා හා දත්ත තොරතුරු සැපයීම සහ සැකසීම හා තොරතුරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

(ඈ) දේශීය, විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

## IV කොටස

### සාමාන්‍ය විධිවිධාන

**17**. (1) (අ) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, නියම කළ යුතු යැයි නැතහොත් නියෝග පැනවිය යුතු යැයි නියම කර ඇති යම් කරුණක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග

(ආ) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(II) (1) නියම කරනු ලැබිය යුතු යැයි මේ ප්‍රඥප්තිය මගින් නියමිත හෝ රීති සෑදිය යුතු යයි මේ ප්‍රඥප්තිය යටතේ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ කමිටුව විසින් සාදන ලද කිසිම රීතියක් එය පළාත් සභාව විසින් අනුමත කර ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතුය.

**18**. 1. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, අර්ථ නිරූපණය

අමාත්‍යවරයා - යන්නෙන් දකුණු පළාත් විකල්ප බලශක්ති විෂයය භාර පළාත් අමාත්‍යවරයා අදහස් කරයි.

පළාත් සභාව - යන්නෙන් දකුණු පළාත් සභාව අදහස් වේ.

ගිණුම් - යන්නෙන් දකුණු පළාත් විකල්ප බලශක්ති සංවර්ධන අරමුදල් ගිණුම අදහස් වේ.

පළාත - යන්නෙන් දකුණු පළාත අදහස් වේ.

ලේකම්වරයා - යන්නෙන් දකුණු පළාත් විකල්ප බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

**19**. මෙම ප්‍රඥප්තියේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අයතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

## 31. 2007 අංක 04 දරන දකුණු පළාත් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් 2007.12.11 වැනි දින සම්මත කරනු ලදුව 2008.02.29 වැනි දින දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කොට ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය 2007 අංක 04 දරන දකුණු පළාත් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය වශයෙන් සියළු දෙනාගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

### 2007 අංක 04 දරන දකුණු පළාත් අබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ ජීවත් වන ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ සභාවක් පිහිටුවීම හා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත්, ඔවුනට ආත්මාභිමානයෙන් යුක්තව ජීවත්වීමට හැකිවන පරිදි සංවර්ධන අවස්ථා සුහ සාධන පහසුකම් සැලසීමත් සහ ඊට සම්බන්ධ ආනුශාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මෙම ප්‍රඥප්තිය 2007 අංක 04 දරන දකුණු පළාත් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

**1.** පරමාර්ථ :

(1) ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ඔවුන්ට ආත්මාභිමානයෙන් යුතුව ජීවත් වීමට හැකි වන පරිදි අවශ්‍ය සංවර්ධන අවස්ථා හා සුබ සාධන පහසුකම් සැලැස්වීම පිණිස ආබාධිතතාව පිළබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය දකුණු පළාත තුළ ක්‍රියාත්මක කරවීම සඳහා වූ සභාවක් පිහිටුවීම.

(2) ආබාධිත සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ආත්මාභිමානයෙන් යුක්තව ඔවුනට ජීවත් වීමට හැකි වන පරිදි අවශ්‍ය අවස්ථා ලබා දීම හා සහන සැලසීම සඳහා දකුණු පළාත තුළ ක්‍රියාත්මක පළාත් රාජ්‍ය/රාජ්‍ය ආයතන,රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශය ඒකාබද්ධ කර මෙහෙය වීම.

(3) දකුණු පළාතේ ලියාපදිංචි ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන ඔවුන්ගේ දෙමාපිය සංවිධාන,රාජ්‍ය නොවන සංවිධාන සහ ඔවුන්ට සේවා සපයන ආයතන ඇතුළු අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීම.

## I කොටස

පළාත් උපදේශක සභාවක් පිහිටුවීම

**2**. (I) ආබාධ සහිත තැනැත්තන් උදෙසා "දකුණු පළාත් උපදේශක සභා" යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය හැක්කේය.

(2). එකී සභාව ඉහත (2) (i) වැනි වගන්තියෙහි ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තබාගත හැකි සංස්ථාවක් වන අතර, එහි නාමයෙන් ඒ සභාව විසින් ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකිය.

සභාවේ සංයුතිය

**3**. (1) "සභාව" පහත තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු වන්නේය.

(2) ආබාධිත තැනැත්තන් නියෝජනය කිරීම පිණිස ආබාධ සහිත තැනැත්තන් සඳහා වන සඳහා වන පළාත් සංවිධාන සහ ආබාධ සහිත තැනැත්තන් සඳහා සේවා සපයන පළාත් සංවිධන, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන දෙමාපිය සංවිධානය නියෝජනය කරමින් අමාත්‍ය මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් 06 දෙනෙකු.

(3) ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික් 03 නියෝජනය කරමින් දකුණු පළාත් සභාවේ මන්ත්‍රීවරු තිදෙනෙක් පළාත් පාලන ආයතනයක සභාපති/ නගරාධිපති, වෘත්තිය හෝ පූජකතුමන්ලා/ ස්වාමීන් වහන්සේලා හෝ රාජ්‍ය නිලධාරීන් යන අය නියෝජනය වන අයුරින් අමාත්‍ය මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන
සාමාජිකයන් 04 දෙනෙක්.

(4) ආබාධිත තැනැත්තන් සඳහා වූ දකුණු පළාත් මධ්‍යස්ථානයේ සභාපති.

(5) සභාවේ සභාපතිවරයා විෂයභාර අමාත්‍යවරයා වන්නේය.

(6) දකුණු පළාත් විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා මෙම සභාවේ ලේකම්වරයා වන්නේය.

4. උපදේශක සභාවට පත් කල සාමාජිකයින් නම් කල දින සිට වර්ෂ 05ක කාලයක් ධූරය දැරිය යුත්තේය. උපදේශක සභාවේ ධූර කාලය

5. ආණ්ඩුකාරවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් සාමාජිකයන්ට ගෙවිය හැකි වන්නේය. පාරිශ්‍රමික ගෙවීම්

6. (1) අමාත්‍ය මණ්ඩලයෙන් විමසා හේතු දැක්වීමකින් පසුව සාමාජිකයකු ධූරයෙන් ඉවත් කල හැකි වන්නේ ය. තවද ඔහුට / ඇයට පූර්වගාමිකයාගේ ඉතිරි ධූර කාලය දැරිය හැකි වන්නේය. ධූරයෙන් ඉල්ලා අස් වීම

(2) පත් කරන ලද සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත්

කිරීම හේතුවෙන් යම් තැනැත්තකු ඒ වෙනුවට පත් කළ හැකි අතර, ඔහුට/ ඇයට පූර්වගාමිකයාගේ ඉතිරි ධූර කාලය දැරිය හැකි වන්නේය.

(3). අමාත්‍යවරයා ආමන්ත්‍රණය කරන ලද ලිඛිත ඉල්ලීමකින් ඕනෑම සාමාජිකයෙකුට ඉල්ලා අස්විය හැකි වන්නේය.

7. (1). සභාපතිවරයා රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා පැමිණ නැති අවස්ථාවක වෙනත් සාමාජිකයකු සභාපති ලෙස තෝරා ගත හැකි වන්නේය. රැස්වීම පැවැත්වීම හා සණ පූර්ණය

(2). සභාවේ රැස්වීමක සණ පූර්ණය සාමාජිකයන් 05 දෙනෙකු විය යුතු වන්නේය.

(3). විශේෂ කැඳවීමක් නොකරන ලද හැම අවස්ථාවකම අවම වශයෙන් මාසයකට වරක් සභාව රැස්විය යුතු වන්නේය.

8. සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු දකුණු පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකවරයා විසින් කළ යුතුය.

9. (1) උපදේශක සභාවේ නිල මුද්‍රාවේ එකී සභාව විසින් නිශ්චය කරන ආකාරයකින් විය හැකි අතර, සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය. සභාවේ මුද්‍රාව

(2). එකී නිල මුද්‍රාව උපදේශක සභාවේ සභාපති විසින් නම් කරනු ලබන තැනැත්තකු භාරයේ තබාගත හැකි වන්නේය.

**10.** (1) දකුණු පළාත තුළ ක්‍රියාත්මක ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ඔවුන් ආත්මාභිමානයෙන් යුක්තව ජීවත් වීම සඳහා අවකාශ සලසන සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන, සංවිධාන, ආබාධිතාව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියට අනුකූලවත් ආබාධිත තැනැත්තන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවා ඇති හා වරින්වර පනවනු ලබන පනත් සහ එකී පනත් යටතේ මධ්‍යම රජයේ අමාත්‍යවරයා විසින් විටින් විට පනවනු ලබන නියෝග වලට අනුකූලවත් මෙම ප්‍රඥප්තියට හා පළාත් සභාව විසින් වරින් වර පනවනු ලබන පනත්වලට අනුකූලවත් කටයුතු කරන බවට වගබලා ගැනීම.

උපදේශක සභාවේ කාර්යයන්.

(2). ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගත යුතු පියවර පිළිබඳව දකුණු පළාත් සභාව නිර්දේශ ඉදිරිපත් කිරීම.

(3). ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් ළඟා කර දීම.

(4). ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස හා ගුණාත්මකව සපුරාලන බවට වග බලා ගැනීම.

(5). ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අධිකරණ යක පෙනී සිටීම සඳහා නියෝජිතයෙක් පත් කිරීමට බලය ඇත්තේය.

**11.** (1). දකුණු පළාත තුළ ආබාධ සහිත තැනැත්තන්ට අවස්ථා හා සේවාවන් සපයන පහත සඳහන් පළාත්/රාජ්‍ය දෙපාර්තමේන්තු ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවිධාන සහ රාජ්‍ය නොවන ආයතන හා පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් පළාත් ආබාධිත ප්‍රජා මූලික පුනුරුත්ථාපන කමිටුවක් හා ආබාධිත තැනැත්තන් සඳහා වූ පළාත් මධ්‍යස්ථානයක් උපදේශක සභාවේ එකඟතාවය අනුව පිහිටුවනු ලැබිය හැකි වන්නේය.

පළාත් ආබාධිත ප්‍රජා මූලික පුනරුත්ථාපන කමිටු පිහිටුවීම

(2). ආබාධිත තැනැත්තන් සඳහා ජාතික හා පළාත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පළාත් කමිටු හා මධ්‍යස්ථානය මෙහෙයවීම, මග පෙන්වීම හා උපදෙස් දීම පළාත් උපදේශක සභාව විසින් කළ යුතුය.

**12.** (1) උපදේශක සභාව විසින් ඉටු කළ යුතු කාර්යයන් පහත සඳහන් පරිදි වේ. උපදේශක සභාවේ සාමාජිකයෙක් උපදේශක සභාව බලය පැවරූ නිලධාරියෙකුට යම් රාජ්‍ය/රාජ්‍ය නොවන සංවිධාන කටයුතු පරීක්ෂා කිරීම.

උපදේශක සභාවේ බලතල හා කාර්යයන්.

(2) උපදේශක සභාව විසින් රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වන විට අදාළ ඇමතිවරයා වෙත හා රාජ්‍ය නොවන සංවිධානයක් වන විට රාජ්‍ය නොවන සංවිධානය ලියාපදිංචි කරන ලද බලධරයා වෙත නිර්දේශයක් ඉදිරිපත් කළ හැකි වන්නේය.

(3) කිසියම් රාජ්‍ය නොවන සංවිධානයක් දිගින් දිගටම ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් හා සැප විහරණ නොසලකා කටයුතු කරන්නේ නම් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂක මණ්ඩලයක නිර්දේශ මත සංවිධානයට/ආයතනයට එරෙහිව නඩු පැවරීමට බලය ඇත්තේය.

(4) මෙබඳු සංවිධානයක් සම්බන්ධයෙන් අධිකරණයේ තීන්දුව ලැබෙන තාක් කල් නේවාසික ආබාධිත තැනැත්තන් හා සේවකයින්ගේ සැප විහරණයන් මනාව පවත්වාගෙන යාම සඳහා නියෝජිතයෙක් පත්කළ හැක්කේ ය. නියෝජිතයාට ලිඛිතව බලය පවරනු ලැබිය යුතු වන්නේය.

(5) මෙබඳු ආයතනයක් නඩත්තු කිරීම සඳහා මාසිකව දැරිය යුතු වියදම් ගණනය කර එම මුදල අදාළ ස්වේච්ඡා සංවිධානයන්ගෙන් අයකර ගැනීමටත්, සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමටත්, උපදේශක සභාවේ පත් කළ නියෝජිතයාට බලය ඇත්තේය.

(6) නඩුව පවත්වාගෙන යන කාලය තුළ එකී සංවිධාන සතු බැංකු ගිණුම් පාලනය හා ආදායම් රැස් කිරීම නියෝජිතයාගේ එකඟත්වය මත පමණක් කළ යුතුය. ඒ සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමට නියෝජිතයාට බලය ඇත.

(7) දකුණු පළාත තුළ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරන රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානවල හා සැලසුම්වල සත්‍යතාවය අධ්‍යයනය කිරීමට සභාවට බලය ඇත්තේය.

(8) ආබාධිත ප්‍රජා මූලික පුනරුත්ථාපන පළාත් කමිටුවට ඉදිරිපත් වන ප්‍රතිපත්තිමය ගැටළු විමර්ශනය කිරීම හා ඒ සඳහා නිර්දේශයන් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට ඉදිරිපත් කිරීම ඊට කළ හැකි වන්නේය.

(9) දකුණු පළාත තුළ ඉදිකර ඇති හා ඉදිකරන පොදු ගොඩනැගිලි පිළිබඳ අධ්‍යානය කර ප්‍රවේශ පහසුකම් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ හැක්කේ ය.

රීති හා නියෝග සෑදීම

**13.** උපදේශක සභාව විසින් මෙම ප්‍රඥප්තියේ බලතල හා රීති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා රීති සාදනු ලැබිය හැකි අතර, එම රීති හා නියෝග අමාත්‍යවරයා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට වලංගු වන්නේය.

**14.** උපදේශක සභාව අල්ලස් හෝ දූෂණ විමර්ශන පනතේ අර්ථානුකූල උපලේඛන ගත ආයතනයක් ලෙස සැලකිය යුතුය.

**15.** උපදේශක සභාවේ සාමාජිකයකු මේ ප්‍රඥප්තිය විධානය මත කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ විටක එකී සමාජිකයාට විරුද්ධව යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

## II වැනි කොටස - මුදල්

ගිණුමක් පවත්වාගෙන යාම

**16.** (1) උපදේශක සභාවේ පරිපාලන වියදම් දකුණු පළාත් සභා අරමුදල මගින් දරනු ලබන්නේ ය.

(2) උපදේශක සභාවේ සියළුම වියදම් දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සුභ සාධන ව්‍යාපෘතිය දැරිය යුතු අතර ඒ සඳහා වූ ගිණුම් පවත්වාගෙන යා හැකි වන්නේය.

## III වැනි කොටස - ලියාපදිංචි කිරීම

සභාව වෙත ලියාපදිංචි කිරීම

**17.** (1) යම් ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කර ඇත්තේ නම් මිස, කිසිදු ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ආබාධ සහිත තැනැත්තන්ට කෙළින්ම හෝ යම් ආයතනයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් මගින් හෝ සංවිධානයක් මගින් හෝ කවර හෝ ආකාරයකින් හෝ අන්දමකින් සේවා හෝ සහන සැපයීමෙහි නොයෙදිය යුතුය.

(2) නියමිත දිනට පෙරාතුවම වූ දිනයේ දී යම් ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් එවැනි සේවා හෝ සහන සැපයීමේ නිරතව සිටියේ නම් 1 වැනි උප වගන්තියේ විධි විධාන නොතකා නියමිත දිනයේ සිට මාස 03ක් තුළ දී ඒ සංවිධානය ලියාපදිංචි කළ යුතුය.

(3) යම් ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ වෙනත් කිසියම් ඕනෑම ආකාරයක සංවිධානයක් සමාගමක් හෝ ආයතනයක් ඉහත ආකාරයට ලියාපදිංචි වී නැත්නම් දකුණු පළාත් ආබාධ සහිත පුද්ගලයන් සඳහා සේවා හෝ සහන සැපයීමක් සිදු කිරීමට පෙර ඒ සඳහා දකුණු පළාත් සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය. එකී අනුමැතිය ලබා දීමේදී අදාල කාර්යය සැලසුම පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දෙනු ලබන උපදෙස්, නිර්දේශ හා මගපෙන්වීම්වලට අනුකූලව එකී කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

(4) නියමිත දිනයට මාස තුනකට පෙරාතුව එකී කාර්යයන් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

**18.** මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතිය අනුසාරයෙන් සහ නියමිත ආකාරයට සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම

**19.** 18 වැනි වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් ලැබුණු විට සභාව විසින් ඒ ස්වේච්ඡා සංවිධානය විසින් සපයනු ලැබූ සේවා හා ආධාර සැලකිල්ලට ගෙන ඒ සංවිධානය ලියාපදිංචි කොට ඒ බවට සහතිකයක් ඒ සංවිධානය වෙත නිකුත් කළ යුතුය.

සහතික ප්‍රදානය කිරීම

**20.** මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වන ඕනෑම සංවිධානයක් විසින් සහ රාජ්‍ය ආයතනයක් විසින් වාර්ෂිකව ක්‍රියාත්මක සැලසුම් ඉදිරිපත් කිරීමේදී 2 වැනි ඡේදය යටතේ පිහිටවනු ලබන උපදේශක සභාව වෙත ඒ සඳහා බලය පැවරූ නිලධාරියකු විසින් කරනු ලබන ඉල්ලීම මත ඒවා ඉදිරිපත් කළ යුතු වන්නේය.

වාර්ෂික සැලසුම් ඉදිරිපත් කිරීම

**21.** මෙම ප්‍රඥප්තියේ 11.1 වගන්තිය යටතේ පිහිටවනු ලබන දකුණු පළාත් ආබාධිත ප්‍රජා මූලික පුනරුත්ථාපන කමිටුව විසින් වාර්ෂික සැලසුම් සමාලෝචනය කළ යුතු අතර, අවසාන සැලසුම් උපදේශක සභාව විසින් දකුණු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

**22.** (1) ආබාධිත තැනැත්තන් වෙනුවෙන් සේවාවන් සපයන ඕනෑම සංවිධානයක සේවකයින් බඳවා ගැනීමේදී සළකා බැලිය යුතු මූලික සුදුසුකම් තීරණය කිරීම මෙම ප්‍රඥප්තියේ 11.1 වගන්තිය අනුව පිහිටුවන ලබන ආබාධිත තැනැත්තන් සඳහා වූ කමිටුවේ දකුණු පළාත් මධ්‍යස්ථානයේ එකඟත්වය අනුව උපදේශක සභාව විසින් කරනු ලැබිය හැකි වන්නේය.

සේවක පහසුකම් හා වැටුප් තීරණය කිරීම

(2) කම්කරු දෙපාර්තමේන්තුවේ අනුමත පඩිපාලක සභා තුළින් නියම කරන ලද සේවක කාණ්ඩයක් සඳහා නියමිත අවම වැටුප් ගෙවිය හැකි වන්නේය.

(3) පඩි පාලක සභාව විසින් නිශ්චය නොකරන ලද සේවක කාණ්ඩයන් වෙනුවෙන් අවම වැටුප නියම කිරීම ඒ හා සමානව පවතින වැටුප් ක්‍රම නොයික්ම වන වන පරිදි සකස් කළ යුතු වන්නේය.

(4). මෙම ප්‍රඥප්තියේ 17.1 වැනි උප වගන්තිය යටතේ ලියාපදිංචි සංවිධාන හා සේවක සංවිධාන සාකච්ඡා කොට එකඟත්වයට පැමිණ අවම මාසික හෝ දෛනික වැටුප් තීරණය කර උපදේශක සභාවේ එකඟත්වය ලබාගත යුතු වන්නේය.

## IV කොටස

**23.** සභාවේ සියළුම නිලධරයන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එකී කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

සාමාන්‍ය විධිවිධාන

**24.** මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන තැනැත්තෙකු මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේදී පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහස නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොයික්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

වරද හා දඬුවම.

**25.** "දකුණු පළාත" යන්නෙන් ගාල්ල, මාතර සහ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්ක ඇතුළත් පළාත අදහස් වන්නේ ය.

අර්ථ නිරූපණය.

"ආබාධ සහිත තැනැත්තා" යන්නෙන් සහජයෙන්ම ඇති වූ හෝ එසේ නොවූ ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌනතාවයක ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතයේ අවශ්‍යතාවයන් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින්ම තමා සඳහාම ඉටුකර ගැනීමට නොහැකි යම් තැනැත්තෙකු අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයා යන්න අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් දකුණු පළාත් ආණ්ඩුකාරවරයා යන්න අදහස් වේ.

**26.** මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ. ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය වලංගු වන්නේය.

## 32. දකුණු පළාත් සභාවේ 2007 අංක 05 දරන මුදල් (පරිපූරක විධිවිධාන) (සංශෝධන) ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**01.** මෙම ප්‍රඥප්තිය දකුණු පළාත් සභාවේ 2007 අංක 05 දරන මුදල් (පරිපූරක විධිවිධාන) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද දින සිට ක්‍රියාත්මක විය යුතුය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**02.** මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන දකුණු පළාත් සභාවේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ පළමුවන ඡේදයේ 7 වන අංකයට ඉක්බිතිව 8 යනුවෙන් අංක කර ඊට "තුරඟ තරග ආඥා පනත" යන්න ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

දකුණු පළාත් සභාවේ 1994 අංක 02 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 1 වන ඡේදය සංශෝධනය කිරීම

**03.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තිය වන 6 (අ) වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය.

6 (අ) වන අළුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම

6 (අ) (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් එකී නියමයෙහි සඳහන් කරනු ලබන අනු ප්‍රමාණයන්ට අනුව හා පාර්ලිමේන්තුව විසින් පනවා ඇති නීතිවලින් අවසර දී ඇති අනු ප්‍රමාණයන්ට අනුව පළාත ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් වෙනුවෙන් පවත්නා ප්‍රාග්ධන අගය අනුව බද්දක් පැනවීම හා අය කර ගැනීම කළ හැකිය.

ඉඩම් හා ගොඩනැගිලි බද්ද

(2) (1) වන උප වගන්තියෙහි "ඉඩම" යන්නට රජයට අයිති යම් ඉඩමක්ද "ගොඩනැගිල්ල" යන්නට රජයට අයිති යම් ගොඩනැගිල්ලක්ද ඇතුළත් වේ.

(3) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍ර යෙහි පළ කරනු ලැබිය යුතු අතර මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයන් එම අනුමැතියේ දිනයේ සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ

කලින් කරන ලද කිසිවක වලංගු භාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(4) මෙම වගන්තියෙහි කාර්ය සඳහා "ප්‍රාග්ධන අගය" යන්න යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, එකී ගොඩනැගිල්ලට කරන ලද හෝ සවි කරන ලද වැඩි දියුණු කිරීම්, එකතු කිරීම් සහ සවි කිරීම් එකී ගොඩනැගිල්ල පිහිටා තිබෙන ඉඩමේ මිල ද ඇතුළුව එකී ගොඩනැගිල්ල ඉදි කිරීමට වැය වූ වියදම ද, යම් හිස් ඉඩමක් සම්බන්ධයෙන් වන විට පසුගිය වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වැනි දිනට එකී ඉඩමෙහි වෙළෙඳ අගය ද ඉන් අදහස් වේ.

(5) මෙම වගන්තියෙහි ඇතුළත් විධිවිධාන අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතුය.

**04.** ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන පරිච්ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් පරිච්ඡේදය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය ලෙස බල පැවැත්විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියට නව VII පරිච්ඡේදය ඇතුළත් කිරීම

## VII වන පරිච්ඡේදය

## ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද

**13**. (1) පළාත් ඇතුළත වූ ස්ථානයක දී හෝ පරිශ්‍රයක දී හෝ (පළාත තුළ හෝ ඉන් පිටත පැවැත්වෙන) යම් තුරග තරගයකදී මුදලට හෝ ණයට තබන ලද හෝ පිළිගනු ලැබූ සෑම ඔට්ටුවකින්ම (මෙහි මින්මතු "ඔට්ටු බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියෝග මගින් නියම කරනු ලබන අනු ප්‍රමාණ අනුව පනවා අය කර ගත යුතුය.

ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද

(2) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරනු ලැබූ යම් නියමයන් ඒ අනුමැතියේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(3) මෙම වගන්තිය යටතේ වූ "ඔට්ටු බද්ද" ඔට්ටුවක් තැබූ විගසින්ම අය විය යුතු වන අතර එවැනි ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන තැනැත්තෙක් එක් එක් ලිත් මාසය සඳහා ගෙවිය යුතු ඔට්ටු බදු වල එකතුය, එකී ලිත් මාසය ගෙවී දින දහයක් ඇතුළතදී දකුණු පළාතේ පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

(4) ඔට්ටු බද්දක් ගෙවීමට යටත්වන යම් තැනැත්තෙක් (3) වන උප වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි නියමිත දින දී හෝ ඊට පෙර එම බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක එම තැනැත්තා පැහැර හරින්නෙක් ලෙස සැලකිය යුතුය.

(5) යම් ඔට්ටු බද්දක් ගෙවීම පැහැර හැර ඇති විට, පැහැර හරින්නා විසින් ගෙවීම් පැහැර හැර ඇති මුදලෙන් සියයට දහයකට සමාන මුදලක් ද, ඉන්පසුව එළඹෙන සෑම මාසයක් සඳහාම සියයට පනහක උපරිමයකට යටත් වූ සියයට දෙකක අමතර මුදලක් ද දඩ වශයෙන් ගෙවිය යුතුය.

(6) (5) වන උප වගන්තියෙහි සඳහන් දණ්ඩනයක් ද ඇතුළුව යම් ඔට්ටු බද්දක් ගෙවීම් පැහැර ඇති විට, එය පළාත් සභාවට අය විය යුතු ණයක් ලෙස සලකා පැහැර හරින්නාගෙන් අය කර ගත හැකිය.

(7) මේ වගන්තියෙහි සඳහන් යම් ව්‍යාපාරයක් නීතියෙන් තහනම් කරනු ලැබූ ව්‍යාපාරයක් වන්නේ නම්, මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන කිසිවක් ඒ ව්‍යාපාරයට නීත්‍යානුකූලභාවය ප්‍රදානය කෙරෙන ලෙස ඒ විධිවිධාන තේරුම් නොගත යුතුය.

**05.** ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය එහි VIII වන පරිච්ඡේදය ලෙස නැවත අංක කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය නැවත අංක කිරීම.

**06.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන, 14 වන සහ 15 වන වගන්ති පිළිවෙලින් 14 වන වගන්තිය, 15 වන වගන්තිය හා 16 වන වගන්තිය යනුවෙන් යළි අංක කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 13,14 සහ 15 වන වගන්ති නැවත අංක කිරීම

**07.** මේ පනතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

## 33. දකුණු පළාතේ පෙර පාසැල් පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි; මේ ප්‍රඥප්තියේ විධිවිධාන (186 වන අධිකාරය වූ) අධ්‍යාපන ආඥාපනතට අනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ව්‍යවස්ථාව 2008 අංක 01 දරණ දකුණු පළාතේ පෙර පාසැල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයා විසින් ඒ සඳහා ස්වකීය අනුඥාව දෙනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතුය. **01.** ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

### I වන කොටස

### ප්‍රඥප්තියේ අරමුණු සහ මෙහෙයුම් කමිටුව පිහිටුවීම

**2.** (අ) පළාතේ පෙර පාසැල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම; ප්‍රඥප්තියේ අරමුණු

(ආ) පළාත ඇතුළත පිහිටි පෙර පාසැල් සම්බන්ධව සම්පූර්ණ අධීක්ෂණයක් පවත්වාගෙන යාම; සහ

(ඇ) පළාත ඇතුළත පෙර පාසැල් ළමුන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා ඉවහල් වන පරිසරයක් ඇති කිරීම, ප්‍රඥප්තියේ අරමුණු විය යුතුය.

**3.** (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහෙයුම් කමිටුවක් ප්‍රඥප්තියේ අරමුණු ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබිය යුතුය. මෙහෙයුම් කමිටුව පිහිටුවීම

**4.** (1) කමිටුව පහත දැක්වෙන- කමිටුවේ සංයුතිය

(අ) නිල බලයෙන් පත් වූ සාමාජිකයන් වන -

(i) සභාපතිවරයා විය යුතු පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන්;

(ii) පළාතේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන්;

(iii) II වන වගන්තිය යටතේ පත්කරන ලද, නිසි බලධරයාගෙන්;

(iv) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන්;

(v) පළාතේ පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයාගෙන් ;

(vi) පළාත් පාලන කොමසාරිස්වරයාගෙන්;

(vii) පළාතේ සමාජ සේවා අධ්‍යක්ෂකවරයාගෙන්;

(viii) ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයාගෙන්;

(ix) කමිටුවේ ලේකම් විය යුතු පළාත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන්; සහ

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත සඳහන් තැනැත්තන් හතරදෙනෙකුගෙන්, එනම් -

(i) පෙර පාසැල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් හෝ සුදුසුකම් ඇත්තා වූ, නැතහොත්, ප්‍රවීණත්වයක් දක්වනු ලැබ ඇත්තාවූ තැනැත්තන් දෙදෙනෙකුගෙන් ;

(ii) රාජ්‍ය නොවන සංවිධානයක පෙර පාසැල් අධ්‍යාපනය පිළිබඳ විෂයයෙහි නිරත වූ තැනැත්තෙකුගෙන්;

(iii) නීති ක්ෂේත්‍රයෙහි සුදුසුකම් හා පළපුරුද්ද ලැබ ඇත්තා වූ තැනැත්තෙකුගෙන්,

සමන්විත විය යුතුය.

(2) යම් තැනැත්තෙකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වේ නම් හෝ එසේ පත් වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල තැනැත්තෙකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කර ඇත්නම්; හෝ

(ඇ) කමිටු සාමාජිකයෙකු වශයෙන් ස්වකීය කාර්ය කිරීමේදී බලපෑමට ඉඩ ඇති යම් මූල්‍ය හෝ වෙනත් යම් සබඳතාවක් ඔහුට ඇත්තේ නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද සිර දඬුවමක් විඳින්නේ නම් හෝ විඳ ඇත්නම්,

ඔහු කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේය.

(3) එසේ පත් කරන ලද යම් සාමාජිකයෙකු ඉවත් කිරීම, ඒ සම්බන්ධයෙන් හේතු දක්වමින් අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

(4) ඉල්ලා අස්වූ හෝ ධූරය අත් හරිනු ලැබූ හෝ ඉවත් කරනු ලැබූ සාමාජිකයෙකු වෙනුවට පත් කරන ලද යම් සාමාජිකයෙකු, ඔහු කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මිය යාම, ඉවත් කිරීම හෝ විශ්‍රාම ගැනීම නිසා ධූරය හිස් වුවහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයේ ඉකුත් නොවූ ධූර කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(5) රෝගාතුර වීම නිසා හෝ වෙනත් දුබලතාවන්, නැතහොත්, ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හේතුකොටගෙන, පත් කළ සාමජිකයෙකුට ස්වකීය ධූරයේ කාර්ය කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැළකිල්ලට ගනිමින්, ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත්කරනු ලැබිය හැකිය.

**5**. (1) නිල බලයෙන් පත්වූ සෑම සාමාජිකයෙකුම, ඔහු කමිටුවේ සාමාජියෙකු වූයේ යම් ධූරයක් ප්‍රකාරවද, එම ධූරය දරන තාක් කල් කමිටුවේ ධූරය දැරිය යුතුය. — කමිටුවේ ධූර කාලය

(2) පත්කළ සෑම සාමාජිකයෙකු විසින්ම, ඔහු මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ස්වකීය ධූරය කලින් හිස් කරනු ලැබුවහොත් මිස, ඒ ධූරයට පත් කරනු ලැබූ දින පටන් අවුරුදු දෙකක කාලයක් සඳහා ධූරය දැරිය යුතුය.

**6**. යම් පත්කළ සාමාජිකයෙකු විසින්, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මඟින්, කවර අවස්ථාවකදී වුව ද, ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය. — කමිටුවේ සාමාජිකයන් ඉල්ලා අස්වීම.

**7**. කමිටුවේ කිසිදු ක්‍රියාවක් තීරණයක් හෝ නීති කෘත්‍යයක් කමිටුවේ පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයෙකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල වූ ලෙස සළකනු නොලැබිය යුතුය. — පුරප්පාඩුවක් ඇතිවීමේ හේතුවෙන් ක්‍රියා නිර්බල නොවන බව

**8**. කමිටුවේ සාමාජිකයන්ට, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව මහ ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ගෙවනු ලැබීය. — කමිටුවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**9**. (1) කමිටුවේ රැස්වීම් යටත් පිරිසෙයින් මසක එක් වරක්වත් පැවැත්විය යුතුය. කෙසේ වුවද, කමිටුවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු යයි, යටත් පිරිසෙයින් කමිටුවේ සාමාජිකයන් පස් දෙනෙකු විසින්වත් කමිටුවේ ලේකම්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇත්නම්, ඒ ඉල්ලීමේ දින සිට දින හතක් ඇතුළත ඔහු විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතුය.

කමිටුවේ රැස්වීම

(2) කමිටුවේ ලේම්වරයා විසින් කමිටුවේ එක් එක් සාමාජිකයා වෙත, යටත් පිරිසෙයින් රැස්වීමට දින හතකටවත් පෙරාතුව රැස්වීම පිළිබඳව ලියවිල්ලක් මගින් දැනුම් දිය යුතු අතර, ඒ දැන්වීම ඒ රැස්වීමේ න්‍යාය පත්‍රය සමඟ යැවිය යුතුය.

(3) යම් රැස්වීමක ගණ පූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතුය.

(4) සභාපතිවරයා විසින් කමිටුවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. කමිටුවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් එක් අයෙකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා ගනු ලැබිය යුතුය.

(5) රෝගාතුරවීම, දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම නිසා ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඒ නොපැමිණි කාලසීමාව තුළ දී ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කමිටුවේ වෙනත් සාමාජිකයෙකු පත් කරනු ලැබිය හැකිය.

(6) කමිටුවේ යම් රැස්වීමකදී ඡන්ද පිළිබඳ සමානතාවක් ඇතිවූ විටෙක, රැස්වීමේ මුලසුන දරන තැනැත්තාට, තම ඡන්දයට අතිරේකව, තීරක ඡන්දයක් තිබිය යුතුය. කමිටු රැස්වීම්ල දී ඡන්දය දීමට කමිටුවේ ලේකම්වරයාට හිමිකමක් නොතිබිය යුතුය.

(7) මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල වැඩ කටයුතු කරගෙන යාම කමිටුව විසින් විධිමත් කරනු ලැබිය හැකිය.

**10**. (අ) පෙර පාසැල් අධ්‍යාපනයේ ප්‍රමිතිය නංවාලීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ සහාය ලබාදීම;

කමිටුවේ කර්තව්‍ය

(ආ) පළාත ඇතුළත ලියාපදිංචි පෙර පාසැල්වල කටයුතු අධීක්ෂණය කිරීම සහ විධිමත් කිරීම;

(ඇ) පෙර පාසැල් ගුරුවරුන්ට තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් නියම කිරීම;

(ඈ) පෙර පාසැල් අධ්‍යාපනය සඳහා අවශ්‍ය අවම පහසුකම් නියම කිරීම;

(ඉ) විශේෂ අධ්‍යාපනයක අවශ්‍යතාවය ඇති දරුවන් හඳුනාගැනීම සහ එම දරුවන් සඳහා විශේෂ අධ්‍යාපනික වැඩසටහන් සකස් කිරීම;

(ඊ) පෙර පාසැල් අධ්‍යාපනයේ විශේෂ තාක්ෂණික ක්‍රම පිළිබඳව සහ වෙනත් අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ පෙර පාසැල් ගුරුවරුන්ට පුහුණු වැඩ සටහන් සකස් කිරීම;

(උ) පළාත ඇතුළත පිහිටුවා, පවත්වාගෙන යනු ලබන පෙර පාසැල් පරිපාලනය සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රමිති නියම කිරීම;

(ඌ) වයස අවුරුදු පහට අඩු ළමුන් සඳහා පෙර පාසැල් අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම;

(එ) මේ ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය රීති සෑදීම; සහ

(ඒ) මේ ප්‍රඥප්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමෙහිලා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

## II වන කොටස

## නිසි බලධරයා පත් කිරීම.

නිසි බලධරයා පත් කිරීම

**11**. (1) අමාත්‍යවරයා විසින්-

(අ) (මේ පනතේ "නිසි බලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නිසි බලධරයා ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා; සහ

(ආ) නිසි බලධාරයාට සහාය වීමට අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් යම් සංඛ්‍යාවක්,

මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පත් කළ යුතුය.

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී, නිසි බලධරයා කමිටුවේ සාමාන්‍යය විධානයට යටත් විය යුතුය.

(3) මේ ප්‍රඥප්තියේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මේ ප්‍රඥප්තිය මගින් නිසි බලධරයා වෙත පවරනු ලැබ ඇති බලතලවලින් යම් බලයක් (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය බවට නිසි බලධරයා විසින් සලකනු ලබන්නේ නම්, නිසි බලධරයා විසින් එවැනි යම් බලයක්, එසේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන නිලධරයකුට හෝ සේවකයෙකුට පවරනු ලැබිය හැකිය.

**12**. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, නිසි බලධරයාට පහත දැක්වෙන බලතල තිබිය යුතුය:- නිල බලධරයාගේ බලතල

(අ) දවසේ යම් යුක්ති සහගත වේලාවක් තුළදී, පෙර පාසැල් පවත්වනු ලබන ස්ථානවලට ඇතුලුවී, ඒවා පරීක්ෂා කිරීම;

(ආ) පළාත ඇතුළත යම් පෙර පාසලක අයිතිකරුවන්ට හා කළමනාකරුවන්ට වාර්තා සහ තොරතුරු ලබාදෙන ලෙස නියම කිරීම;

(ඇ) පෙර පාසැල් ළමුන් සඳහා පොත්, උපකරණ සහ ඉගැන්වීමේ ක්‍රම හඳුන්වාදීම;

(ඈ) පළාත ඇතුළත පවත්වාගෙන යනු ලබන පෙර පාසැල් ලියාපදිංචි කිරීම;

(ඉ) පෙර පාසැල් ගුරුවරුන් සඳහා සම්මන්ත්‍රණ වැඩ මුළු සහ පුහුණුවීමේ වැඩ සටහන් සංවිධානය කිරීම;

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ සපයනු ලබන සේවාවන් කිසිවක් සඳහා ගාස්තු අය කිරීම;

(උ) පෙර පාසැල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩ සටහන් සහ පාඨමාලා මෙහෙයවන පෞද්ගලික අධ්‍යාපන ආයතන ලියාපදිංචි කිරීම;

(ඌ) පෙර පාසැල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවන පෞද්ගලික අධ්‍යාපන ආයතනවලට විධාන නිකුත් කිරීම; සහ

(එ) සාමාන්‍යයෙන් නිසි බලධරයාගේ කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීම පහසුකරලීම සඳහා අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා හා දේවල් කිරීම.

## III වන කොටස

### පෙර පාසැල් ලියාපදිංචි කිරීම.

**13**. මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින පටන් හා ඉන්පසුව, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ සහ එහි නියම හා කොන්දේසිවලට අනුකූලව හැර, කිසිම තැනැත්තෙකු විසින් පෙර පාසැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම කරනු නොලැබිය යුතුය.

පෙර පාසැල් ලියාපදිංචි කිරීම

එසේ වුවද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව පෙර පාසැලක් පවත්වානෙ යන යම් තැනැත්තෙකු විසින් ඒ දිනයේ පටන් මාස හයක කාලසීමාවක් සඳහා එය පවත්වාගෙන යනු ලැබිය හැකි නමුත්, එකී මාස හයක කාලසීමාව ඉකුත් වීමට පෙර මාස එකක කාලයක් තුළ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කර මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගත යුතුය.

**14**. පෙර පාසැලක් පවත්වාගෙන යනු ලබන හෝ පෙර පාසැලක් පැවැත්වීමට බලාපොරොත්තුවන පරිශ්‍රයක, පවත්වාගෙන යා යුතු පහසුකම්වල ප්‍රමිතිය පිළිබඳව රීති මගින් නියම කරනු ලැබිය යුතුය.

පෙර පාසැල් සඳහා වන පහසුකම්වල ප්‍රමිතිය.

**15**. (1) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, පෙර පාසලක් පවත්වාගෙන යනු ලබන හෝ පැවැත්වීමට යෝජනා කරනු ලබන තැනැත්තෙකු විසින් නියමිත ආකෘති පත්‍රයෙහි නිසි බලධරයා වෙත කරනු ලැබිය යුතු අතර, ඉල්ලීමෙහි ඇතුළත් විස්තර ඉල්ලුම්කරුගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට වූ ප්‍රකාශයක් ඉල්ලීම සමග ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කිරීම

(2) (1) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා නිසි බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලීම සළකා බැලීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සළකන යම් තොරතුරු හෝ ලේඛන, ඔහු විසින් ඉල්ලුම්කරුගෙන් කැඳවනු ලැබිය හැකිය.

(3) තමා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම හා (2) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් හෝ ලේඛනයක් සළකා බැලීමෙන් පසුව-

(අ) පෙර පාසැලක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පුහුණුව හා සුදුසුකම් ඉල්ලුම්කරු සතුව ඇති බවට; සහ

(ආ) පෙර පාසැල පවත්වාගෙන යනු ලබන හෝ පැවැත්වීමට බලාපොරොත්තු වන පරිශ්‍රය 14 වන වගන්තිය යටතේ නියම කරනු ලබන පහසුකම්වල ප්‍රමිතියට අනුකූල වන බවට.

නිසි බලධරයා සෑහීමකට පත්වේ නම්, ඔහු විසින් ඉල්ලුම්කරු ලියාපදිංචි කරනු ලැබිය හැකිය.

**16**. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ තැනැත්තෙකු ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසුව, නිසි බලධරයා විසින්, පෙර පාසැලක් පවත්වාගෙන යාම සඳහා ඔහුට බලය ලබාදෙන නියමිත ආකෘතියේ වූ බලපත්‍රයක් නියමිත ගාස්තුව ගෙවීමෙන් පසුව එම තැනැත්තාට නිකුත් කරනු ලැබිය යුතුය. එවැනි සෑම බලපත්‍රයක්ම, අවුරුදු තුනක කාලයක් සඳහා වලංගු විය යුතුය.

බලපත්‍ර නිකුත් කිරීම

(2) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නියම කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට යටත් විය යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද කිසිදු බලපත්‍රයක් වෙනත් යම් තැනැත්තෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේ ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, ඒ බලපත්‍රය මගින් බලය දෙනු ලැබ ඇති තැනැත්තා විසින් ප්‍රධාන කාර්යාලයේ හෝ පෙර පාසැල පවත්වාගෙන යනු ලබන හෝ පැවැත්වීමට බලාපොරොත්තු වන ස්ථානයේ සෑම අවස්ථාවකදීම ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය.

**17**. මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තෙකුම පිළිබඳ වූ ලේඛනයක් නිසි බලධරයා විසින් නියමිත ආකෘතියෙහි පිළියෙල කරනු ලැබ පවත්වාගෙන යා යුතුය.

නිසි බලධරයා විසින් රෙජිස්ටරයක් පවත්වාගෙන යායුතු බව.

**18**. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් දරන්නෙක් විසින්ම, මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා වූ තම ඉල්ලීමෙහි ඇතුළත් විස්තරවල යම් වෙනසක් සිදුවී විට නිසි බලධරයා වෙත ඒ වෙනස පිළිබඳ එය සිදුවී දින තිහක් ඇතුළත ලිඛිතව දැනුම් දිය යුතුය.

ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලීමෙහි විස්තරවල ඇති යම් වෙනසක් නිසි බලධරයා වෙත දැනුම් දිය යුතු බව.

**19**. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, බලාත්මකව පවතින බලපත්‍රය ඉකුත්වීමට ලිත් මාස තුනකට පෙරාතුවම වූ කාලසීමාව ඇතුළත තත් කාර්යය සඳහා කරනු ලබන නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් මත, නිසි බලධරයා විසින් අවුරුදු තුනක කාලයක් සඳහා අලුත් කරනු ලැබිය හැකිය. බලපත්‍රය අලුත් කිරීම

**20**. බලපත්‍රය දරන්නා විසින් මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක යම් විධිවිධානයනක් උල්ලංඝනය කර ඇති බව හෝ, බලපත්‍රය යටත් වන යම් නියමයක් හෝ කොන්දේසියක් උල්ලංඝනය කර ඇති බවට නිසි බලධරයා සෑහීමට පත්වුවහොත් කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් බලපත්‍රය දරන්නාට ලබාදීමෙන් පසුව, නිසි බලධරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද හෝ අලුත්කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම, කරනු ලැබිය හැකිය. බලපත්‍රය අවලංගු කිරීම

**21.** (1) 16 වන වගන්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මඟින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද හෝ අලුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම හෝ අලුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම මගින් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රය ලියාපදිංචි කිරීම හෝ අලුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳ තීරණය ලැබීමෙන් දින තිහක් ඇතුළත, ඒ තීරණයට එරෙහිව කමිටුව වෙත අභියාචනය කරනු ලැබිය හැකිය. ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම ආදියට එරෙහිව කරනු ලබන අභියාචන

(2) (1) වන උප වගන්තිය යටතේ වූ අභියාචනයක් පිළිබඳ කමිටුවේ තීරණය මගින් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙකු, විසින්, ඒ තීරණයට එරෙහිව, අවසාන තීරණයක් සඳහා අමාත්‍යවරයා වෙත ලියවිල්ලක් මගින් අභියාචනය කරනු ලැබිය හැකිය. ඒ අභියාචනා දෙක පිළිබඳ කටයුතු මාස එකක කාල සීමාවක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතුය.

## IV වන කොටස

## පෙර පාසැල් ගුරුවරු

**22**. (1) පෙර පාසැල් ගුරුවරුන් සඳහා අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් ඔහු හෝ ඇය සතුව ඇත්නම් මිස, තැනැත්තෙකු පෙර පාසැලක ගුරුවරයකු වශයෙන් පත් කිරීම සඳහා සුදුස්සකු නොවිය යුතුය. පෙර පාසැල් ගුරුවරුන් සඳහා සුදුසුකම්

(2) පෙර පාසැල් ගුරුවරුන් සඳහා අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් රීති මගින් නියමිත පරිදි විය යුතුය.

පෙර පාසැල් ගුරුවරුන් සඳහා රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු බව.

**23**. මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ලියාපදිංචි කරන ලද සියලු පෙර පාසැල්වල ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ නම් හා සුදුසුකම් ඇතුලත් පෙර පාසැල් ගුරුවරුන් සඳහා වූ රෙජිස්ටරයක්, නිසි බලධරයා විසින් පවත්වාගෙන යනු ලැබිය යුතුය.

පෙර පාසැල් ගුරුවරුන් සඳහා පුහුණුව.

**24**. (1) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද පෙර පාසැල්වල ගුරුවරුන් හා විදුහල්පතිවරුන් සඳහා, නිසි බලධරයා විසින් කලින් කලට වැඩමුළු, පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ සංවිධානය කරනු ලැබිය හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ නිසි බලධරයා විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන්වලට එක් පෙර පාසැලකින් ගුරුවරුන් යම් සංඛ්‍යාවක් සහභාගි වීමට සැලැස්විය යුතු යයි මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද පෙර පාසැල් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ට නිසි බලධරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද පෙර පාසල්වල ගුරුවරුන් අතුරෙන් යටත් පිරිසෙයින් එක් ගුරුවරයෙකුවත් පුහුණු වැඩසටහනට සහභාගි කරවීම, එසේ කළ යුතු යයි (2) වන උප වගන්තිය යටතේ නිසි බලධරයා විසින් නියම කරනු ලැබූ විට, එවැනි පෙර පාසලක් පවත්වාගෙන යන තැනැත්තාගේ කාර්යය විය යුතුය.

පෞද්ගලික අධ්‍යාපන ආයතන ලියාපදිංචි කළ යුතු බව

**25**. (1) පෙර පාසල් ගුරුවරු සඳහා පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් මෙහෙයවනු ලබන, පළාත ඇතුළත පිහිටා ඇති ඕනෑම පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් රීතිවලින් නියම කර ඇති ආකාරයට නිසි බලධරයා වෙත ලියාපදිංචි විය යුතුය.

(2) නිසි බලධරයා විසින්, මේ වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික අධ්‍යාපන ආයතනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතුය.

(3) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාවට නැංවීමේ අරමුණින් නිසි බලධරයා විසින් නිකුත් කරනු ලබන යම් විධානයකට අනුකූලව කටයුතු කිරීම මේ වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති ඕනෑම පෞද්ගලික අධ්‍යාපන ආයතනයකම කාර්යය විය යුතුය.

## V වන කොටස

## පොදු විධිවිධාන

26.(1) කමිටුවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ අමාත්‍යවරයා විසින් කලින් කල කමිටුවට සාමාන්‍ය විධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, කමිටුව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතුය.

(2) කමිටුවේ සියළු ක්‍රියාකාරකම් හෝ යම් ක්‍රියාකාරකමක් පිළිබඳ යම් තොරතුරු ලබා දෙන ලෙස හෝ යම් වාර්තා ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කලට කමිටුවට විධාන කළ හැකි අතර කමිටුව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතුය.

විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය

27. නිසි බලධරයා හෝ නිසි බලධරයා විසින් ලියවිල්ලකින් නිසි පරිදි බලය දී ඇති යම් තැනැත්තකු විසින්, මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට හා මේ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක විධිවිධානවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන බව තහවුරු කර ගැනීමේ කාර්යය සඳහා, දවසේ යම් යුක්ති සහගත වේලාවකදී, මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වූ තැනැත්තකු පෙර පාසලක් පවත්වාගෙන යනු ලබන යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට ඇතුළුවීම, කළ හැකිය.

ඇතුළත් වීමේ බලය

28. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තිය මගින් නියමිත හෝ මේ ප්‍රඥප්තිය මගින් නියෝග සෑදීමට නියමිත යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

නියෝග

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කිරීමේ දින හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ අනනුමතයේ දින පටන්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

29. (1) මේ ප්‍රඥප්තිය යටතේ රීති සෑදීමට නියමිත හෝ බලය දී ඇති යම් කරුණක් සම්බන්ධයෙන් කමිටුව විසින් රීති සාදනු ලැබිය හැකිය.

රීති

(2) කමිටුව විසින් සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට බලාත්මක විය යුතුය.

වැරදි සහ දණ්ඩන

**30**. මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා වූ දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම, ඔහු යටත් විය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

**31**. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අර්ථ නිරූපණය

**32**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ,

"මහඇමතිවරයා" යන්නෙන් දකුණු පළාතේ මහ ඇමතිවරයා අදහස් වේ;

"ආණ්ඩුකාරවයා" යන්නෙන් දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"පළාත" යනනෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන්, 1987 අංක 42 දරණ පළාත් සභා පනත යටතේ පිහිටුවන ලද දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ;

"පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා" යන්නෙන් දකුණු පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා අදහස් වේ;

"පෙර පාසැල" යන්නෙන් වයස අවුරුදු තුනේ සිට පහ ආසන්නයේ ළමයින් සඳහා පූර්ව ළමාවිය සඳහා අධ්‍යාපනය ලබාදෙන්නා වූ ආයතනයක් අදහස් වේ.

# 34. දකුණු පළාත් සභාවේ 2008 අංක 03 දරන සෞඛ්‍ය ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ සඳහන් සෞඛ්‍ය විෂය ක්‍රියාත්මක කරමින් දකුණු පළාතේ සෞඛ්‍ය සේවාවන් ඵලදායී හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහාත් ඊට ආනුශාංගික වූ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 1952 අංක 12 දරන සෞඛ්‍ය සේවා පනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**01.** මෙම ප්‍රඥප්තිය 2008 අංක 03 දරන දකුණු පළාතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවයා විසින් අනුමත කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වන දිනය

## 1 වැනි කොටස

දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම.

**02.** දකුණු පළාතේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටුවනු ලැබේ.

දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

**03.** (1) මෙහි මින්මතු අධ්‍යක්ෂ වශයෙන් සඳහන් කරනු ලබන අධ්‍යක්ෂ දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානියා වන්නේය.

දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය

(2) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය පත් කිරීම, ඔවුන් ස්ථාන මාරු කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාල වන්නේය.

(3) දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දකුණු පළාත් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතුය.

**04.** දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අරමුණු පහත පරිදි වේ:-

*දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අරමුණු*

(අ) ජනතාවගේ සෞඛ්‍ය වර්ධනය සැලසුම් කිරීම.

(ආ) සෞඛ්‍ය ආයතන පිහිටුවා ඒ තුලින් ඵලදායී හා කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් පවත්වා ගැනීම

(ඇ) ප්‍රජා සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, ආහාර, සෞඛ්‍ය රක්ෂණය හා පාරිසරික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය පහසුකම් සැලසීම හා:

(ඉ) සෞඛ්‍ය ආයතනවල සේවය කරන පිරිස්වලට අවශ්‍ය දැනුම හා හැකියාව ලබාදීම:

(ඊ) මහජන සෞඛ්‍ය නීතිරීති බලාත්මක කිරීම

**05**. දෙපාර්තමේන්තුවේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

*දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කාර්යයන්*

(අ) පළාත් සඳහා සෞඛ්‍ය වර්ධන සැලසුමක් පිළියෙල කිරීම.

(ආ) ඉහත (අ) යටතේ පිළියෙල කළ සැලැස්ම අනුව එක් එක් වර්ෂය සඳහා වාර්ෂික සෞඛ්‍ය සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

(ඇ) ශික්ෂණ රෝහල් සහ විශේෂ කාර්ය සඳහා පිහිටුවන රෝහල් හැර මහජන රෝහල, මාතෘ නිවාස, බෙහෙත් ශාලා සහ වෙනත් සෞඛ්‍ය ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම.

(ඈ) අවශ්‍ය වන පරිදි කළින් කලට රෝහල් වල තත්ත්වය උසස් කිරීම.

(ඉ) පවත්නා සෞඛ්‍ය ආයතන තුළින් ඵලදායී හා කර්යක්ෂම සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යාම.

(ඊ) 1 වැනි උප ලේඛනයේ දැක්වෙන අංශවලින් සමන්විත වූ ප්‍රජා සෞඛ්‍ය සේවා ඇතුළුව මහජන සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම, සෞඛ්‍ය අධ්‍යාපනය පුළුල් කිරීම, පෝෂණය නංවාලීම ආහාර සෞඛ්‍යාරක්ෂණය විධිමත් කිරීම හා පාරිසරික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම.

(උ) ඖෂධ මිලදී ගැනීම හැර සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යාම පිණිස සෞඛ්‍ය ආයතන වලට පහසුකම් සැලසීම.

(ඌ) සෞඛ්‍ය ආයතනවල සේවය කරන පිරිස්වලට අවශ්‍ය දැනුම හා හැකියාව ලබා දීම සඳහා ශ්‍රී ලංකාව තුළ පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම ඇතුළුව අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(එ) ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව රෝගීභාවය හා මරණ සංඛ්‍යාව අඩු කරන්නා වූ සේවාවන් වැඩි දියුණු කිරීම.

(ඒ) රෝගී සත්කාර සේවාවල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම.

(ඔ) දෙපාර්තමේන්තුව විසින් ජනතාවට සපයනු ලබන සෞඛ්‍ය සේවාවන්හි ගුණාත්මක භාවය වර්ධනය කිරීම, ඇගයීම පිණිස එම සේවාවන් සපයන ආයතනවල හා ඒවායේ සේවයේ නිරතව සිටින සේවකයන්ගේ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රම ඇති කිරීම.

(ඕ) සෞඛ්‍ය සේවා සැලැස්වීම, වැඩිදියුණු කිරීම හා අධීක්ෂණය කිරීම පිණිස අවශ්‍ය ආයතනික විධිවිධාන ඇති කිරීම.

(ක) පළාත තුළ සෞඛ්‍ය කටයුතුවල යෙදෙන කවර හෝ ආයතන ලියාපදිංචි කිරීම හා එම කටයුතු කරගෙන යාමේදී එම ආයතන විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ හා නිර්නායකයන් නියම කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

(ඛ) දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පිණිස ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීම.

(ච) පහත කාර්යයන් ඉටු කිරීම පිණිස අවශ්‍ය විය හැකි ආනුශාංගික පියවර ගැනීම.

(ඡ) පළාතේ ජනතාවගේ සෞඛ්‍යයට හා එය නංවාලීම පිණිස සලසනු ලබන සේවාවන්ට අදාළ තොරතුරු එක්රැස් කිරීම හා අවශ්‍ය අයට ඒවා ලබා දීම.

**06**. දෙපාර්තමේන්තුවේ බලතල පහත සඳහන් පරිදි වේ.

දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ බලතල

(1) මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුවේ අරමුණු සපුරා ගැනීමට හා එයට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන්නා වූ සියළු බලතල, ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව දෙපාර්තමේන්තුව සතුවිය යුතුය.

(2) දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්ය භාරය ඉටු කිරීමට අදාළව අධ්‍යක්ෂවරයා විසින් පළාත් සභාවේ ආයතන වලින් පළාත්පාලන ආයතනවලින්, මහජන සංවිධානවලින් හෝ පුද්ගලයන්ගෙන් යම් තොරතුරක් ඉල්ලා සිටියහොත් ඒ ආයතන, සංවිධාන හෝ පුද්ගලයන් විසින් එම තොරතුරු ලබා දිය යුතුය. එමෙන්ම මහජන සෞඛ්‍ය සංරක්ෂණය සඳහා යෝජනා කෙරෙන වැඩසටහන් සඳහා පළාත් සභාවේ ආයතන සහ පළාත් පාලන ආයතන තම දායකත්වය හා සහයෝගය අධ්‍යක්ෂවරයාට නොපමාව ලබාදිය යුතුය.

ඖෂධ සමාලෝචන කමිටු පිහිටුවීම

**07**. එක් එක් දිස්ත්‍රික්කයට සඳහා ඖෂධ සමාලෝචන කමිටුව බැගින්ද, පළාත සඳහා ඖෂධ සමාලෝචන කමිටුවක් ද මෙයින් පිහිටුවනු ලැබේ.

දිස්ත්‍රික් ඖෂධ සමාලෝචන කමිටුවේ සංයුතිය

**08**. දිස්ත්‍රික් ඖෂධ සමාලෝචන කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය.

i. නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - සභාපති
ii. ප්‍රාදේශීය ඖෂධවේදී - ලේකම්
iii. ප්‍රාදේශීය ලියාපදිංචි වෛද්‍යනිලධාරී
iv. ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ ගබඩා නිලධාරී
v. වෛද්‍ය අධිකාරීන් හා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්

දිස්ත්‍රික් ඖෂධ සමාලෝචන කමිටුවේ කාර්යයන්

**09**. (අ) දිස්ත්‍රික්කයේ එක් එක් සෞඛ්‍ය ආයතන සඳහා ඖෂධ වෙනුවෙන් වෙන්කළ යුතු මූල්‍ය ප්‍රතිපාදන තීරණය කිරීම.

(ආ) දිස්ත්‍රික්කයේ එක් එක් සෞඛ්‍ය ආයතන සඳහා සැපයිය යුතු ඖෂධ පිළිබඳ වාර්ෂික ඇස්තමේන්තු අනුමත කිරීම.

(ඇ) දිස්ත්‍රික්කය තුළ ඖෂධ සැපයුම්, බෙදා හැරීම් හා භාවිතය විධිමත් වූ පරිදි සිදුවන්නේ දැයි විමසිලිමත් වීම.

(ඇ) ඖෂධ හා වෙනත් සැපයුම් භාවිතය පිරිමැසුම්දායක අයුරින් සිදුවන බවට වගබලා ගැනීම.

(ඉ) අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග සෑම සෞඛ්‍ය ආයතනයකම, ප්‍රමාණවත් පරිදි තිබෙන බවට වගබලා ගැනීම හා

(ඊ) අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් කාර්යයන් ඉටු කිරීම.

## දිස්ත්‍රික් සමාලෝචන කමිටුවේ කාර්යය පරිපාටිය පහත සඳහන් පරිදි වන්නේය.

**10**. (1) දිස්ත්‍රික් ඖෂධ සමාලෝචන කමිටුව දෙමසකට වරක්වත් රැස්විය යුතුය.

දිස්ත්‍රික් ඖෂධ සමාලෝචන කමිටුවේ කාර්යය පරිපාටිය

(2) කමිටුවේ රැස්වීමේ වාර්තාවේ පිටපතක් බැගින්, පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයාටත්, අධ්‍යක්ෂවරයාටත් කමිටුවේ එක් එක් සාමාජිකයාටත් යැවිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධිවිධාන වලට යටත් කමිටු රැස්වීම් වලදී අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය කමිටුව විසින් ම තීරණය කරගත යුතුය.

**11**. පළාත් ඖෂධ සමාලෝචන කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය.

පළාත් ඖෂධ සමාලෝචන කමිටුවේ සංයුතිය

i. සෞඛ්‍ය විෂය පැවරී ඇති අමාත්‍යාංශයේ ලේකම්, සභාපති
ii. අධ්‍යක්ෂ - ලේකම්
iii. පළාත් ඖෂධවේදී
iv. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
v. මූලික රෝහල්වල දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්

පළාත් ඖෂධ සමාලෝචන කමිටුවේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

පළාත් ඖෂධ සමාලෝචන කමිටුවේ කාර්යයන්

**12**. (අ) පළාතේ එක් එක් සෞඛ්‍ය ආයතන සඳහා ඖෂධ වෙනුවෙන් වෙන් කෙරෙන මූල්‍ය ප්‍රතිපාදන සමාලෝචනය කිරීම.

(ආ) පළාතේ එක් එක් සෞඛ්‍ය ආයතන සඳහා සැපයිය යුතු ඖෂධ පිළිබඳ වාර්ෂික ඇස්තමේන්තු සමාලෝචනය කිරීම.

(ඇ) පළාත තුළ ඖෂධ සැපයුම්, බෙදා හැරීම් හා භාවිතය විධිමත් වූ පරිදි සිදුවන්නේ දැයි සමාලෝචනය කිරීම.

(ඈ) කල් ඉකුත් වීමට පෙර ඖෂධ වර්ග අවශ්‍ය ආයතනවලට බෙදා හැරෙන්නේද යන්න සහ බෙදා හරින්නා වූ ඖෂධ නිසි ලෙස හා විධි වූ පරිදි පරිහරණය කෙරෙන්නේදැයි යන්න සමාලෝචනය කිරීම.

(ඉ) පළාතේ ඖෂධ මිලදී ගැනීම විධිමත් පරිදි සිදුවන්නේ දැයි සමාලෝචනය කිරීම, හා

(ඊ) පළාතේ සෞඛ්‍ය ආයතනවලට අවශ්‍ය ඖෂධ නිසිලෙස සැපයෙන බව හා එම ආයතන විසින් ඒවා නිසි ලෙස පරිහරණය කෙරෙන බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර නිර්දේශ කිරීම.

**13**. (1) පළාත් ඖෂධ සමාලෝචන කමිටුව දෙමසකට වරක්වත් රැස්විය යුතුය.

(2) කමිටුවේ රැස්වීමේ වාර්තාවේ පිටපතක් බැගින්, අමාත්‍යවරයාගේ කමිටුවේ එක් එක් සාමාජිකයාටත් යැවිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධිවිධාන වලට යටත්ව කමිටු රැස්වීම් වලදී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය කමිටුව විසින්ම තීරණය කරගත යුතුය.

පළාත් ඖෂධ සමාලෝචන කමිටුවේ කාර්ය පටිපාටිය

**14**. දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ එදිනෙදා කටයුතු හා සේවා නිසි පරිදි ඉටු කෙරෙන බවට වගබලා ගැනීම පහසු කිරීම සඳහා හදිසි විමර්ශන ඒකකයක් පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පිහිටුවිය යුතුය.

හදිසි විමර්ශණ ඒකකය

**15**. පළාත් අමාත්‍යාංශ ලේකම් වරයාට සුදුසු යැයි හැඟෙන සාමාජික සංඛ්‍යාවක් මෙම විමර්ශන ඒකකයට පත්කළයුතු අතර, ඔවුන් අතරින් එක් අයෙකු ඒකකයේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කිරීමට පත්කළ යුතුය. සෞඛ්‍ය සේවා සහ රෝහල් පරිපාලනය ගැන පසුබිම් දැනුමක් තිබෙන අය මේ සඳහා හැකිතාක් දුරට යොදාගත යුතුය.

හදිසි විමර්ශන ඒකකයේ සංයුතිය

**16**.(1) වෙනත් කරුණු වලට අමතරව පහත සඳහන් කරුණු හදිසි විමර්ශනයට ලක්විය යුතුය.

i. කාර්ය මණ්ඩලයේ පැමිණීම
ii. මුදල් පරිහරණය
iii. සාමාන්‍ය සහ පාරිභෝජ්‍ය ගබඩා ද්‍රව්‍ය සහ ලිපිද්‍රව්‍ය
iv. ඖෂධ
v. එක්ස් කිරණ සේයා පටල, රසායන ද්‍රව්‍ය සහ රසායනාගාර උපකරණ
vi. මුළුතැන් ගෙවල් සහ ආහාර පිළියෙල කිරීම
vii. කාර්ය මණ්ඩල පුද්ගලික වගන්තියෙහි යෙදීම
viii. අමතර සේවා රාජකාරි ගෙවීම් සහ අතිකාල දීමනා
ix. නිල වාහන සහ නිල ඇඳුම්
x. දෙපාර්තමේන්තු වාහන
xi. සනීපාරක්ෂක තත්ත්වය
xii. මහජන පැමිණිලි

හදිසි විමර්ෂණ ඒකක යේ කාර්යයන්

(2) යම්කිසි කාරණයක් පිළිබඳව පළාත් අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අධ්‍යක්ෂවරයාට හෝ ලැබෙන මහජන පැමිණිල්ලක් ගැන සොයා බලා ඒ ගැන වාර්තා කිරීම හදිසි විමර්ෂන ඒකකයකට පැවරීමට හැක.

හදිසි විමර්ෂණ ඒකකයේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය සහාය

**17.** (1) මෙම ප්‍රඥප්තිය යටතේ හදිසි විමර්ෂන ඒකකයට පැවරෙන කටයුතු ඉටු කිරීම පිණිස එම ඒකකයට සහයෝගය දීමට දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීහු බැඳී සිටිති.

(2) ඒකකයේ විමර්ෂනය සඳහා අවශ්‍ය වන සියළු තොරතුරු, ලිපිලේඛන හා ද්‍රව්‍ය ඉල්ලා සිටීමට හා ලබා ගැනීමට බලය ඒකකයට ඇත. එවැනි ඉල්ලීමක් ලැබුණු විට එම ඉල්ලීම ඉටු කිරීමට සියළු නිලධාරීහු බැඳී සිටිති.

(3) විමර්ෂන ඒකකයේ කටයුතු සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ සහාය අවශ්‍ය වන විට එය ලබාදිය යුතු අතර, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ.

## II වන කොටස

## පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාව හා රෝහල් කමිටු.

පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාව පිහිටුවීම

**18.** පළාත තුළ සෞඛ්‍ය සේවා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාවක් තිබිය යුතුය.

පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාවේ සංයුතිය

**19.** (1) පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන තැනැත්තන්, එනම්,

i. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්
ii. අධ්‍යක්ෂ
iii. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

(ආ) වෙනත් සාමාජිකයන්

i. ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්.
ii. සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය හා ප්‍රජාව නියෝජනය වන පරිදි අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.
iii. පෞද්ගලික රෝහල් නියෝජනය කිරීම පිණිස අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන එක් සාමාජිකයෙක්.

(2) පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාවේ සාමාජිකයන් නොවූ කළ දකුණු පළාත් සභාවේ කාර්ය පරිපාටි රීති සංග්‍රයේ විධි විධාන අනුව පිහිටුවා ඇති සෞඛ්‍ය විෂය පැවරී ඇති අමාත්‍යාංශයේ උපදේශක කමිටුවේ සාමාජිකයන්ට ද උපදේශක සභාවේ රැස්වීම් වලට සහභාගි වීමට අයිතියක් ඇත. එහෙත් යෝජනා සම්මතයක්ද ඡන්දය පාවිච්චි කිරීමේ අයිතියක් ඔවුන්ට නොතිබිය යුතුය.

(3) අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් උපදේශක සභාවේ සභාපති වන්නේය.

(4) අධ්‍යක්ෂවරයා නිල බලයෙන් උපදේශක සභාවේ ලේකම්වරයා වන්නේය.

සාමාජික ධූර කාලය

(5) මෙම වගන්තිය යටතේ නම් කරනු ලබන සෑම සාමාජිකයෙකුම මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධූරය අත්හරිනු ලැබුවහොත් මිස අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය හැකිය.

(6) මේ වගන්තිය යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයෙකු මිය ගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ඒ මිය ගිය, ඉල්ලා අස්වූ හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තෙකු සාමාජිකයෙකු වශයෙන් අමාත්‍යවරයා විසින් මෙම වගන්තියේ විධිවිධාන සැළකිල්ලට ගනිමින් පත් කරනු ලැබිය හැකිය.

(7) මෙම වගන්තිය යටතේ පත්කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයෙකු ස්වකීය ධූරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මිය යාම හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා ධූරය අත්හැරියහොත් මිස තමා අනුප්‍රාප්ත වන සාමාජිකයා ගේ ධූර කාලයෙන් ඉකුත් කොට නැති කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(8) මේ වගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයෙකු වීම නිසා හෝ වෙනත් අබලතාවයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධූරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් මෙම වගන්තියේ විධිවිධාන සැළකිල්ලට ගනිමින් වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

(9) මෙම වගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයෙකු හේතු දක්වා අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(10) මෙම වගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයෙකු අමාත්‍යවරු අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැක.

(11) ධූරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයෙකු හැර මෙම වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයෙකු ධූරයට නැවත පත් කිරීම සඳහා සුදුසුස්සෙකු වන්නේය.

ධූරයෙන් ඉවත් කිරීම හා ඉල්ලා අස්වීම

**20**. . (1) උපදේශක සභාව දෙමසකට වරක්වත් රැස්විය යුතුය.

(2) උපදේශක සභාවේ රැස්වීම් සඳහා සන පූරණය මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකකි.

(3) රැස්වීම් වාර්තාවල පිටපත් සාමාජිකයින්ටත්, අමාත්‍යවරයාටත් ලැබෙන්නට සැලැස්වීම ලේකම්වරයාගේ වගකීම වන්නේය.

(4) අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධිවිධානවලට යටත්ව සභාවේ කාර්ය පරිපාටිය සභාව විසින්ම තීරණය කරගත යුතුය.

පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සභාවේ කාර්ය පරිපාටිය

**21**. (1) පළාත තුළ පිහිටි රෝහල්, මූලික රෝහල්, දිස්ත්‍රික් රෝහල්, වතු රෝහල් සහ පර්යන්ත ඒකක සඳහා රෝහල් කමිටු මෙයින් පිහිටුවනු ලැබේ.

රෝහල් කමිටු පිහිටුවීම හා ඒවායේ සංයුතිය

(2) ඉහත (1) වැනි උප වගන්තිය යටතේ පිහිටුවනු ලබන රෝහල් කමිටුවක සංයුතිය පහත සඳහන් පරිදි වන්නේය.

(අ) අදාළ රෝහල් පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් සහ වෛද්‍ය නිලධාරී, පොලිස් ස්ථානාධිපති,

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන,

i. අදාළ රෝහල් පිහිටි ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන දෙකක, නියෝජිතයින් දෙදෙනෙක්.

ii. නීතිය සහ අධ්‍යාපනය යන වෘත්තීන් තුළ ප්‍රවණතාවයක් ඇති දෙදෙනෙකු, සහ

iii. පූජ්‍ය පක්ෂයේ එක් සාමාජිකයෙකු

(3) (2) වැනි උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කරන ලද සාමාජිකයෙකු හේතු දැක්වීමෙන් අනතුරුව ධූරයෙන් ඉවත් කිරීමේ බලය අමාත්‍යවරයාට ඇති අතර, එවැනි සාමාජිකයෙකු ධූරයෙන් ඉල්ලා අස්වීමට හිමිකම් ලබන්නේය.

(4) (2) වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්ගේ ධූර කාලය අවුරුදු තුනක් විය යුතු අතර, කවර හෝ හේතුවක් නිසා එසේ පත් කරන ලද සාමාජිකයෙකුගේ ධූරය නියමිත දිනට පෙර හිස්වුවහොත් ඒ හිස්වූ ධූරය සඳහා වෙනත් තැනැත්තෙකු ඒ ඡේදයේ විධිවිධානවලට යටත්ව පත් කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය. එසේ පත් කරනු ලබන සාමාජිකෙයකු පිණිස අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවූ ධූරකාලය සඳහා ධූරය දැරිය යුතුය. සාමාජික ධූර කාලය

(5) (1) නිල බලයෙන් ප්‍රාදේශීය ලේකම් රෝහල් කමිටුවේ සභාපති වන්නේය.

(2) රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී, කමිටුවේ ලේකම්වරයා විය යුතුය.

**22**. 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ රෝහල් කමිටුවක කාර්යය පහත සඳහන් පරිදි වේ. රෝහල් කමිටු කාර්යයන්

(අ) රෝහල් සහ මහජනතාව අතර සම්බන්ධීකරණය ඇති කිරීම;

(ආ) අවශ්‍ය වූ විටෙක මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම;

(ඇ) රෝහල් සංවර්ධනය හා සුභසාධන කාර්යයන් ඉටු කිරීම; සහ

(ඈ) රෝගීන් සඳහා ගුණාත්මක සේවාවක් සලසනු ලබන්නේදැයි පරීක්ෂා කිරීම.

**23**. (1) කමිටුවේ සභාපතිවරයා එහි සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු අතර, සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති විටෙක ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා පත්කරගත යුතුය. රෝහලේ කමිටුවල කාර්යය පරිපාටිය

(2) සෑම මාසයකම එක්වරක් හෝ කමිටුව රැස්විය යුතු අතර, කමිටුවේ වාර්තාව අදාල රෝහල හෝ ඒකකය පිහිටි දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත කමිටුවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර නොගන්නේ නම්, ඒ පිළිබඳව හේතු විමසීමට කමිටුවට අයිතිවාසිකමක් ඇත්තේය.

(3) කමිටුවේ රැස්වීමක් සඳහා සන පූර්ණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි.

## III වැනි කොටස

## වරදවල් සහ දඬුවම්.

**24**. මෙම ප්‍රඥප්තියේ ඒ යටතේ සම්පාදනය කරන ලද යම් නියෝගයක් හෝ විධිවිධාන කඩකරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සම්පාදිත නියෝග යටතේ යම් කාර්යයක් පැවරී ඇති අයෙකු එම කාර්යය ඉටු කිරීම කෙරෙහි උවමනාවෙන්ම අවහිර කරන හෝ පුද්ගලයෙකු, ලිඛිත, නීතියේ විධිවිධානයන්ට යටත්ව මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරු වන්නේය. වරදවල්

**25.** මේ ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වූ ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් එක්දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු 2 ක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය. දඬුවම්

## IV වැනි කොටස

## පොදු විධිවිධාන

**26.** මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සෞඛ්‍ය විෂය ක්‍රියාත්මක කිරීම උදෙසා රජය විසින් පවරා දෙනු ලැබූ හෝ වෙනත් ආකාරයකට ලැබුනා වූ හෝ යම් වත්කම් හෝ දේපලක් යොදවා තිබුණි නම් එම වත්කම් හා දේපල මෙම ප්‍රඥප්තිය යටතේ දෙපාර්තමේන්තුවට පැවරී ඇති වත්කමක් හෝ දේපලක් වශයෙන් සැළකිය යුතුය. දෙපාර්තමේන්තුවේ වත්කම්

**27.** (1) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතන නඩත්තුව උදෙසා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක: 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාළ වන්නේය. දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන හා ආධාර

(2) ලිඛිත නීතියෙහි විධිවිධානයන්ට යටත්ව දෙපාර්තමේන්තුවේ කටයුතු උදෙසා දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීමට අවස්ථාව තිබිය යුතුය

ද්‍රව්‍යමය ආධාර ලබා ගැනීමට බාධාවක් නොතිබිය යුතුය.

**28.** (1) වර්ෂය තුළ දී පළාත තුළ සෞඛ්‍ය සේවා පවත්වා ගන්නා ලද ආකාරය, පැන නැගුණු ගැටළු, ඒවා විසඳීමට ගත් පියවර, සෞඛ්‍ය පිළිබඳ උපනතීන් හා සෞඛ්‍ය විෂය ක්‍රියාත්මක වීමට අදාළ වෙනත් කරුණු ගැන සඳහන් කෙරෙන වාර්ෂික පාලන වාර්තාවක් එක් එක් වර්ෂය ඉකුත්ව මාස හයක කාලයක් ගත වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය.

වාර්ෂික පාලන

(2) ඉහත උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පාලන වාර්තාව අමාත්‍යවරයා විසින් සාධාරණ කාලයක් තුළ පළාත් සභාවෙහි සභාගත කළ යුතුය.

**29.** දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවට විශේෂ හෝ සාමාන්‍ය හෝ විධිවිධාන ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, දෙපාර්තමේන්තුව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුත්තේය.

විධාන නිකුත් කිරීමට බලය

**30.** (1) මේ ප්‍රඥප්තියෙන් නියම කරනු ලැබූ හෝ නියෝග සෑදීමට බලය දී ඇති හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් ද විශේෂයෙන්ම පහත සඳහන් කාරණා සම්බන්ධයෙන්ද අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

නියෝග

(අ) සෞඛ්‍ය ආයතන පිහිටුවා පවත්වාගෙන යාම;

(ආ) ආයතනයන්හි හා සේවාවන්හි කාර්ය සාධන ඇගැයීම;

(ඇ) රෝහල්වල පහසුකම් පිළිබඳව නිර්ණායක ඇති කිරීම;

(ඈ) පළාත තුළ ඖෂධ බෙදාහැරීම;

(ඉ) සෞඛ්‍ය කාර්යයන්හි යෙදෙන සංවිධානයන් ලියාපදිංචි කිරීම;

(ඊ) පළාත් සෞඛ්‍ය සේවා උපදේශක සහ රෝහල් කමිටුවක්;

(උ) දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ආධාර ලබා ගැනීම;

(ඌ) දෙපාර්තමේන්තු කටයුතු විමර්ශනය කිරීමේ විධිවිධාන සැලසීම.

(2) (1) වැනි උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමැතිය සඳහා එය පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව අනුමත නොකළ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතුය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ සේ සලකනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබිය යුතුය.

**31**. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුවම වූ දිනයෙහි සෞඛ්‍ය විෂය ක්‍රියාත්මක කිරීම උදෙසා යම් ආකෘතියක, දැන්වීක්, බලපත්‍රයක්. ලේඛනයක් හෝ එවැනි ලියවිල්ලක් භාවිතා කළ යුතු යැයි නියම කර තිබුණේ නම් ඒ ආකෘතිය, දැන්වීම, බලපත්‍රය, ලේඛනය හෝ ලියවිල්ල මෙම ප්‍රඥප්තිය යටතේ නියම කරන ලද එකක් යැයි සැලකිය යුතුය.

අන්තර්කාලීන විධිවිධාන

**32**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි

අර්ථ නිරූපනය

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාවේ සෞඛ්‍ය විෂය පැවරී ඇති අමාත්‍යවරයාද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාද,

"නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන යටතේ දකුණු පළාතට පත්කර ඇති

"නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු" ද අදහස් කෙරේ.

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත ද,

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාතේ පළාත් සභාවද,

"ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාද,

"සෞඛ්‍ය ආයතන" යන්නෙන් මූලික රෝහල්, දිසා රෝහල්, ග්‍රාමීය රෝහල් පර්යන්ත ඒකක, මාතෘ නිවාස හා මධ්‍යම බෙහෙත් ශාලා, නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, ප්‍රාදේශීය මැලේරියා මර්දන නිලධාරී කාර්යාල, ළය රෝහල්, බරවා රෝග මර්දන ඒකකය, ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන ද,

"සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන යටතේ දකුණු පළාතට පත් කර ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ද අදහස් කෙරේ.

**33.** මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

කුමාරි බාලසූරිය,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

## පළමුවැනි උපලේඛනය
## (5 වැනි වගන්තිය)

1. ප්‍රමාණවත් මනා පෝෂණය.
2. ආරක්ෂිත පානීය ජලය.
3. මූලික සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව.
4. මාතෘ සත්කාරය.
5. පවුල් සංවිධානය.
6. බිළිඳුන් හා පෙර පාසල් දරුවන්ට සහ වැඩි අවධානයක් යොමු කරමින් දාරක සත්කාරය.
7. ප්‍රතිශක්තිකරණය.
8. සුලභ බෝවන රෝග මර්දනය හා වැලැක්වීම:-
   (අ) දැනුම් දිය යුතු සියළු රෝග;
   (ආ) පාචන රෝග හා අතීසාරය;
   මැලේරියාව, බරවා, ක්ෂය රෝග, ලාදුරු, ජලභීතිකාව, මානව ප්‍රතිශක්ති ඌණතා වෛරසය/ නතු කරගත් ප්‍රතිශක්ති ඌණතා සහ ලක්ෂණය ඇතුළුව සමාජ රෝග
9. සුලභ බෝවන රෝග මර්දනය හා වැලැක්වීම:-
   (අ) හෘද රෝග;
   (ආ) හදිසි අනතුරු;
   (ඇ) පිලිකා;
   (ඈ) දියවැඩියාව;
   (ඉ) අධි රුධිර පීඩනය.

10. සුලභ සුළු ආබාධ හා හදිසි තත්ත්වයන් සුදුසු පරිදි හා කල් තියා කළමනාකරණය කිරීම.
11. සරල පුනරුත්ථාපනය.
12. මානසික සෞඛ්‍යය.
13. දන්තාබාධ නිරාවරණය ද ඇතුළුව මුඛ සෞඛ්‍යය.
14. පාසල් සෞඛ්‍ය.

15. දෘෂ්ඨීය අඩු වීම හා වැලැක්වීම හා අන්ධභාවය වැලැක්වීම.
16. වෘත්තීය සෞඛය හා පාරිසරික සේවය.
17. සෞඛ්‍ය අධ්‍යාපනය හා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාරය සඳහා ප්‍රජා සංවිධානය.
18. ආහාර සෞඛ්‍ය.
19. මහජන සෞඛ්‍ය නීති රීති බලාත්මක කිරීම.

07-628

## 35. දකුණු පළාතේ පළාත් සභාවේ 2008 අංක 05 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිහිටුවීම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙහි නව වැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ විෂය අංක 03 සහ ඊට අදාළ පරිශිෂ්ටය III හි සඳහන් පවරන ලද කාර්යයන් හා ඒ සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.මෙම ප්‍රඥප්තියෙහි විධි විධාන, සංශෝධිත 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනතේ විධිවිධාන හා අනුකූල නොවන්නේය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ -

**1.** මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පළාත් සභාවේ 2008 අංක 05 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය (මෙහි මින් මතු ආණ්ඩුකාරවරයා යනුවෙන් හඳුන්වනු ලබන දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් සහතික කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතුය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**2.** මෙම ප්‍රඥප්තියෙහි කාර්යයන් සඳහා (මෙහි මින් මතු දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) දකුණු පළාතේ පළාත් සභාවෙහි පිහිටුවිය යුතුය.

දකුණු පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිහිටුවීම.

**3.** (1) (මෙහි මින් මතු "අමාත්‍යවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) සභාවේ අධ්‍යාපනය පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන දකුණු පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම ප්‍රඥප්තිය පරිපාලනය කිරීම භාරව සිටිය යුතුය.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් අධ්‍යාපන ලේකම්ගේ එකඟත්වය මත සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සභාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ යන පදවි නාමය යටතේ (මෙහි මින් මතු "අධ්‍යක්ෂ" යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතුය. ඔහු මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විය යුතුය.

(3) මෙම ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කළ යුතුය.

(4) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුවම දිනයෙහි දී පැවති දෙපාර්තමේන්තුව මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සේ සැලකිය යුතු අතර, එකී දින එම දෙපාර්තමේන්තුවේ තනතුර, නිලතල දැරූ සෑම නිලධාරියකුම සහ සේවකයකුම මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබුවා සේ සැලකිය යුතුය. එසේ ම ඔවුන් ඒ පරිද්දෙන් ම සේවයේ නිරත විය යුතුය.

නිලධාරීන් පත් කිරීම සහ මාරු කිරීම

**4.** (1) මෙම ප්‍රඥප්තිය යටතේ නිලධාරීන් සහ සේවකයින් පත් කිරීම සහ මාරු කිරීමේ කාර්යයන් ආණ්ඩුකාරවරයා භාරයේ පැවතිය යුතුය.

(2) අධ්‍යාපනික කාර්ය මණ්ඩල පත් කිරීම සහ මාරු කිරීම පිළිබඳ තමා සතු බලතල, ආණ්ඩුකාරවරයා විසින් විටින් විට සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාන මගින්, සභාවේ ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත් දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියෙකු වෙත පැවරිය හැකිය.

බලතල පැවරීම

**5.** මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරී ඇති ඕනෑම බලතලයක්, ඔහු විසින් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු හෝ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු වෙත පවරනු ලැබිය හැකිය.

දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

**6.** දෙපාර්තමේන්තුවේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(අ) මෙම ප්‍රඥප්තියෙහි උපලේඛනයෙහි සඳහන් සියලු පාසල් සඳහා පහසුකම් සැලසීම.

(ආ) මෙම ප්‍රඥප්තියෙහි උපලේඛනයෙහි සඳහන් සියලුම පාසල් අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම.

(ඇ) අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කිරීම, එය ක්‍රියාත්මක කිරීම සහ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම.

(ඇ) අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශක වරුන් සහ ගුරුවරුන්ගේ කාර්ය සාධන ඇගයීම්.

(ඉ) ජාතික අධ්‍යාපන ආයතනයේ සහ රේඛීය අමාත්‍යාංශයේ පූර්වානුමැතිය ඇතිව, සේවාස්ථ පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

(ඊ) විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ප්‍රාදේශීය විභාග පැවැත්වීම.

(උ) නොවිධිමත් අධ්‍යාපනය පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(ඌ) ප්‍රාථමික පාසල් විෂය මාලාවේ සහ ද්විතීයික අධ්‍යාපන විෂය මාලාවේ තෝරාගත් විෂයවල ප්‍රාදේශීයව වෙනස්කම් ඇති කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමැතිය ලබා ගැනීම.

(එ) ඉගැන්වීමේ ආධාරක, දෘශ්‍යාධාර හා ශ්‍රවනාධාර උපකරණ සහ ලී බඩු සපයා ගැනීම සහ බෙදා හැරීම.

(ඒ) පාසල් ගොඩනැගිලි, පුස්තකාල, ක්‍රීඩා භූමි හා අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම සහ ඒවා නඩත්තු කිරීම.

(ඔ) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සඳහන් කරනු ලබන, කිසියම් නිශ්චිත උපකරණ හැර, විද්‍යා උපකරණ සපයා ගැනීම සහ බෙදා හැරීම සහ

(ඕ) ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කරනු ලබන මග පෙන්වීම අනුව පාසැල් පුස්තකාල සංවිධානය කිරීම සහ සංවර්ධනය කිරීම.

මෙම ඡේදය යටතේ "නොවිධිමත් අධ්‍යාපනය" යන්නෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ප්‍රවණතා අනුව ළමයින්, වැඩිහිටියන්, පාසැල් හැර යන්නන්, විශේෂ කුසලතා ඇති ළමයින් හා අධ්‍යාපන ධාරාවෙන් බැහැර වන වෙනත් අය සඳහා විකල්ප අධ්‍යාපන අවස්ථා සලසා දීම අදහස් වේ.

**7.** (1) අමාත්‍යවරයා විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයහි ප්‍රවීණත්වයන් ලබා ඇති හත්දෙනෙකු ගෙන් සමන්විත (මෙහි මින් මතු "උපදේශක මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) සභාවේ අධ්‍යාපන උපදේශක මණ්ඩලයක් පත් කළ යුතුය.

සභාවේ උපදේශක මණ්ඩලය පිහිටුවීම සහ අනෙකුත් කාරණා

(2) උපදේශක මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය යුතුය -

(අ) සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිලබලයෙන්ම එහි සභාපති විය යුතුය.

(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා උපදේශක මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතුය.

(ඇ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සේවාවන්ට අයත් සාමාජිකයින් පස් දෙනෙකු.

i. අධ්‍යාපන පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු,

ii. අධ්‍යාපන පරිපාලන සේවයේ 1 වැනි පන්තියේ විශ්‍රාමලත් නිලධාරියෙකු,

iii. නීති ක්ෂේත්‍රයෙහි විශේෂ දැනුමක් සහ පළපුරුද්දක් ඇති අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු,

iv. විදුහල්පති සේවයේ 1 වැනි පන්තියේ විශ්‍රාමික නිලධාරියෙකු, සහ

v. ගුරු සේවයේ 1 වැනි පන්තියේ නිලධාරියෙකු.

(3) උපදේශක මණ්ඩලයට නම් කරන ලද නිලධාරීන් තම සේවා කාලයන් තුල දී කිසිදු චෝදනාවකට වරදකරු නොවූ තැනැත්තන් විය යුතුය.

(4) අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අධ්‍යක්ෂවරයා හැර, උපදේශක මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු සිය අභිමතය පරිදි හේතු දක්වා ඉවත් කිරීමේ බලය අමාත්‍යවරයා සතුවේ.

(5) ඉල්ලා අස්වීම , මරණය හෝ ධූරයෙන් ඉවත් කිරීම හේතු කොටගෙන කලින් තම ධූරය හිස්කලහොත් මිස උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු එසේ පත් කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් තම ධූරය දැරිය යුතුවේ

(6) උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු විසින් තත් කාර්යය සඳහා අමාත්‍යවරයා වෙත අමතන ලිපියක් මගින් කවර වේලාවකදී වුවද සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි වන්නේය.

(7) සාමාජිකයකු තම ධූර කාලය ඉවත් වීමට පෙර ඉල්ලා අස් වූ අවස්ථාවලදී ,ඒ වෙනුවට වෙනත් සුදුසු අයෙකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැකිය. එසේ පත්කරනු ලබන සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉතිරි කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(8) කාලය ඉකුත්වීමේ හේතුවෙන් හෝ ඊට ප්‍රථම ධුරය අත්හරිනු ලබන යම් සාමාජිකයකු, මෙම ප්‍රඥප්තිය යටතේ අන්‍ආකාරයකින් නුසුදුස්සෙකු නොවන්නේ නම්, නැවත පත් කිරීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

(9) රෝගාතුර වීමෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්යයන් ඉටු කිරීමට යම් සාමාජිකයෙකු තාවකාලිකව ආපොහොසත්වන විටකදී, එම කාල සීමාව තුලදී ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තෙකු පත්කරනු ලැබිය හැකිය.

(10) විශමාචාර හේතූන් මත උපදේශක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අමාත්‍යවරයාට බලය තිබිය යුතුය.

(11) උපදේශක මණ්ලයට නම් කරන ලද සාමාජිකයකු වසර තුනක කාලසීමාවක් සඳහා පත් කළ යුතු අතර, නැවත පත් කරනු ලැබීමටද සුදුසුකම් ලබන්නේය.

(12) උපදේශක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් සැලසිය හැකිය.

(13) උපදේශක මණ්ඩලයේ රැස්වීම් සඳහා සහභාගීවීම වෙනුවෙන්, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සුදුසු දීමනාවක් ගෙවිය හැකිය.

**8**. උපදේශක මණ්ඩලයේ කාර්යයන් විය යුත්තේ :- උපදේශක මණ්ඩලයේ කාර්යයන්

1) අධ්‍යාපන හා අධ්‍යාපනික පහසුකම් සපුරා ලීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන්ද, අමාත්‍යවරයා විසින් උපදෙස් සඳහා උපදේශක මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය හැකි කරුණු සම්බන්ධයෙන් සහ උපදෙස් දිය යුතුයයි මණ්ඩලයට හැඟී යන වෙනත් කරුණු සම්බන්ධයෙන් ද, අමාත්‍යවරයා වෙත උපදෙස් දීම;

2) අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් කළ විට, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිවලට සහ පරමාර්ථයන්ට අනුකූලව තුන් අවුරුදු අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ වෙත උපදෙස් දීම;

3) අධ්‍යාපන ගොඩනැගිලි, ක්‍රීඩා භූමි, විද්‍යාගාර, තාක්ෂණ ඒකක, නේවාසිකාගාර සහ ගුරු නිවාස ඉදිකිරීම සම්බන්ධයෙන් මග පෙන්වීමේ උපදෙස් ලබා දීම;

4) ඉගැන්වීම සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට අවශ්‍ය වන ගෘහ භාණ්ඩ සහ උපකරණ සැපයීම හා පුස්තකාල පහසුකම් ක්‍රීඩා සහ අනෙකුත් පහසුකම් සැලසීම;

5) අවශ්‍ය වුවහොත් උපදෙස් දීම;

6) නව පාසල් පිහිටුවීම හා සම්බන්ධ කරුණු සාකච්ඡාවට භාජනය කිරීම;

7) පාසල් සංවිධානය, ඒවායේ ශ්‍රේණීන් උසස් කිරීම, නම් කිරීම, නම් වෙනස් කිරීම සහ පාසල් වසා දැමීමේ කටයුතු;

8) නව පන්ති ආරම්භ කිරීම, වෘත්තීය සහ කාර්මික පාඨමාලා සඳහා මධ්‍යස්ථාන තීරණය කිරීම, නොවිධිමත් අධ්‍යාපන පිළිබඳ කටයුතු, විදේශ භාෂාවන් ඉගැන්වීම සහ ගුරුවරුන් සහ නිලධාරීන් නැවත පුහුණු කිරීම පිළිබඳ කටයුතු;

9) අවශ්‍යයයි හැඟුන විටදී වෙනස් කිරීම් ද සහිතව සැලසුම් ප්‍රතිශෝධනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ ලේකම් මගින් අනුමැතිය ලබා ගැනීම;

10) අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහි ලා ලබන ප්‍රගතිය කලින් කලට සමාලෝචනය කිරීම; සහ

11) අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවයන් සහ බාධක මග හරවා ගැනීම සඳහා ගතයුතු ක්‍රියා මාර්ගයන් පිළිබඳව අමාත්‍යවරයා වෙත යෝජනා ඉදිරිපත් කිරීම.

පොදු විධිවිධාන

**9**. (1) පහත සඳහන් ක්ෂේත්‍රයනට අදාළව ගන්නා ක්‍රියාමාර්ගයන්,රජය විසින් කලින් කල අනුමත කරනු ලබන ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය :-

i. අනිවාර්ය අධ්‍යාපනය සැලසීම;
ii. පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම;
iii. ළමයකුගේ ආගම තීරණය කිරීම සහ ආගම ඉගැන්වීම;
iv. පහසුකම් හා සේවා ගාස්තු අයකිරීම;
v. පාසල් සංවර්ධන සමිති පවත්වාගෙන යාම;
vi. පාසල් විෂය මාලාවන් පවත්වාගෙන යාම;
vii. ගුරුවරුන්ගේ මාරු කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම;

**10**. පාසල් ගොඩනැගිලි, පරිශ්‍රයන් සහ එහි වූ උපකරණ, අධ්‍යාපනික, ක්‍රීඩා, සංස්කෘතික හෝ ආගමික කාර්යයන් හැර, වෙනත් කටයුත්තක් සඳහා යොදා නොගත යුතුය.එහෙත් පාසල් පරිශ්‍රයක් හෝ එහි වූ උපකරණ කිසිවක් ජාතික වැදගත් කමකින් යුතු වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා අධ්‍යක්ෂගේ පූර්වානුමැතිය ලබා ගත යුතුය

පාසල් උපකරණ හා පරිශ්‍රයන් වෙනත් කටයුතු සඳහා යොදා නොගත යුතු බව

**11**. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවන දිනයට පෙරාතුවම වන දිනයෙහිදී අධ්‍යාපන විෂය ක්‍රියාත්මක කිරීම සඳහා රජයට හෝ සභාවට අයත් හෝ වෙනත් ප්‍රභවයකින් ලත් කිසියම් වත්කමක් හෝ දේපළක් එසේ එම විෂය ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා යොදවා තිබුණි නම්, ඒවා මෙම ප්‍රඥප්ති යටතේ දෙපාර්තමේන්තුවට පැවරී ඇති වත්කම් ලෙස සැලකිය යුතුය.

දෙපාර්තමේන්තු වත්කම්

**12**. (1). සමාලෝචිත වර්ෂය තුළදී දකුණු පළාතේ අධ්‍යාපනික කටයුතු පවත්වාගෙන ගිය ආකාරය, එහිලා පැන නැගී ගැටලු සහ එම ගැටලු මගහරවාලීමට ගත් ක්‍රියා මාර්ගයන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි දක්නට තිබෙන උපනතීන් ගැන සඳහන් වාර්ෂික පාලන වාර්තාවක් අධ්‍යක්ෂකවරයා විසින්, ඊට පසු වර්ෂයේ ජුනි මස 30 වැනි දිනට ප්‍රථම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

වාර්ෂික පාලන වාර්තාව

(2). ඉහත (1) වැනි උපඡේදයේ සඳහන් පාලන වාර්තාව අමාත්‍යවරයා විසින් සාධාරණ කාලයක් තුළදී පළාත් සභාවේ සභා ගත කළ යුතුය.

**13**. (1). මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද යම් රෙගුලාසියක් යටතේ තමා වෙත පැවරී ඇති පරිදි සිය අභිමතය පාවිච්චි කරමින් අධ්‍යක්ෂක විසින් කරන ලද යම් නියෝගයක් හෝ තීරණයක්, අභියාචනයක් හෝ වෙනත් සාධාරණ හේතූන් මත වෙනස් කිරීමේ හෝ පරිච්ඡින්න කිරීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

නියෝග හෝ තීරණයන් සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට අමාත්‍යවරයා සතු බලය

(2). එවැනි අවස්ථාවලදී (1) වැනි උප ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් දෙනු ලබන තීරණය නීත්‍යානුකූල සහ අවසන් තීරණයක් වන අතර, එය බලපාන සියලු දෙනාම ඉන් බැඳී සිටිය යුතුය.

**14.** (1) නීතිරීති සෑදීමට මෙම ප්‍රඥප්තිය මගින් බලය පැවරි ඇති හෝ නියම කර ඇති සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නීතිරීති සාදනු ලැබිය හැකිය:

රෙගුලාසි

**විශේෂයෙන්ම -**

(අ) සභාවේ විභාග පැවැත්වීම;

(ආ) පාසල් ගොඩනැගිලි හා පරිශ්‍රයන් ආරක්ෂා කිරීම;

(ඇ) නව පාසල් ආරම්භ කිරීම; සහ

(ඈ) ඇගයීම් ක්‍රම හඳුන්වාදීම.

(2) ඉහත (1) වැනි උප ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකළ යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ රෙගුලාසියේ නිශ්චිත සඳහන් යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය.

(3) ඉහත (1) වැනි උපඡේදය යටතේ සාදනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් දකුණු පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. සභාව විසින් අනුමත නොකරනු ලබන සෑම රෙගුලාසියක්ම ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, එසේ අනුමත නොකළ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) යම් රෙගුලාසියක් පරිච්ඡින්න කරනු ලැබුවා සේ සලකනු ලබන දිනය, ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

**15**. හදිසි අත්‍යාවශ්‍ය අවස්ථාවකදී පාසල් නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කිරීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

නිවාඩු දින ප්‍රකාශයට පත් කිරීම.

**16**. දෙපාර්තමේන්තුවේ සියලුම නිලධරයන් සහ සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යයන් සඳහා රාජ්‍ය සේවකයින් ලෙස සලකනු ලැබිය යුතුය.

නිලධරයන් සහ සේවකයින් රාජ්‍ය සේවකයින් වන බව

**17**. අල්ලස් පනතේ අර්ථානුකූලව දෙපාර්තමේන්තුව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

දෙපාර්තමේන්තුව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**18.** මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ වූ කිසියම් නියෝගයක් හෝ රෙගුලාසියක් උල්ලංඝනය කරනු ලබන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ මෙම ව්‍යවස්ථාව මගින් හෝ ඒ යටතේ යම් තැනැත්තෙකු හට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේහිලා ඒ තැනැත්තාට බාධාකරන ඕනෑම තැනැත්තෙකු මෙම ප්‍රඥප්තියේ යටතේ වරදකරුවකු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොයික්මවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවක සිර දඬුවමකට හෝ එකී දඩය සහ සිර දඬුවම යන දඬුවදෙකටම හෝ යටත් විය යුතුය. — වරදවල් හා දඬුවම්

**19**. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. — අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි - — අර්ථ නිරූපණය.

"පාසල් ප්‍රධානියා" යන්නෙන් විදුහල්පති හෝ ඔහු වෙනුවට වැඩ බලන වෙනත් කිසියම් තැනැත්තෙකු අදහස් වේ;

"පළාත" යන්නෙන් දකුණු පළාත අදහස් වේ;

"ලේකම්" යන්නෙන් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.

## උපලේඛනය

### පාසල් වර්ග කිරීම (6 වැනි වගන්තිය)

| | | |
|---|---|---|
| ප්‍රවර්ගය 1 ඒබී | - | අ.පො.ස(උසස් පෙළ) දක්වා කලා, වාණිජ සහ විද්‍යා විෂය මාලාවන් හි පංති පැවැත්වෙන පාසල් අයත් වේ. |
| ප්‍රවර්ගය 1 සී | - | අ.පො.ස. (උසස් පෙළ) දක්වා කලා හා වාණිජ විෂය මාලාවන්හි පංති පැවැත්වෙන පාසල් අයත් වේ. |
| ප්‍රවර්ගය 2 | - | 1 ශ්‍රේණියේ සිට 11 වැනි ශ්‍රේණිය දක්වා පංති පැවැත්වෙන පාසල් අයත් වේ. |
| ප්‍රවර්ගය 3 විට | - | 1 ශ්‍රේණියේ සිට 5 වැනි ශ්‍රේණිය දක්වා සහ ඇතැම් 1 ශ්‍රේණියේ සිට 10 වැනි ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසල් අයත් වේ. |

07 – 446